# ජාතික යොවුන් සේනාංකය

# වාර්ෂික වාර්තාව

# 2018

# අන්තර්ගතය


| | පිටු අංක |
| --- | --- |
| හැඳින්වීම | 01 |
| දැක්ම හා මෙහෙවර | 02 |
| යොවුන් සේනාංක සභාව හා කාර්ය මණ්ඩලය | 03 - 06 |
| ආයතනික සැකැස්ම | 07 - 09 |
| මානව සම්පත් සංවර්ධනය | 10 - 14 |
| පුහුණු මධ්‍යස්ථාන | 15 - 20 |
| මූලික පුහුණු පාඨමාලාව | 21 - 32 |
| වෘත්තීය පුහුණුවට යොමු කිරීම් | 33 - 36 |
| විශේෂ පුහුණු පාඨමාලා | 37 - 49 |
| පවත්වන ලද විවිධ වැඩසටහන් | 50 - 53 |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 54 - 70 |
| විගණකාධිපති වාර්තාව | 71 - 80 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිගේ නිර්දේශ | 81 - 101 |

# හැඳින්වීම

2002 අංක 21 දරණ යොවුන් සේනාංක පනත මඟින් 2002 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ජාතික යොවුන් සේනාංකය ආරම්භයේදී ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක විය. පසුව විටින් විට යොවුන් සේනාංකය අමාත්‍යාංශ කිහිපයක් යටතට පත් වූ අතර, 2018 වර්ෂයේදී යොවුන් සේනාංකය පහත සඳහන් අමාත්‍යංශ යටතේ ක්‍රියාත්මක විය.

| | |
|---|---|
| ❍ *ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය* | *ජනවාරි - මාර්තු* |
| ❍ *ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය* | *මාර්තු - ඔක්තෝම්බර්* |
| ❍ *බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය* | *නොවැම්බර් - දෙසැම්බර්* |
| ❍ *ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය* | *දෙසැම්බර්* |

ජාතික යොවුන් සේනාංකය යෞවනය සඳහා වන හමුදාමය නොවන සංවිධානයක් වන අතර, පාසල් හැරගිය හා උසස් අධ්‍යාපන අවස්ථාවන් අහිමි වූ ශ්‍රී ලාංකේය යෞවනයෞවනියන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කොට ඔවුන් විනය, නායකත්ව හා මනා පෞරුෂ ගුණාංගයන්ගෙන් පිරිපුන් පිරිසක් බවට පත් කිරීම තුළින් ජාතික සංවර්ධනයට ඉවහල් කර ගැනීම ජාතික යොවුන් සේනාංකයේ මූලික පරමාර්ථය වේ. මෙම පරමාර්ථය පෙරදැරිව ඊට සරිලන විෂය නිර්දේශයක් යටතේ දිවයින පුරා ව්‍යාප්ත පුහුණු මධ්‍යස්ථාන ජාලයක් මඟින් වසරකට අදියර 02 ක් යටතේ පාසල් හැරගිය වයස අවුරුදු 16 ත් 28 ත් අතර තරුණ තරුණියන්ට සය මාසික පූර්ණකාලීන පුහුණුවක් පන්ති කාමර තුළ මෙන්ම ඉන් බාහිර ලබා දීම යොවුන් සේනාංකය මඟින් සිදු කරනු ලබයි.



# දැක්ම හා මෙහෙවර

## දැක්ම

කුසලතාවයන්ගෙන් හෙබි යහපත් තරුණ පරපුරක් ජාතියට දායාද කිරීම හා ඔවුන්ව ජාතික සංවර්ධනය සඳහා ඉවහල් කර ගැනීම.



## මෙහෙවර

අභියෝගයන්හි නොසැලෙන, නිරෝගී පෞරුෂත්වයෙන් හෙබි ශ්‍රී ලාංකේය තරුණ පරපුරක් බිහි කිරීම.



# ජාතික යොවුන් සේනාංක සභාව හා කාර්ය මණ්ඩලය

## යොවුන් සේනාංක සභාව

යොවුන් සේනාංකය සඳහා වන සැලසුම් හා වැඩපිළිවෙල සකස් කිරීම, එසේ සකස් කරන ලද වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමනය කිරීම, පුහුණුලාභීන්ගේ පුහුණුව අධීක්ෂණය කිරීම, අධ්‍යක්ෂවරයා විමසා පුහුණුලාභීන්ගේ පුහුණුවට සහ කාර්යක්ෂමතාවට අදාළ කොන්දේසි හා පුහුණුලාභීන් විසින් අත්කර ගැනීමට නියමිත නිපුණතාවේ ප්‍රමාණය නිශ්චිත දැක්වීම ආදී කාර්යයන් සිදු කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් යොවුන් සංවර්ධනය, සේවා නියුක්තිය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රවල දැනුම හා පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින් සභාපති ඇතුළු සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත යොවුන් සේනාංක සභාවක් පත් කරනු ලැබ ඇත. එමෙන්ම මෙම සභාව සඳහා මහාභාණ්ඩාගාරයේ නියෝජිතයකු ද ඇතුළත් වේ.

2018 වර්ෂයේ පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුතු යොවුන් සේනාංක සභාව 2018 ඔක්තෝම්බර් මාසය දක්වා ක්‍රියාත්මක වූ අතර, 2018 ඔක්තෝම්බර් මාසයේ නව රජය පත්වීමෙන් පසුව මෙම සභාව අහෝසි විය. නව රජය යටතේ යොවුන් සේනාංකය සඳහා සභාවක් පත් නොවුණි. එමෙන්ම යොවුන් සේනාංක සභාවේ සභාපතිත්වය දැරූ මේජර් ජනරාල් වජිර ආර්. විජයරත්න මහතා 2018 අප්‍රේල් මාසයේ සිය තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් අනතුරුව 2018.07.13 සිට සභාවේ සභාපති තනතුරට මේජර් ජනරාල් එච්.සී.පී. ගුණතිලක පත්විය.

| | |
|---|---|
| මේජර් ජනරාල් වජිර ආර්. විජයරත්න | - සභාපති 2018.04.10 දක්වා |
| මේජර් ජනරාල් එච්.සී.පී. ගුණතිලක | - සභාපති 2018.07.13 සිට |
| සරසාලි ෆොන්සේකා මහත්මිය | - සාමාජික |
| වෛද්‍ය ඒ.ඒ.ඒ.එස්. විජේගුණවර්ධන මහතා | - සාමාජික |
| පී.ජී.ඩී.එම්.පී. ගුණසේකර මෙනවිය | - සාමාජික |
| අජිතා බටගොඩ මහත්මිය | - භාණ්ඩාරගාර නියෝජිත |

## යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය

ජාතික යොවුන් සේනාංකය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති අතර, එය ස්ථිර කාර්ය මණ්ඩලයකින් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

අධ්‍යක්ෂවරයා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටීන් ප්‍රකාරව සිදු කරනු ලබයි.

මෙහි ඇතුළත් කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා හුදෙක්ම බඳවා ගනු ලබන්නේ ත්‍රිවිධ හමුදාවේ සේවය කර නීත්‍යනුකූලව ඉවත් වූ හෝ විශ්‍රාම ලබා ගත් අයවළුන් වේ.

**2018 වර්ෂය වන විට ජාතික යොවුන් සේනාංකය සඳහා අනුමත කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.**

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික |
| **ස්ථිර** | | | | |
| අධ්‍යක්ෂ | HM 1-3 | 1 | | |
| අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) | HM 1-1 | 1 | | |
| අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) | HM 1-1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ ( පාලන) | MM 1-1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | MM 1-1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ ( පුහුණු) | MM 1-1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | MM 1-1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ ( මෙහෙයුම්) | MM 1-1 | 1 | | |
| සභා ලේකම්/නීති නිලධාරි | MM 1-1 | 1 | | |
| අභ්‍යන්තර විගණන නිලධාරි | JM 1-1 | 1 | | |
| පරිපාලන නිලධාරි | JM 1-1 | 1 | | |
| ගබඩා නිලධාරි | JM 1-1 | 1 | | |
| කාර්මික නිලධාරි | JM 1-1 | 1 | | |
| පරිපාලන නිලධාරි (මානව සම්පත්) | JM 1-1 | 1 | | |
| ප්‍රසම්පාදන නිලධාරි | JM 1-1 | 1 | | |
| ප්‍රවාහන නිලධාරි | JM 1-1 | 1 | | |
| සංවර්ධන සහකාර | MA 3 | 160 | | |
| සෞන්දර්ය උපදේශක | MA 1-1 | 20 | | |
| කළමනාකරණ සහකාර | MA 1-1 | 90 | | |
| දෙමළ භාෂා පරිවර්ථක | MA 1-1 | 6 | | |
| උපදේශක ( දෙමළ) | MA 1-1 | 57 | | |
| උපදේශක ( තොරතුරු තාක්ෂණ) | MA 1-1 | 59 | | |
| උපදේශක ( ඉංග්‍රීසි ) | MA 1-1 | 58 | | |
| සරඹ/විනය උපදේශක | MA 1-1 | 100 | | |
| රියදුරු | PL 3 | 7 | | |
| පණිවිඩකරු | PL 3 | 1 | | |
| විදුලි කාර්මික | PL 3 | 1 | | |
| කාර්යාල සහායක | PL 1 | 33 | | |
| ගබඩාකරු | PL 1 | 39 | | |

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික |
| **කොන්ත්‍රාත්** | | | | |
| සහකාර අධ්‍යක්ෂ (පළාත්) | MM 1-1 | | 9 | |
| මධ්‍යස්ථානාධිපති | JM 1-1 | | 58 | |
| සහාය මධ්‍යස්ථානාධිපති | JM 1-1 | | 59 | |
| උපදේශක (සරඹ) | MA 1-1 | | 171 | |
| ජාතික යොවුන් සමායෝජක | MA 1-1 | | 33 | |
| පේස්ට්‍රි හා බේකරි උපදේශක | | | 1 | |
| ජාත්‍යන්තර සුපවේදී උපදේශක | | | 1 | |
| ගෘහ පාලන උපදේශක | | | 1 | |
| ආහාර පාන පිළිගැන්වීමේ උපදේශක | | | 1 | |
| උපදේශක - Customer Care | | | 1 | |
| උපදේශක - Back Office | | | 1 | |
| උපදේශක - Finance | | | 1 | |
| උපදේශක - BPO Basic | | | 1 | |
| **තාවකාලික** | | | | |
| අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) | HM 1-1 | | | 1 |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | MM 1-1 | | | 1 |
| සැලසුම්/සම්බන්ධීකරණ නිලධාරි | JM 1-1 | | | 1 |
| කළමනාකරණ සහකාර | MA 1-1 | | | 1 |
| රියදුරු | PL 3 | | | 1 |
| කාර්යාල සහායක | PL 1 | | | 1 |
| **Total** | | **647** | **338** | **6** |
| | | | 991 | |

# ජාතික යොවුන් සේනාංක සංවිධාන සටහන






| | |
|---|---|
| Add. Dir (Admin & Fin ) | Additional Director ( Administration & Finance) |
| Add. Dir (Trg & Dev ) | Additional Director ( Training & Development) |
| Add. Dir (Plan. ) | Additional Director ( Planning) |
| Asst. Dir (Admin) | Assistant Director (Administration) |
| Asst. Dir (Fin) | Assistant Director (Finance) |
| Asst. Dir (Trg) | Assistant Director (Training) |
| Asst. Dir (Dev) | Assistant Director (Development) |
| Asst. Dir (Op) | Assistant Director (Operation) |

| | |
|---|---|
| Asst. Dir (Plan.) | Assistant Director (Planning) |
| Co. Se/Leg.Off. | Council Secretary/Legal Officer |
| Asst. Dir (Pro.) | Assistant Director (Province) |
| AO | Administrative Officer |
| TO | Technical Officer |
| AO HR | Administrative Officer (HR) |
| Tra. Off | Transport Officer |
| Pro. Off | Procurement Officer |

| | |
|---|---|
| OIC | Officer in Charge |
| Asst. OIC | Assistant Officer In Charge |
| P./C. Off. | Planning/Coordinating Officer |
| DA | Development Assistant |
| MA | Management Assistant |
| TT | Tamil Translator |
| IT | Information Technology Instructor |
| EI | Esthetic Instructor |

| | |
|---|---|
| TI | Tamil Instructor |
| DI | Drill Instructor |
| DDI | Drill/Disciplinary Instructor |
| NYC | National Youth Coordinator |
| DR | Driver |
| EL | Electrician |
| OA | Office Aide |
| SM | Store man |

# ආයතනික සැකැස්ම

යොවුන් සේනාංකය මූලස්ථාන කාර්යාලයක්, පළාත් කාර්යාල 09 ක්, පුහුණු මධ්‍යස්ථාන 50 ක්, බැහැරගත පුහුණු මධ්‍යස්ථානයක්, හෝටල් පුහුණු පාසලක් හා IBPO පුහුණු මධ්‍යස්ථානයකින් සමන්විත වේ. යොවුන් සේනාංක මූලස්ථානය අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂවරු 02ක් සහකාර අධ්‍යක්ෂවරු 05ක් හා සභාලේකම්/නීති නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයකින් යුක්ත වේ. මීට අමතරව 2016 වර්ෂයේදී තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස තනතුරු 02 ක් ජාතික යොවුන් සේනාංක මූලස්ථානය සඳහා අනුමතව ඇත. අනුව යොවුන් සේනාංක මූලස්ථානයේ ක්‍රියාත්මක අංශ පහත පරිදිය

*අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) යටතේ පහත අංශ ක්‍රියාත්මක වේ.*

## පාලන අංශය - සහකාර අධ්‍යක්ෂ (පාලන)

සහකාර අධ්‍යක්ෂ (පාලන) යටතේ මානව සම්පත් ඒකකයක්, ප්‍රසම්පාදන ඒකකයක්, ප්‍රවාහන ඒකකයක් හා ඉදිකිරීම් සහ නඩත්තු ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා පරිපාලන නිලධාරී, කාර්මික නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ සහකාර ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබා දීම සිදු කරයි. කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම, බඳවා ගැනීම, ස්ථාන මාරු සිදු කිරීම ඇතුළු මානව සම්පත් සංවර්ධන කටයුතු, මූලස්ථානයේ හා පුහුණු මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු පුහුණු පාඨමාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

## මූල්‍ය අංශය - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය )

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) යටතේ ගිණුම් ඒකකයක්, මූල්‍ය ඒකකයක් හා ගබඩා ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා ගබඩා නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබා දීම සිදු කරයි. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළු සියළු ගෙවීම් කටයුතු, ගිණුම් කටයුතු වලට අදාළ සියළු ලේඛන නඩත්තුව හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම, පුහුණු මධ්‍යස්ථාන වෙත අවශ්‍ය බඩුභාහිරදිය බෙදාහැරීම ඇතුළු සියළු ගබඩා කටයුතු පවත්වාගෙන යාම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.



*අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) යටතේ පහත අංශ ක්‍රියාත්මක වේ.*

## පුහුණු අංශය - සහකාර අධ්‍යක්ෂ (පුහුණු)

සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යටතේ පුහුණු අංශය හා වෘත්තීය පුහුණු සහ NVQ ඒකක ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබා දීම සිදු කරයි. පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන මූලික පුහුණු පාඨමාලාවේ සියලු කටයුතු, පුහුණුලාභීන් වෘත්තීය පුහුණුවට යොමු කිරීම් හා පුහුණුලාභීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබා දීමේ කටයුතු මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

## සංවර්ධන අංශය - සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)

සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) යටතේ සංවර්ධන අංශය හා මාධ්‍ය ඒකකය ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරි ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබා දීම සිදු කරයි. පුහුණු මධ්‍යස්ථානයන්ට පුහුණුලාභීන් බඳවා ගැනීම, පුහුණු කාලය තුළ පවත්වන කලා උළෙල, ක්‍රීඩා උළෙල, දැනුම මිනුම තරඟ ප්‍රජා සත්කාරක වැඩසටහන් ආදී විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, පුහුණුලාභීන්ගේ විසිරයාම් පෙළපාලි කටයුතු, සහතිකපත් නිකුත් කිරීම් කටයුතු හා යොවුන් සේනාංකයේ සියළු මාධ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

## මෙහෙයුම් අංශය - සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)

සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) යටතේ තොරතුරු තාක්ෂණ ඒකකය ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරි ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබා දීම සිදු කරයි. මූලස්ථානය හා සියළුම මධ්‍යස්ථාන ජාල ගත කර ජාලයක් ලෙස පවත්වා ගෙන යාම, යොවුන් සේනාංක වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම, මූලස්ථානයේ හා මධ්‍යස්ථානයන්හි තොරතුරු තාක්ෂණ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

## අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

2016 වර්ෂයේදී ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතියේ රාජකාරි කටයුතු සඳහා තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස තනතුරු 02 ක් 2016 සැප්තැම්බර් මාසයේදී අනුමත කර ගනු ලැබූ අතර ඒ සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි 2016 නොවැම්බර් මාසයේදී අනුමත කර ගන්නා ලදී. 2017 වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියකු ද්විතීයන පදනම මත බඳවා ගන්නා ලද අතර නව මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු ඔහුගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී.

යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ පහත අංශ ක්‍රියාත්මක වේ.

යොවුන් සේනාංක සභාවේ කටයුතු පවත්වාගෙන යාම

සභාලේකම්/නීති නිලධාරී - යොවුන් සේනාංක සභාව රැස්කිරීම, ඒ ඒ අංශ වෙතින් ඉදිරිපත් කරන සභා පත්‍රිකා සභාව වෙත ඉදිරිපත් කිරීම, සභාව විසින් අනුමත කරනු ලැබූ සභා පත්‍රිකා ගනු ලැබූ තීරණ අදාළ අංශ හා නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම, සභාවේ සටහන් ලබා ගැනීම ඇතුළු සිය සභා සාමාජිකයින් සම්බන්ධීකරණ කටයුතු හා යොවුන් සේනාංකය වෙනුවෙන් වන සියළුම නීතිමය හා අධිකරණමය කටයුතු සහ එම කටයුතු වලදී යොවුන් සේනාංකය වෙනුවෙන් පෙනී සිටීම ආදිය සිය කාර්ය මණ්ඩලයේ සේවා දායකත්වය සමඟින් අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි.

## අභ්‍යන්තර විගණන අංශය

යොවුන් සේනාංක අධ්‍යක්ෂගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වන අතර මෙමඟින් යොවුන් සේනාංක මූලස්ථානයේ හා සියළුම පුහුණු මධ්‍යස්ථානයන්හි විගණන කටයුතු සිදු කර විගණන විමසුම් ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

## ජාතික යොවුන් සේනාංක තූර්ය වාදක කණ්ඩායම

සියළුම නවීන තූර්ය වාදක භාණ්ඩයන්ගෙන් සමන්විත බටහිර තූර්ය වාදක කණ්ඩායමක් ජාතික යොවුන් සේනාංකය සතුවන අතර ත්‍රිවිධ හමුදාවේ තූර්ය වාදක කණ්ඩායම්හි සාමාජිකත්වය දරා විශ්‍රාම යාමෙන් අනතුරු යොවුන් සේනාංකයේ සරඹ උපදේශක තනතුරු සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් මෙහි වාදකයින් ලෙසට කටයුතු කරනු ලබයි.

යොවුන් සේනාංක පුහුණුලාභීන්ගේ විසිරයාමේ පෙළපාලි ඇතුළු උත්සව සඳහා මෙම තූර්ය වාදක කණ්ඩායම යොදා ගන්නා අතර ජාතික නිදහස් දින පෙළපාලියට ද යොවුන් සේනාංක පුහුණුලාභීන් සමඟ මෙම තූර්යවාදක කණ්ඩායම සහභාගි වේ.



# මානව සම්පත් සංවර්ධනය

ජාතික යොවුන් සේනාංකයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ දැනුම් හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා විවිධ වූ  පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා  පුහුණු ප්‍රතිපත්තියක් සකසා ඇති අතර එම ප්‍රතිපත්ත්තිය පරිදි  කාර්ය මණ්ඩලයේ ඒ ඒ තනතුරු අනුව තම තනතුරේ කාර්ය භාරයට අදාළ පුහුණු පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත. මෙහිදී අදාළ පාඨමාලා ගාස්තු රු.10,000.00 සිට රු.75,000.00 දක්වා යොවුන් සේනාංකය මඟින් දරනු ලබයි.

මීට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැනි කාර්ය මණ්ඩල  පුහුණු කරනු ලබන ආයතන විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහාද යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය යොමු කර ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට හා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි.

තවද ලැබෙන ශිෂ්‍යත්ව වැනි අවස්ථා අනුව තෝරාගනු ලැබූ යොවුන් සේනාංක කාර්ය මණ්ඩල සාමාජිකයින් විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදිය සඳහාද යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

එමෙන්ම ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීන සම්පත්දායකයින් සහභාගි කරගෙන යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළු යොවුන් සේනාංක මූලස්ථානයේදී මෙන්ම පුහුණු මධ්‍යස්ථානයන්හි දී ක්‍රියාත්මක කරනු ලබයි. මේ අනුව මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා යොවුන් සේනාංකය වැඩි අවධානයක් යොමු කර ඇත.

### *2018 වර්ෂයේදී සිදු කරනු ලැබූ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන්*

### *සාරාංශය*

| අනු අංකය | පුහුණුව ලබා දුන් ආකාරය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කාර්ය මණ්ඩලයේ එක් එක් නිළධාරීන් විසින් කරන ලද ඉල්ලීම් අනුව පාඨමාලා සඳහා යොමු කිරීම | 5 | 5 |
| 2 | කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ විවිධ පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම | 11 | 403 |
| 3 | විදේශ පාඨමාලා, පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි කරවීම | 1 | 7 |

| අනු අංකය | නම | තනතුර | සේවා ස්ථානය | ඉල්ලුම්කල පාඨමාලාව | ආයතනය | ගෙවන ලද මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | ඩබ්.ඒ.එම් විජේසිංහ මහතා | අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) | මුලස්ථානය | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | කැලණිය විශ්ව විද්‍යාලය | 75,000.00 |
| 2 | ඒ.කේ.එන් සංජීවනී මහත්මිය | සංවර්ධන සහකාර | දික්වැල්ල | ඉංග්‍රීසි මූලික ඩිප්ලෝමා පාඨමාලාව | රුහුණ විශ්ව විද්‍යාලය | 20,000.00 |
| 3 | කේ.එච්.කේ. අල්විස් මහත්මිය | කළමනාකරණ සහකාර | මුලස්ථානය | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය | කැලණිය විශ්ව විද්‍යාලය | 25,000.00 |
| 4 | කේ.ඒ.ජේ.එච්. අබේසුන්දර මහතා | තොරතුරු තාක්ෂණ උපදේශක | මුලස්ථානය | MCSA | වෘත්තීය තාක්ෂණ මධ්‍යස්ථානය | |
| 5 | ජී.ආර්.ඩී.ඒ.කේ ගොඩගම මහත්මිය | සංවර්ධන සහකාර | මුලස්ථානය | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | කොළඹ විශ්ව විද්‍යාලය | 75,000.00 |

## 2018 වර්ෂයේදී කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ විවිධ පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහන | දිනය | සහභාගීත්වය | ප්‍රමාණය | පැවැත්වූ ස්ථානය | සම්පත් දායකත්වය |
|---|---|---|---|---|---|---|
| 1 | නව උත්පාදනය නිර්මාණශීලීත්වය ව්‍යවසායකත්වය (ICE) | 2018.02.19 | වෘත්තීය මාර්ගෝපදේශන හා පෞරුෂ සංවර්ධන උපදේශකයින් | 40 | රොක්හවිස් මෝදර | නිර්මාණ නවෝත්පාදන ආයතනය |
| 2 | වෘත්තීය මාර්ගෝපදේශන හා පෞරුෂ සංවර්ධන උපදේශකයින් පුහුණු වැඩමුළුව | 2018.03.26 සිට 2018.04.06 | වෘත්තීය මාර්ගෝපදේශන හා පෞරුෂ සංවර්ධන උපදේශකයින් | 170 | අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථානය | මූලස්ථානය |
| 3 | වෘත්තීය මාර්ගෝපදේශකයින් සඳහා HIV AIDS නිවාරණ පුහුණු වැඩසටහන | 2018.05.09 සිට 2018.05.15 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 38 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | ලිංගාශ්‍රිත රෝග ඒඩ්ස් මර්ධන වැඩසටහන |
| 4 | තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන | 2018.05.14 සිට 2018.05.15 | ගබඩා භාරකරුවන්, කාර්යාල කාර්ය සහායකවරුන් සහ සරඹ/විනය උපදේශකවරුන් | | අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථානය | මූලස්ථාන සහකාර අධ්‍යක්ෂ මෙහෙයුම් |
| 5 | තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන | 2018.05.02 සිට 2015.05.03 | විනය සරඹ උපදේශක | 40 | අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථානය | මූලස්ථානයේ සහකාර අධ්‍යක්ෂ මෙහෙයුම් |
| 6 | ඉංග්‍රීසි උපදේශකයින් සඳහා NVQ දත්ත ඇතුළත් කිරීමේ වැඩසටහන | 2018.05.14 සිට 2018.05.25 | ඉංග්‍රීසි උපදේශකයින් | 6 | මූලස්ථානය | එම් කමනි මෙනවිය |

| අනු අංකය | පුහුණු වැඩසටහන | දිනය | සහභාගීත්වය | ප්‍රමාණය | පැවැත්වූ ස්ථානය | සම්පත් දායකත්වය |
|---|---|---|---|---|---|---|
| 7 | HIV AIDS නිවාරණ පුහුණු වැඩසහටන | 2018.05.30 සිට 2018.05.31 | වෘත්තීය මාර්ගෝපදේශන හා පෞරුෂ සංවර්ධන උපදේශකයින් හා දෙමළ උපදේශකයින් | 34 | නාවුල බැහැරගත පුහුණු මධ්‍යස්ථානය | Country Representatives For Sri Lanka |
| 8 | මනෝ විද්‍යා උපදේශනය | 2018.05.23 | වෘත්තීය මාර්ගෝපදේශන හා පෞරුෂ සංවර්ධන උපදේශකයින් හා දෙමළ උපදේශකයින් | 42 | කොළඹ ව්‍යාපාර හා කළමනාකරණ පාසල | කොළඹ ව්‍යාපාර හා කළමනාකරණ පාසල |
| 9 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 2018.09.13 | කළමනාකරණ සහකාර, සංවර්ධන සහකාර, ඉංග්‍රීසි උපදේශක සහ සරඹ/විනය උපදේශක | 4 | අත්තනගල්ල ප්‍රාදේශීය ශ්‍රවණාගාරය | රාජ්‍ය ඒකාබද්ධතා සංහිදියා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |
| 10 | ප්‍රසම්පාදන කාර්ය සාධනය සැලසුම් කිරීම හා ඇගයීම සහ ලංසු ඇගයීම හා පොදු ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව | 2018.10.18 | කළමනාකරණ සහකාර සහ සරඹ/විනය උපදේශක | 6 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 11 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන | 2018.12.18 සිට 2018.12.21 | ගබඩාකරුවන් සහ කාර්යාල කාර්ය සහායකවරුන් | 23 | කොළඹ ව්‍යාපාර හා කළමනාකරණ පාසල | කොළඹ ව්‍යාපාර හා කළමනාකරණ පාසල |

## විදේශ පාඨමාලා පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි කරවීම්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | විදේශ ගත වූ රට | විදේශ ගතවීමට හේතුව | විදේශ ගතවූ කාලය |
|---|---|---|---|---|---|
| 1 | ආර්.එච්. පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 2 | පී.කේ. පින්නදූව මහත්මිය | සංවර්ධන සහකාර | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 3 | එස්.එම්.එන්. පෙරේරා | කළමනාකරණ සහකාර | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 4 | ඊ.ඒ.අයි.ඩබ්. එදිරිසිංහ | සංවර්ධන සහකාර | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 5 | එච්.කේ.එම්. ප්‍රබෝධිනි | කළමනාකරණ සහකාර | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 6 | කේ.ඒ.ආර්.පී. කළුආරච්චි | තොරතුරු තාක්ෂණ උපදේශක | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |
| 7 | කේ.එල්.ඩී.එස්. සෝමරත්න මහතා | කාර්යාල සහයක | බහරේන් | 2018 වර්ෂය සඳහා වූ පළමු ගෝලීය තරුණ උළෙල | දින 10 |

# පුහුණු මධ්‍යස්ථාන

## පුහුණු මධ්‍යස්ථානයක පවත්නා පහසුකම්

භූමියේ පවත්නා ඉඩ පහසුකම් අනුව එක් අදියරකට පුහුණුලාභීන් 150ත් 250 ත් අතර, ප්‍රමාණයකට පුහුණුව ලබාදිය හැකි වන පරිදි පුහුණු මධ්‍යස්ථාන ගොඩනගා ඇති අතර, බොහෝ පුහුණු මධ්‍යස්ථානයන්හි පහත සඳහන් පහසුකම් පවතී.

- කාර්යාලයක්
- පුහුණුලාභීන් 40- 50 ට පුහුණුව ලැබිය හැකි පංති කාමර 4 හෝ 5
- දේශන ශාලාවක්
- පරිගණක 25 කින් සමන්විත පරිගණක විද්‍යාගාරයක්
- භෝජනාගාරයක්
- මුළුතැන්ගෙයක්
- දුර බැහැර පුහුණුලාභීන් සඳහා නේවාසික පහසුකම්
- ඇඳුම් මාරු කිරීමේ  කාමර
- කාන්තා හා පිරිමි වැසිකිළි පද්ධතියක්
- ක්‍රීඩා පිටියක්
- අන්තර්ජාල හා දුරකථන පහසුකම්

*පුහුණු මධ්‍යස්ථානයකට පහත සඳහන් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත*

| | |
|---|---|
| මධ්‍යස්ථානාධිපති | - 01 |
| සහාය මධ්‍යස්ථානාධිපති | - 01 |
| සංවර්ධන සහකාර (වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක) | - 02 |
| සංවර්ධන සහකාර (පෞරුෂ සංවර්ධන උපදේශක) | - 01 |
| සංවර්ධන සහකාර (සෞන්දර්ය උපදේශක) | - 01 |
| උපදේශක (තොරතුරු තාක්ෂණ) | - 01 |
| උපදේශක (ඉංග්‍රීසි) | - 01 |
| උපදේශක (දෙමළ) | - 01 |
| උපදේශක (සරඹ) | - 03 |
| කළමනාකරණ සහකාර | - 01 |
| සරඹ/විනය උපදේශක | - 02 |
| ගබඩාකරු | - 01 |

# පුහුණු මධ්‍යස්ථාන ජාලය

| අනු අංකය | මධ්‍යස්ථානය හා ලිපිනය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 1 | කටුනායක - ධම්මාලෝක මාවත වලානගොඩ, කටුනායක | බස්නාහිර | ගම්පහ | කටාන |
| 2 | අත්තනගල්ල - වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව | බස්නාහිර | ගම්පහ | අත්තනගල්ල |
| 3 | යක්කල - වැරැල්ලවත්ත, යක්කල, ගම්පහ | බස්නාහිර | ගම්පහ | ගම්පහ |
| 4 | දිවුලපිටිය - වල්පිට, දිවුලපිටිය | බස්නාහිර | ගම්පහ | දිවුලපිටිය |
| 5 | බුලත්සිංහල - බුලත්සිහල | බස්නාහිර | කළුතර | බුලත්සිංහල |
| 6 | ගම්පොල - නාවලපිටිය පාර කුඩාමකේ, ගම්පොල | මධ්‍යම | මහනුවර | උඩ පළාත |
| 7 | යටිනුවර - පිලපිටිය, මුරුතලාව | මධ්‍යම | මහනුවර | යටිනුවර |
| 8 | සෙංකඩගල - සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර | මධ්‍යම | මහනුවර | කඩවත්සතර සහ ගඟවට කෝරලය |
| 9 | නාවුල - අරංගල, නාවුල | මධ්‍යම | මාතලේ | නාවුල |
| 10 | නුවරඑළිය - මීපිලිමාන, අඹේවෙල, නුවරඑළිය | මධ්‍යම | නුවර එළිය | වැලිමඩ |
| 11 | හඟුරන්කෙත - රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත. | මධ්‍යම | නුවරඑළිය | හඟුරන්කෙත |
| 12 | වලපනේ - හරස්බැද්ද, වලපනේ | මධ්‍යම | නුවරඑළිය | වලපනේ |
| 13 | ගාල්ල -වැකුණුගොඩ, බෝපේ, ගාල්ල | දකුණ | ගාල්ල | කඩවත්තර |

| අනු අංකය | මධ්‍යස්ථානය හා ලිපිනය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 14 | නෙළුව - පියසේන ගමගේ ගොඩනැගිලි පරිශ්‍රය, ඇඹලේගෙදර, නෙළුව | දකුණ | ගාල්ල | නෙළුව |
| 15 | අක්මීමන - චීනමිත්‍ර ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන | දකුණ | ගාල්ල | අක්මීමණ |
| 16 | අකුරැස්ස - දියවර ගම්මාන පාර, මාරඹේ, අකුරැස්ස | දකුණ | මාතර | අකුරැස්ස |
| 17 | දික්වැල්ල - ඌරුගමුව, දික්වැල්ල | දකුණ | මාතර | දික්වැල්ල |
| 18 | වීරකැටිය - නයිගල, හකුරුවෙල, වීරකැටිය | දකුණ | හම්බන්තොට | වීරකැටිය |
| 19 | සූරියවැව - පාසල් මාවත, සූරියවැව | දකුණ | හම්බන්තොට | සූරියවැව |
| 20 | කන්තලේ - සීනිපුර, කන්තලේ | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කන්තලේ |
| 21 | කින්නියා - තාරවිල්ලු, කින්නියා | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කින්නියා |
| 22 | කුච්චවේලි - සලප්පාරු, කුච්චවේලි | නැගෙනහිර | ත්‍රිකුණාමලය | කුච්චවේලි |
| 23 | ත්‍රිකුණාමලය - වටරවුම් පාර, සර්ධාපුර, ත්‍රිකුණාමලය. | නැගෙනහිර | ත්‍රිකුණාමලය | නගර හා කඩවත් |
| 24 | මුත්තූර් - ත්‍රීසීඩී හංදිය, මඩකලපුව පාර, මුත්තූර් | නැගෙනහිර | ත්‍රිකුණාමලය | මුත්තූර් |
| 25 | ගෝමරන්කඩවල- විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල | නැගෙනහිර | ත්‍රිකුණාමලය | ගෝමරන්කඩවල |
| 26 | සේරුවිල - සේරුනුවර, සේරුවිල. | නැගෙනහිර | ත්‍රිකුණාමලය | සේරුවිල |

| අනු අංකය | මධ්‍යස්ථානය හා ලිපිනය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 27 | අම්පාර - කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල, උහන පාර, අම්පාර | නැගෙනහිර | අම්පාර | අම්පාර |
| 28 | දෙහිඅත්තකණ්ඩිය- ළිහිණියාගම, දමනේවෙල | නැගෙනහිර | අම්පාර | දෙහිඅත්තකණ්ඩිය |
| 29 | අඩ්ඩාලච්චේන - ලුවිස් වීදිය, මහ වීදිය, අඩ්ඩාලච්චේන | නැගෙනහිර | අම්පාර | අඩ්ඩාලච්චේන |
| 30 | කුලියාපිටිය - දෙගම්මැද, වැවගම, කුලියාපිටිය | වයඹ | කුරුණෑගල | කුලියාපිටිය බටහිර |
| 31 | වාරියපොල - උසාවිය පාර, වාරියපොල | වයඹ | කුරුණෑගල | වාරියපොල |
| 32 | මාවතගම - ඩෙනවෝර් වත්ත, මාවතගම | වයඹ | කුරුණෑගල | මාවතගම |
| 33 | පඩුවස්නුවර - නුගවෙල හන්දිය, තුත්තිරිපිටිය, පඩුවස්නුවර | වයඹ | කුරුණෑගල | පඩුවස්නුවර බටහිර |
| 34 | දොඩන්ගස්ලන්ද - අලකොලමඩ, දොඩන්ගස්ලන්ද | වයඹ | කුරුණෑගල | රිදීගම |
| 35 | නාත්තන්ඩිය - සාගරගම, නාත්තන්ඩිය | වයඹ | පුත්තලම | මහවැව |
| 36 | කැකිරාව - මහවැලි සංකීර්ණය, කැකිරාව | උතුරු මැද | අනුරාධපුරය | කැකිරාව |
| 37 | කලාවැව- ගල්නෑව, බුල්නෑව, කලාවැව | උතුරු මැද | අනුරාධපුරය | කලාවැව |
| 38 | අනුරාධපුරය - පාලඩිකුලම්, අනුරාධපුරය | උතුරු මැද | අනුරාධපුරය | නැගෙනහිර නුවරගම් පළාත |
| 39 | බණ්ඩාරවෙල - බිඳුණුවැව, බණ්ඩාරවෙල | ඌව | බදුල්ල | බණ්ඩාරවෙල |

| අනු අංකය | මධ්‍යස්ථානය හා ලිපිනය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය |
|---|---|---|---|---|
| 40 | මහියංගණය - මාපාකඩවැව, මහියංගණය | ඌව | බදුල්ල | මහියංගණය |
| 41 | කතරගම -පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, කඳසුරිඳුගම, කතරගම | ඌව | මොණරාගල | කතරගම |
| 42 | තණමල්විල- 3 කණුව, සූරියආර, බෝදාගම, තණමල්විල | ඌව | මොණරාගල | තණමල්විල |
| 43 | මොණරාගල - කිරිමණ්ඩල මාවත, මොණරාගල | ඌව | මොණරාගල | මොණරාගල |
| 44 | නිවිතිගල - අම්බලන්දෙනිය, වටාපත පාර, නිවිතිගල | සබරගමුව | රත්නපුරය | නිවිතිගල |
| 45 | ඇඹිලිපිටිය - ගම්උදා භූමිය, යෝධගම, ඇඹිලිපිටිය | සබරගමුව | රත්නපුරය | ඇඹිලිපිටිය |
| 46 | ගලිගමුව - ආසියාදෙනිය, ගලිගමුව | සබරගමුව | කෑගල්ල | ගලිගමුව |
| 47 | කෑගල්ල - සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මාවත, ගංගොඩවත්ත, කෑගල්ල | සබරගමුව | කෑගල්ල | කෑගල්ල |
| 48 | මුලතිව් - වඩ්ඩුවාකල්, මුලතිව් | උතුර | මුලතිව් | මුහුදුබඩ පත්තු |
| 49 | මන්නාරම - තලෛයි මන්නාරමපාර, මන්නාරම | උතුර | මන්නාරම | මන්නාරම |
| 50 | වව්නියාව- ඉරට්ටෙපෙරියකුලම, වව්නියාව (*පුහුණු කටයුතු ආරම්භ කරනු ලැබුයේ 2019 ජනවාරි සිටය*) | උතුර | වව්නියාව | වවුනියාව දකුණ |

# පුහුණු මධ්‍යස්ථාන පිහිටීම



# මූලික පුහුණු පාඨමාලාව

පාසල් හැරගිය හා උසස් අධ්‍යාපන අවස්ථාවන් අහිමි වූ ශ්‍රී ලාංකේය යෞවන යෞවනියන් විනය, නායකත්ව හා පෞරුෂ ගුණාංගයන්ගෙන් පිරිපුන් දැනුම, ආකල්ප හා කුසලතාවයන්ගෙන් හෙබි පිරිසක් බවට පත්කිරීමේ අරමුණින් යොවුන් සේනාංක මූලික පුහුණු පාඨමාලාව සකස් කර ඇති අතර, එය සය මාසික නේවාසික නොවන පාඨමාලාවකි.

## පාඨමාලාව සඳහා ඇතුලත්වීම

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබා පාසල් හැර ගිය වයස අවුරුදු 18 - 28 ත් අතර ශ්‍රී ලාංකීය යෞවන යෞවනියන්හට මේ සඳහා ඇතුලත්විය හැක.

## පුහුණුලාභීන් සඳහා ලැබෙන ප්‍රතිලාභ

- පුහුණු කාල සීමාව තුළ රු. 3,000.00 මාසික දීමනාවක්
- නිළ ඇඳුම්
- පුහුණු කාල සීමාව තුළ පැය 24 ම ආවරණය වන පරිදි රු.500,000.00 ජීවිත රක්ෂණාවරණයක්
- මූලික පුහුණු පාඨමාලාවෙන් අනතුරුව වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යොමු කිරීම හා ඒ සඳහා රු. 10,000.00 ක් දක්වා වන පාඨමාලා ගාස්තුවක් ලබාදීම.

*2018 වර්ෂයේදී ක්‍රියාත්මක වූ පාඨමාලා සැලැස්ම හා එහි ඇතුලත් විෂයයන් පහත පරිදි වේ.*

**පළමු කණ්ඩායම සඳහා ක්‍රියාත්මක වූ පාඨමාලා සැලැස්ම හා එහි ඇතුලත් විෂයයන්**

| විෂය | කාල පරිච්ඡේද ගණන |
|---|---|
| සරඹ | 60 |
| වෘත්තීය මාර්ගෝපදේශනය | 27 |
| පෞරුෂ සංවර්ධනය | 23 |
| තොරතුරු තාක්ෂණය | 78 |
| ඉංග්‍රීසි | 78 |
| බැහැරගත පුහුණුව | 27 |
| දෙමළ | 17 |
| සෞන්දර්ය රසාස්වාදය | 21 |
| මූලික අත් ආයුධ පුහුණුව | 30 |
| ඉංග්‍රීසි පොදු පාඩම | 40 |
| අමතර කාලපරිච්ඡේද | 35 |
| මුළු කාල පරිච්ඡේද | 436 |

## දෙවන කණ්ඩායම සඳහා ක්‍රියාත්මක වූ පාඨමාලා සැලැස්ම හා එහි ඇතුලත් විෂයයන්

| විෂය | කාල පරිච්ඡේද ගණන |
|---|---|
| සරඹ | 60 |
| වෘත්තීය මාර්ගෝපදේශනය | 30 |
| පෞරුෂ සංවර්ධනය | 30 |
| තොරතුරු තාක්ෂණය | 78 |
| ඉංග්‍රීසි | 108 |
| ව්‍යාපෘති යෝජනා ලිවීම | 10 |
| බැහැරගත පුහුණුව | 27 |
| ව්‍යාපෘති වැඩ | 26 |
| ඉංග්‍රීසි පොදු පාඩම | 38 |
| අමතර කාලපරිච්ඡේද | 30 |
| **එකතුව** | **437** |

යෞවන යෞවනියන් පන්ති කාමරයක් තුළට සීමා නොකොට ඔවුන්ට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලැබෙන අයුරින් විවිධ ක්‍රියාකාරකම් අනුසාරයෙන් අවශ්‍ය දැනුම ලබා ගැනීමට හැකිවන පරිදි මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඉහත විෂයයන්ගේ විෂය නිර්දේශයන්ද ඒ අනුව සකසා ඇත.

මෙහි ඇතුළත් පෞරුෂ සංවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන යන විෂයයන්ගේ විෂය නිර්දේශයන් පහත පරිදි වේ.



## පෞරුෂ සංවර්ධන විෂය නිර්දේශය

- පුද්ගලික හා සමාජ ආචාර ධර්ම
- පුද්ගලික සෞඛ්‍යය ආරක්ෂාව සහ ආකෘති නිර්මාණය
- පුද්ගලික වගකීම් සහ අයිතිවාසිකම්
- නව යොවුන් වියේ අරමුණු හා උපදේශනයේ වැදගත්කම
- නව යොවුන් වියේ අවශ්‍යතා හඳුනා ගැනීම
- නව යොවුන් වියේ ලිංගික ගැටළු සහ රෝග
- සිස්කෝ-ලිංගික ගැටළු සහ නව යොවුන් විය
- චිත්තවේගාත්මක බුද්ධිය කළමනාකරණය කිරීම සහ නව යොවුන් වියේ උපදේශනය
- පෞරුෂත්වය
- නායකත්ව කුසලතා වර්ධනය කිරීම
- අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කිරීම
- සන්නිවේදන කුසලතා
- කණ්ඩායම් ගොඩනැගීම
- ස්වයං අභිප්‍රේරණය
- ස්වයං දැනුවත්භාවය
- තීරණ ගැනීම සහ ගැටුම් කළමනාකරණය
- ආතතිය හා හැඟීම්
- පුද්ගලයෙකුගේ ජීවන දැක්ම

## වෘත්තීය මාර්ගෝපදේශ අන්තර්ගතය

- ස්වයං දැක්මක් ඇති කර ගැනීම සහ ජීවන දැක්මක් ගොඩනැගීම සඳහා අවශ්‍ය ඉලක්ක
- ශ්‍රම වෙළඳපොළ සඳහා ප්‍රවේශයන්
- වෘත්තීය ජීවිතය සඳහා ජීවන කුසලතා
- රැකියාවක් සඳහා අයදුම්පතක් පිළියෙළ කිරීම සහ එයට මඟ පෙන්වීම
- සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම
- ව්‍යවසායකත්ව කුසලතා සහ වෘත්තීය සම්ප්‍රේෂණය සංවර්ධනය කිරීම

## 2018 වර්ෂයේ පුහුණු කිරීම්

### පළමු අදියර - ජනවාරි සිට ජූනි

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | බඳවාගත් | | | පුහුණුව නිම කල | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| 1 | කටුනායක | 44 | 122 | 166 | 36 | 99 | 135 |
| 2 | අත්තනගල්ල | 24 | 71 | 95 | 16 | 55 | 71 |
| 3 | යක්කල | 33 | 72 | 105 | 23 | 65 | 88 |
| 4 | දිවුලපිටිය | 27 | 90 | 117 | 24 | 74 | 98 |
| 5 | බුලත්සිංහල | 46 | 88 | 134 | 42 | 72 | 114 |
| 6 | ගම්පොල | 49 | 71 | 120 | 35 | 60 | 95 |
| 7 | යටිනුවර | 32 | 67 | 99 | 24 | 56 | 80 |
| 8 | සොංකඩගල | 36 | 92 | 128 | 31 | 74 | 105 |
| 9 | නාවුල | 27 | 86 | 113 | 21 | 62 | 83 |
| 10 | නුවරඑළිය | 53 | 64 | 117 | 33 | 44 | 77 |
| 11 | හඟුරන්කෙත | 34 | 34 | 68 | 30 | 30 | 60 |
| 12 | වලපනේ | 30 | 31 | 61 | 27 | 25 | 52 |
| 13 | ගාල්ල | 28 | 40 | 68 | 23 | 34 | 57 |
| 14 | නෙළුව | 27 | 25 | 52 | 26 | 23 | 49 |
| 15 | අක්මීමන | 32 | 46 | 78 | 23 | 37 | 60 |
| 16 | අකුරැස්ස | 65 | 57 | 122 | 43 | 47 | 90 |
| 17 | දික්වැල්ල | 16 | 34 | 50 | 10 | 24 | 34 |
| 18 | වීරකැටිය | 34 | 38 | 72 | 27 | 27 | 54 |
| 19 | සූරියවැව | 29 | 44 | 73 | 22 | 33 | 55 |
| 20 | කන්තලේ | - | - | - | - | - | - |
| 21 | කින්නියා | 11 | 56 | 67 | 0 | 29 | 29 |
| 22 | ත්‍රිකුණාමලය | 22 | 30 | 52 | 16 | 11 | 27 |
| 23 | කුච්චවේලි | 13 | 35 | 48 | 10 | 17 | 27 |
| 24 | සේරුවාවිල | 30 | 55 | 85 | 22 | 33 | 55 |
| 25 | ගෝමරන්කඩවල | 14 | 29 | 43 | 12 | 14 | 26 |
| 26 | මුත්තූර් | 44 | 32 | 76 | 16 | 23 | 39 |
| 27 | අම්පාර | 21 | 24 | 45 | 16 | 13 | 29 |
| 28 | අඩ්ඩාලච්චේන | 48 | 25 | 73 | 24 | 14 | 38 |

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | බඳවාගත් | | | පුහුණුව නිම කල | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| 29 | දෙහිඅත්තකන්ඩිය | 23 | 39 | 62 | 10 | 21 | 31 |
| 30 | කුලියාපිටිය | 32 | 97 | 129 | 24 | 62 | 86 |
| 31 | වාරියපොල | 45 | 56 | 101 | 34 | 42 | 76 |
| 32 | මාවතගම | 33 | 48 | 81 | 22 | 30 | 52 |
| 33 | පඩුවස්නුවර | 33 | 68 | 101 | 29 | 48 | 77 |
| 34 | දොඩන්ගස්ලන්ද | 34 | 49 | 83 | 27 | 35 | 62 |
| 35 | නාත්තන්ඩිය | 17 | 56 | 73 | 12 | 45 | 57 |
| 36 | කැකිරාව | 46 | 76 | 122 | 36 | 61 | 97 |
| 37 | කලාවැව | 38 | 63 | 101 | 27 | 55 | 82 |
| 38 | අනුරාධපුරය | 25 | 56 | 81 | 23 | 33 | 56 |
| 39 | බණ්ඩාරවෙල | 40 | 46 | 86 | 34 | 37 | 71 |
| 40 | මහියංගණය | 30 | 26 | 56 | 21 | 21 | 42 |
| 41 | මොණරාගල | 42 | 56 | 98 | 24 | 39 | 63 |
| 42 | තණමල්විල | 45 | 62 | 107 | 29 | 40 | 69 |
| 43 | කතරගම | 35 | 52 | 87 | 22 | 42 | 64 |
| 44 | නිවිතිගල | 77 | 63 | 140 | 56 | 66 | 122 |
| 45 | ඇඹිලිපිටිය | 31 | 44 | 75 | 26 | 29 | 55 |
| 46 | ගලිගමුව | 38 | 78 | 116 | 24 | 51 | 75 |
| 47 | කෑගල්ල | 32 | 57 | 89 | 26 | 43 | 69 |
| 48 | මුලතිව් | 48 | 35 | 83 | 33 | 26 | 59 |
| 49 | මන්නාරම | 25 | 39 | 64 | 17 | 24 | 41 |
| එකතුව | | **1638** | **2624** | **4262** | **1188** | **1945** | **3133** |

## දෙවන අදියර - ජූලි සිට දෙසැම්බර්

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | බඳවාගත් | | | පුහුණුව නිම කල | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| 1 | කටුනායක | 22 | 33 | 55 | 18 | 27 | 45 |
| 2 | අත්තනගල්ල | 18 | 17 | 35 | 8 | 12 | 20 |
| 3 | යක්කල | 14 | 30 | 44 | 13 | 27 | 40 |
| 4 | දිවුලපිටිය | 20 | 19 | 39 | 16 | 15 | 31 |
| 5 | බුලත්සිංහල | 42 | 28 | 70 | 35 | 24 | 59 |
| 6 | ගම්පොල | 40 | 38 | 78 | 34 | 29 | 63 |
| 7 | යටිනුවර | 73 | 35 | 108 | 52 | 26 | 78 |
| 8 | සෙංකඩගල | 34 | 40 | 74 | 29 | 28 | 57 |
| 9 | නාවුල | 22 | 34 | 56 | 19 | 26 | 45 |
| 10 | නුවරඑළිය | 42 | 15 | 57 | 35 | 9 | 44 |
| 11 | හඟුරන්කෙත | 39 | 15 | 54 | 30 | 11 | 41 |
| 12 | වලපනේ | 12 | 10 | 22 | 10 | 7 | 17 |
| 13 | ගාල්ල | 28 | 23 | 51 | 20 | 12 | 32 |
| 14 | නෙළුව | 31 | 22 | 53 | 27 | 20 | 47 |
| 15 | අක්මීමන | 35 | 18 | 53 | 31 | 15 | 46 |
| 16 | අකුරැස්ස | 37 | 19 | 56 | 32 | 15 | 47 |
| 17 | දික්වැල්ල | 29 | 21 | 50 | 22 | 16 | 38 |
| 18 | වීරකැටිය | 44 | 25 | 69 | 31 | 20 | 51 |
| 19 | සූරියවැව | 36 | 27 | 63 | 31 | 16 | 47 |
| 20 | කන්තලේ | 37 | 4 | 41 | 23 | 2 | 25 |
| 21 | කින්නියා | 13 | 64 | 77 | 9 | 39 | 48 |
| 22 | ත්‍රිකුණාමලය | 9 | 11 | 20 | 8 | 9 | 17 |
| 23 | කුච්චවේලි | 14 | 24 | 38 | 10 | 15 | 25 |
| 24 | සේරුවාවිල | 27 | 12 | 39 | 20 | 7 | 27 |
| 25 | ගෝමරණ්කඩවල | 8 | 15 | 23 | 3 | 8 | 11 |
| 26 | මුත්තූර් | 63 | 47 | 110 | 50 | 31 | 81 |
| 27 | අම්පාර | 107 | 20 | 127 | 66 | 16 | 82 |
| 28 | අඩ්ඩාලච්චේන | 39 | 60 | 99 | 36 | 39 | 75 |

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | බඳවාගත් | | | පුහුණුව නිම කළ | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| 29 | දෙහිඅත්තකන්ඩිය | 34 | 12 | 46 | 30 | 8 | 38 |
| 30 | කුලියාපිටිය | 43 | 20 | 63 | 32 | 10 | 42 |
| 31 | වාරියපොල | 77 | 42 | 119 | 75 | 41 | 116 |
| 32 | මාවතගම | 40 | 15 | 55 | 35 | 12 | 47 |
| 33 | පඩුවස්නුවර | 62 | 27 | 89 | 50 | 16 | 66 |
| 34 | දොඩන්ගස්ලන්ද | 52 | 8 | 60 | 44 | 5 | 49 |
| 35 | නාත්තන්ඩිය | 13 | 18 | 31 | 13 | 15 | 28 |
| 36 | කැකිරාව | 31 | 24 | 55 | 23 | 19 | 42 |
| 37 | කලාවැව | 31 | 22 | 53 | 21 | 18 | 39 |
| 38 | අනුරාධපුරය | 28 | 25 | 53 | 18 | 17 | 35 |
| 39 | බණ්ඩාරවෙල | 58 | 22 | 80 | 43 | 18 | 61 |
| 40 | මහියංගණය | 26 | 12 | 38 | 25 | 12 | 37 |
| 41 | මොණරාගල | 70 | 30 | 100 | 52 | 22 | 74 |
| 42 | තණමල්විල | 20 | 30 | 50 | 14 | 22 | 36 |
| 43 | කතරගම | 27 | 21 | 48 | 19 | 14 | 33 |
| 44 | නිවිතිගල | 46 | 21 | 67 | 38 | 15 | 53 |
| 45 | ඇඹිලිපිටිය | 58 | 21 | 79 | 45 | 16 | 61 |
| 46 | ගලිගමුව | 45 | 30 | 75 | 28 | 17 | 45 |
| 47 | කෑගල්ල | 50 | 31 | 81 | 28 | 22 | 50 |
| 48 | මුලතිව් | 36 | 37 | 73 | 25 | 16 | 41 |
| 49 | මන්නාරම | 15 | 18 | 33 | 11 | 12 | 23 |
| **එකතුව** | | **1797** | **1212** | **3009** | **1387** | **868** | **2255** |

## වර්ෂය තුළ මුළු පුහුණු කිරීම්

| අනු අංකය | අදියර | බඳවාගත් | | | පුහුණුව නිම කල | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව | ගැහැණු | පිරිමි | එකතුව |
| 1 | පළමු අදියර | 1638 | 2624 | 4262 | 1191 | 1942 | 3133 |
| 2 | දෙවන අදියර | 1797 | 1212 | 3009 | 1387 | 868 | 2255 |
| **එකතුව** | | 3435 | 3836 | 7271 | 2578 | 2810 | 5388 |

# පුහුණු පාඨමාලාව අවසානයේ පුහුණුලාභීන් විසිරයාම

ජාතික යෞවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයන්හි ඒ ඒ අදියරන් යටතේ පවත්වනු ලැබූ පුහුණු පාඨමාලාව අවසානයේ පුහුණුලාභීන්ගේ විසිරයාමද උත්සවාකාරයෙන් පවත්වනු ලබයි. මෙහිදී ජාතික යෞවුන් සේනාංක තූර්ය වාදක කණ්ඩායමේද සහභාගිත්වයෙන් පළාත් මට්ටමින් විසිර යාමේ පෙළපාලි පවත්වා සහතික ප්‍රදානෝත්සවයක් මෙන්ම හොඳම හා දක්ෂතම පුහුණුලාභියා පුහුණුලාභිනිය සඳහා කුසලාන පිරිනැමීමක්ද සිදු කරනු ලබයි.

එසේ වුවත් 2018 වර්ෂයේ පැවති තත්ත්වය අනුව 2018 පළමු අදියරේ පාඨමාලාවේ පුහුණුලාභීන්ගේ විසිරයාමේ උත්සව ඒ ඒ මධ්‍යස්ථානයන්හි මධ්‍යස්ථාන මට්ටමින් සිදු කරන ලද අතර, නැගෙනහිර පළාතේ මධ්‍යස්ථාන පමණක් පළාත් මට්ටමින් විසිරයාමේ උත්සවය පවත්වන ලදී. 2018 දෙවන අදියරේ පාඨමාලාවේ පුහුණුලාභීන්ගේ විසිරයාමේ උත්සවද මධ්‍යස්ථාන මට්ටමින් ඒ ඒ මධ්‍යස්ථානයන්හිදී සිදු කරන ලදී.



## 2018 පළමු අදියර - පාඨමාලාවේ විසිරයමේ උත්සව පැවැත්වූ ආකාරය

| අනු අංකය | මධ්‍යස්ථානය | පවත්වන ලද ස්ථානය | පැවැත්වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කටුනායක | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 135 |
| 2 | අත්තනගල්ල | අත්තනගල්ල මධ්‍යස්ථානය | 2018.10.04 | 71 |
| 3 | යක්කල | | | 88 |
| 4 | දිවුලපිටිය | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 98 |
| 5 | බුලත්සිංහල | එම මධ්‍යස්ථානය | 2018.10.08 | 114 |
| 6 | ගම්පොළ | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 95 |
| 7 | සෙන්කඩගල | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 105 |
| 8 | යටිනුවර | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 80 |
| 9 | නාවුල | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 83 |
| 10 | නුවරඑළිය | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 77 |
| 11 | හඟුරන්කෙත | වලපනේ මධ්‍යස්ථානය | 2018.10.05 | 60 |
| 12 | වලපනේ | | 2018.10.05 | 52 |
| 13 | නෙළුව | එම මධ්‍යස්ථානය | 2018.10.02 | 49 |
| 14 | ගාල්ල | ගාල්ල මධ්‍යස්ථානය | 2018.10.04 | 57 |
| 15 | අක්මීමණ | | | 60 |
| 16 | අකුරැස්ස | අකුරැස්ස මධ්‍යස්ථානය | 2018.10.05 | 90 |
| 17 | දික්වැල්ල | | | 34 |
| 18 | වීරකැටිය | සූරියවැව මධ්‍යස්ථානය | 2018.10.03 | 54 |
| 19 | සූරියවැව | | | 55 |
| 20 | කුලියාපිටිය | කුළියාපිටිය මධ්‍යස්ථානය | 2018.10.05 | 86 |
| 21 | නාත්තණ්ඩිය | | | 57 |
| 22 | වාරියපොල | පඬුවස්නුවර මධ්‍යස්ථානය | 2018.10.05 | 76 |
| 23 | පඬුවස්නුවර | | | 77 |
| 24 | මාවතගම | දොඩම්ගස්ලන්ද මධ්‍යස්ථානය | 2018.10.04 | 52 |
| 25 | දොඩම්ගස්ලන්ද | | | 62 |
| 26 | කැකිරාව | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 97 |

| අනු අංකය | මධ්‍යස්ථානය | පවත්වන ලද ස්ථානය | පැවැත්වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 27 | කලාවැව | කලාවැව මධ්‍යස්ථානය | 2018.10.05 | 82 |
| 28 | අනුරාධපුරය | | | 56 |
| 29 | බණ්ඩාරවෙල | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 71 |
| 30 | මහියංගනය | එම මධ්‍යස්ථානය | 2018.10.05 | 42 |
| 31 | තණමල්විල | මොණරාගල මධ්‍යස්ථානය | 2018.10.04 | 69 |
| 32 | කතරගම | | | 64 |
| 33 | මොණරාගල | | | 63 |
| 34 | නිවිතිගල | නිවිතිගල මධ්‍යස්ථානය | 2018.10.04 | 122 |
| 35 | ඇඹිලිපිටිය | | | 55 |
| 36 | ගලිගමුව | කෑගල්ල මධ්‍යස්ථානය | 2018.10.05 | 75 |
| 37 | කෑගල්ල | | | 69 |
| 38 | කින්නියා | ත්‍රිකුණාමලය මධ්‍යස්ථානය | 2018.10.01 | 29 |
| 39 | අම්පාර | | | 29 |
| 40 | සේරුවාවිල | | | 55 |
| 41 | ගෝමරන්කඩවල | | | 26 |
| 42 | කුච්චවේලි | | | 27 |
| 43 | මුතූර් | | | 39 |
| 44 | ත්‍රිකුණාමලය | | | 27 |
| 45 | දෙහිඅත්තකණ්ඩිය | | | 31 |
| 46 | අඩ්ඩාලච්චේන | | | 38 |
| 47 | මුලතිව් | එම මධ්‍යස්ථානය | 2018.10.02 | 59 |
| 48 | මන්නාරම | එම මධ්‍යස්ථානය | 2018.10.04 | 41 |
| **එකතුව** | | | | **3133** |

| අනු අංකය | මධ්‍යස්ථානය | පවත්වන ලද ස්ථානය | පැවැත්වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කටුනායක | එම මධ්‍යස්ථානය | 2019.01.17 | 45 |
| 2 | අත්තනගල්ල | එම මධ්‍යස්ථානය | 2019.01.17 | 20 |
| 3 | යක්කල | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 40 |
| 4 | දිවුලපිටිය | එම මධ්‍යස්ථානය | 2019.01.16 | 31 |
| 5 | බුලත්සිංහල | එම මධ්‍යස්ථානය | 2019.01.16 | 59 |
| 6 | ගම්පොළ | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 63 |
| 7 | සෙංකඩගල | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 57 |
| 8 | යටිනුවර | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 78 |
| 9 | නාවුල | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 45 |
| 10 | නුවරඑළිය | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 44 |
| 11 | හඟුරන්කෙත | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 41 |
| 12 | වලපනේ | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 17 |
| 13 | ගාල්ල | එම මධ්‍යස්ථානය | 2019.01.08 | 32 |
| 14 | නෙළුව | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 47 |
| 15 | අක්මීමණ | එම මධ්‍යස්ථානය | 2019.01.08 | 46 |
| 16 | අකුරැස්ස | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 47 |
| 17 | දික්වැල්ල | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 38 |
| 18 | වීරකැටිය | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 51 |
| 19 | සූරියවැව | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 47 |
| 20 | කුලියාපිටිය | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 42 |
| 21 | නාත්තණ්ඩිය | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 28 |
| 22 | වාරියපොල | එම මධ්‍යස්ථානය | 2019.01.08 | 116 |
| 23 | පඬුවස්නුවර | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 66 |
| 24 | මාවතගම | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 47 |
| 25 | දොඩම්ගස්ලන්ද | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 49 |
| 26 | කැකිරාව | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 42 |

| අනු අංකය | මධ්‍යස්ථානය | පවත්වන ලද ස්ථානය | පැවැත්වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 27 | බුල්නෑව | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 39 |
| 28 | අනුරාධපුරය | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 35 |
| 29 | බණ්ඩාරවෙල | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 61 |
| 30 | මහියංගනය | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 37 |
| 31 | තණමල්විල | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 36 |
| 32 | කතරගම | එම මධ්‍යස්ථානය | 2019.01.17 | 33 |
| 33 | මොණරාගල | එම මධ්‍යස්ථානය | 2019.01.16 | 74 |
| 34 | නිවිතිගල | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 53 |
| 35 | ඇඹිලිපිටිය | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 61 |
| 36 | ගලිගමුව | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 45 |
| 37 | කෑගල්ල | එම මධ්‍යස්ථානය | 2019.01.08 | 50 |
| 38 | කින්නියා | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 48 |
| 39 | සේරුවාවිල | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 27 |
| 40 | මුතූර් | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 81 |
| 41 | ගෝමරන්කඩවල | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 11 |
| 42 | ත්‍රිකුණාමලය | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 17 |
| 43 | කුච්චවේලි | එම මධ්‍යස්ථානය | 2019.01.11 | 25 |
| 44 | අම්පාර | එම මධ්‍යස්ථානය | 2019.01.16 | 82 |
| 45 | අඩ්ඩාලච්චේන | එම මධ්‍යස්ථානය | 2019.01.16 | 75 |
| 46 | කන්තලේ | එම මධ්‍යස්ථානය | 2019.01.09 | 25 |
| 47 | දෙහිඅත්තකණ්ඩිය | එම මධ්‍යස්ථානය | 2019.01.17 | 38 |
| 48 | මුලතිව් | එම මධ්‍යස්ථානය | 2019.01.10 | 41 |
| 49 | මන්නාරම | එම මධ්‍යස්ථානය | 2019.01.17 | 23 |
| **එකතුව** | | | | **2255** |

# වෘත්තීය පුහුණුවට යොමු කිරීම

සය මාසික මූලික පුහුණුව සාර්ථකව නිම කරන පුහුණුලාභීන්ව ඔවුන්ගේ වෘත්තීය ලැදියාව හා පවත්නා හැකියාවන් අනුව තෝරගත් රාජ්‍ය හා පුද්ගලික අංශයේ පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයන් මඟින් පවත්වනු ලබන පහත දක්වා ඇති වෘත්තීය ක්ෂේත්‍රයන් යටතේ වන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම කරනු ලබන අතර, එම පාඨමාලා හැදෑරීම සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු. 10,000.00ක් දක්වා යොවුන් සේනාංකය මඟින් ගෙවනු ලැබේ.

- කෘෂිකාර්මික වැවිලි හා සත්ව පාලන
- කලා හා මාධ්‍ය
- රථ වාහන අලුත්වැඩියාව හා නඩත්තුව
- ගොඩනැගිලි හා ඉදිකිරීම්
- විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ
- මුදල් හා කළමනාකරණ
- ධීවර හා ජලජ සත්ව පාලනය
- ආහාර පාන
- මැණික් හා ස්වර්ණාභරණ
- හෝටල් හා සංචාරක
- මානව සම්පත් කළමනරකරණය
- තොරතුරු සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය
- නාවික හා නෞකා චාලක විද්‍යාව
- මෙකාට්‍රොනික තාක්ෂණය
- වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව
- ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු
- කාර්යාල කළමනාකරණ
- පුද්ගල හා කණ්ඩායම් සංවර්ධනය
- මුද්‍රණ හා ඇසුරුම්කරණ
- ශීතකරණ හා වායු සමීකරණ
- ඇඟළුම් හා රෙදිපිළි
- දැව ආශ්‍රිත



## පුහුණු මධ්‍යස්ථාන අනුව

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | පළමු අදියර | | | දෙවන අදියර | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| 1 | කටුනායක | 67 | 30 | 97 | 23 | 15 | 38 |
| 2 | අත්තනගල්ල | 57 | 13 | 70 | 11 | 6 | 17 |
| 3 | යක්කල | 61 | 22 | 83 | 22 | 8 | 30 |
| 4 | දිවුලපිටිය | 65 | 20 | 85 | 14 | 14 | 28 |
| 5 | බුලත්සිංහල | 74 | 40 | 114 | 14 | 22 | 36 |
| 6 | ගම්පොල | 58 | 33 | 91 | 25 | 24 | 49 |
| 7 | යටිනුවර | 55 | 22 | 77 | 19 | 41 | 60 |
| 8 | සෙංකඩගල | 72 | 31 | 103 | 26 | 29 | 55 |
| 9 | නාවුල | 20 | 62 | 82 | 18 | 10 | 28 |
| 10 | නුවරඑළිය | 32 | 38 | 70 | 7 | 23 | 30 |
| 11 | හඟුරන්කෙත | 26 | 22 | 48 | 7 | 21 | 28 |
| 12 | වලපනේ | 24 | 29 | 53 | 4 | 5 | 9 |
| 13 | ගාල්ල | 34 | 22 | 56 | 6 | 8 | 14 |
| 14 | නෙළුව | 15 | 21 | 36 | 5 | 1 | 6 |
| 15 | අක්මීමන | 24 | 9 | 33 | 8 | 14 | 22 |
| 16 | අකුරැස්ස | 47 | 43 | 90 | 10 | 16 | 26 |
| 17 | දික්වැල්ල | 19 | 6 | 25 | 5 | 8 | 13 |
| 18 | වීරකැටිය | 23 | 14 | 37 | 15 | 29 | 44 |
| 19 | සූරියවැව | 28 | 17 | 45 | 7 | 9 | 16 |
| 20 | කන්තලේ | 0 | 0 | 0 | 1 | 12 | 13 |
| 21 | කින්නියා | 26 | 0 | 26 | 23 | 4 | 27 |
| 22 | ත්‍රිකුණාමලය | 15 | 13 | 28 | 9 | 6 | 15 |
| 23 | ගෝමරන්කඩවල | 12 | 12 | 24 | 3 | 1 | 4 |
| 24 | අම්පාර | 10 | 9 | 19 | 4 | 16 | 20 |
| 25 | මුතූර් | 13 | 10 | 23 | 20 | 41 | 61 |
| 26 | කුච්චවේලි | 6 | 8 | 14 | 13 | 7 | 20 |
| 27 | අඩාලච්චේන | 11 | 3 | 14 | 19 | 11 | 30 |
| 28 | සේරුවාවිල | 22 | 16 | 38 | 2 | 6 | 8 |

| අනු අංකය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | පළමු අදියර | | | දෙවන අදියර | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| 29 | දෙහිඅත්තකණ්ඩිය | 26 | 10 | 36 | 5 | 23 | 28 |
| 30 | කුලියාපිටිය | 51 | 18 | 69 | 4 | 8 | 12 |
| 31 | වාරියපොල | 42 | 34 | 76 | 31 | 61 | 92 |
| 32 | මාවතගම | 25 | 16 | 41 | 2 | 12 | 14 |
| 33 | පඩුවස්නුවර | 42 | 20 | 62 | 7 | 17 | 24 |
| 34 | දොඩන්ගස්ලන්ද | 36 | 25 | 61 | 2 | 28 | 30 |
| 35 | නාත්තන්ඩිය | 35 | 12 | 47 | 4 | 1 | 5 |
| 36 | කැකිරාව | 62 | 34 | 96 | 3 | 2 | 5 |
| 37 | කලාවැව | 39 | 14 | 53 | 13 | 17 | 30 |
| 38 | අනුරාධපුරය | 29 | 18 | 47 | 17 | 15 | 32 |
| 39 | බණ්ඩාරවෙල | 36 | 33 | 69 | 29 | 12 | 41 |
| 40 | මහියංගණය | 18 | 12 | 30 | 8 | 9 | 17 |
| 41 | මොනරාගල | 37 | 21 | 58 | 10 | 20 | 30 |
| 42 | තණමල්විල | 38 | 21 | 59 | 18 | 8 | 26 |
| 43 | කතරගම | 36 | 21 | 57 | 13 | 12 | 25 |
| 44 | නිවිතිගල | 53 | 54 | 107 | 11 | 27 | 38 |
| 45 | ඇඹිලිපිටිය | 30 | 31 | 61 | 6 | 17 | 23 |
| 46 | ගලිගමුව | 40 | 12 | 52 | 5 | 7 | 12 |
| 47 | කෑගල්ල | 31 | 15 | 46 | 14 | 14 | 28 |
| 48 | මුලතිව් | 25 | 12 | 37 | 9 | 8 | 17 |
| 49 | මන්නාරම | 22 | 16 | 38 | 4 | 9 | 13 |
| එකතුව | | **1669** | **1014** | **2683** | **555** | **734** | **1289** |

## වර්ෂය තුළ මුළු වෘත්තීය පුහුණුවට යොමු කිරීම්

| අනු අංකය | අදියර | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|---|
| 1 | පළමු අදියර | 1669 | 1014 | 2683 |
| 2 | දෙවන අදියර | 555 | 734 | 1289 |
| එකතුව | | **2224** | **1748** | **3972** |

## වෘත්තීය ක්ෂේත්‍ර අනුව

| අනු අංකය | වෘත්තීය ක්ෂේත්‍රය | අදියර I | අදියර II | එකතුව |
|---|---|---|---|---|
| 1 | කෘෂිකාර්මික වැවිලි හා සත්ව පාලන | 27 | 70 | 97 |
| 2 | කලා,මාධ්‍ය හා ග්‍රැෆික් | 36 | 6 | 42 |
| 3 | රථ වාහන අලුත්වැඩියාව හා නඩත්තුව හා මෝටර් රථ කාර්මික | 298 | 91 | 389 |
| 4 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 76 | 45 | 121 |
| 5 | විදුලි, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ | 243 | 50 | 293 |
| 6 | මුදල් බැංකු හා කළමනාකරණ | 15 | 12 | 27 |
| 7 | ධීවර හා ජලජ සත්ව පාලනය | 0 | 11 | 11 |
| 8 | ආහාර පාන තාක්‍ෂණ | 0 | 0 | 0 |
| 9 | මැණික් හා ස්වර්ණාභරණ | 49 | 28 | 77 |
| 10 | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු | 36 | 0 | 36 |
| 11 | හෝටල් හා සංචාරක | 729 | 197 | 926 |
| 12 | මානව සම්පත් කළමනාකරණය | 4 | 23 | 27 |
| 13 | තොරතුරු සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්‍ෂණය | 132 | 292 | 424 |
| 14 | නාවික හා නෞකා චාලක විද්‍යාව | 90 | 28 | 118 |
| 15 | භාෂා | 15 | 3 | 18 |
| 16 | සෞඛ්‍ය හා සාත්තු සේවය | 320 | 95 | 415 |
| 17 | ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු | 0 | 3 | 3 |
| 18 | කාර්යාල කළමනාකරණ | 28 | 78 | 106 |
| 19 | මුද්‍රණ හා ඇසුරුම්කරණ | 27 | 4 | 31 |
| 20 | ශීතකරණ හා වායු සමීකරණ | 151 | 20 | 171 |
| 21 | ඇඟළුම් හා රෙදිපිළි, ටේලරින් | 43 | 34 | 77 |
| 22 | දැව ආශ්‍රිත හා වඩු කාර්මික | 3 | 3 | 6 |
| 23 | රූපලාවන්‍ය, කොණ්ඩා සැකසුම් හා මනාලියන් හැඩගැන්වීම | 124 | 40 | 164 |
| 24 | පෙර පාසල් ගුරු | 45 | 54 | 99 |
| 25 | භූමි අලංකරණය | 52 | 1 | 53 |
| 26 | ලෙදර් හා පාවහන් | 3 | 0 | 3 |
| 27 | මෙකාට්‍රොනික්ස් | 0 | 0 | 0 |
| 28 | වෙල්ඩර්, ඇලුමිනියම් ෆැබ්රිකේටර් | 29 | 26 | 55 |
| 29 | ව්‍යාපාර බාහිරකරණය (BPO) | 0 | 31 | 31 |
| 30 | ඖෂධවේදී සහ වෛද්‍ය රසායනාගාර කාර්මික | 25 | 3 | 28 |
| 31 | නර්තන | 0 | 18 | 18 |
| 32 | ශරීර සුවතා | 25 | 6 | 31 |
| 33 | ජල නල කාර්මික | 0 | 1 | 1 |
| 34 | වෙනත් | 58 | 16 | 74 |
| | **එකතුව** | **2683** | **1289** | **3972** |

# විශේෂ පුහුණු පාඨමාලා

ජාතික යොවුන් සේනාංකය මඟින් පවත්වනු ලබන මූලික පුහුණු පාඨමාලාවට අමතරව විශේෂයෙන් සැකසූ මධ්‍යස්ථාන 03 කදී පහත පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර මෙම පුහුණු වැඩසටහන් සඳහා යොවුන් සේනාංක පුහුණුලාභීන්ව මෙන්ම බාහිර අයවළුන්ද ඒ සඳහා සහභාගි කර ගනු ලබයි.

- හෝටල් පුහුණු පාඨමාලාව
- ව්‍යාපාර බාහිරකරණ පුහුණු පාඨමාලාව
- බැහැරගත පුහුණු පාඨමාලාව

## ජාතික යොවුන් සේනාංක හෝටල් පුහුණු පාසල

LA HOTELIER
INSTITUTE OF HOSPITALITY MANAGEMENT

දඹුල්ල ඉනාමළුව ප්‍රදේශයේ ජාතික යොවුන් සේනාංක හෝටල් පුහුණු පාසල පිහිටුවා ඇති අතර මෙම හෝටල් පුහුණු පාසල මඟින් හෝටල් ක්ෂේත්‍රයේ පාඨමාලා 05 ක් පවත්වනු ලබයි. මෙම පුහුණු පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)III හා IV මට්ටමේ පාඨමාලා වන අතර එක් වරකදී පුහුණුලාභීන් 200 ක ප්‍රමාණයට පුහුණුව ලබා දීමේ හැකියාව මෙම හෝටල් පුහුණු පාසල සතුය. එමෙන්ම හෝටල් පුහුණු පාසලකට අවශ්‍ය සියළුම නවීණ උපකරණ වලින් මෙන්ම සුදුසුකම් සපිරූ හෝටල් ක්ෂේත්‍රයේ දක්ෂ උපදේශක මණ්ඩලයකින්ද මෙම හෝටල් පුහුණු පාසල සමන්විතය. එමෙන්ම මෙම පුහුණු මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලබන්නේ තාක්ෂණ, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET)2014 - 2020 ව්‍යාපෘතිය මඟිනි.

දැනට මෙම පුහුණු පාසල මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා ඇතුලත් කර ගනු ලබන්නේ ජාතික යොවුන් සේනාංක මූලික පුහුණු පාඨමාලාව හැදෑරූවන් පමණකි. පාඨමාලා සඳහා ගාස්තු අය කිරීමක් සිදු නොකරන අතර පුහුණුලාභීන්ට පුහුණු කාලසීමාව තුලදී නොමිලේ ආහාර පාන ලබාදීමද සිදු කරනු ලබයි. සියළුම පාඨමාලාවන් හදාරන පුහුණුලාභීන්ට ශ්‍රී ලංකාව තුළ පිළිගත් සංචාරක හෝටල් වෙතින් රැකියාගත පුහුණුව ලබාදීමට කටයුතු කරනු ලබන අතර පාඨමාලා සාර්ථකව නිම කරනු ලබන සියළුම පුහුණුලාභීන් හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීමද සිදු කරනු ලබයි.



## මෙම හෝටල් පුහුණු පාසල මඟින් පහත සඳහන් පාඨමාලා පවත්වනු ලබයි.

### ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) IV මට්ටමේ පාඨමාලා

- පේස්ට්‍රි හා බේකරි
  (Pastry & Bakery)
- ජාත්‍යන්තර සූපවේදය
  (International Cookery)
- ආහාර පාන පිළිගැන්වීම
  (Food & Beverage)



### ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) III මට්ටමේ පාඨමාලා

- ගෘහ පාලනය
  (House Keeping)
- පිළිගැනීමේ අංශය
  (Front Office)



### 2018 වර්ෂයේ පාඨමාලා සඳහා සහභාගිත්වය

| අනු අංකය | පාඨමාලාව | පුහුණුලාභීන් ගණන | |
|---|---|---|---|
| | | ලියාපදිංචි | අවසන් කළ |
| 1 | පේස්ට්‍රි හා බේකරි (Pastry & Bakery) | 25 | 21 |
| 2 | ජාත්‍යන්තර සූපවේදය ( International Cookery) | 34 | 29 |
| 3 | ආහාර පාන පිළිගැන්වීම ( Food & Beverage) | 16 | 11 |
| 4 | ගෘහ පාලනය ( House Keeping) | 19 | 15 |
| 5 | පිළිගැනීමේ අංශය ( Front Office ) | 8 | 6 |
| එකතුව | | **102** | **82** |

# ජාතික යොවුන් සේනාංක චීන භාෂා විද්‍යාගාරය

වර්තමානයේ දේශීය හා විදේශීය රැකියා අවස්ථා සඳහා විශාල අවශ්‍යතාවයක්ව පවතින චීන භාෂා දැනුම ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ට ලබාදීමේ අරමුණින් මහජන චීන සමූහාණ්ඩුවේ පරිත්‍යාග මත චීන භාෂා විද්‍යාගාරයක් 2016 වර්ෂයේදී ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව රුපියල් මිලියන 2.5 ක පමණ මුදලක් වැය කර මෙම චීන භාෂා විද්‍යාගාරය දඹුල්ල ජාතික යොවුන් සේනාංක හෝටල් පුහුණු පාසල පිහිටි පරිශ්‍රයේ ඉදිකර චීන තානාපති කාර්යාලයේ සංස්කෘතික කටයුතු නිලධාරිගේ හා ආර්ථික කටයුතු උපදේශකගේ සහභාගිත්වයෙන් 2016.07.14 දින එහි පුහුණු කටයුතු ආරම්භ කරන ලදී. එමෙන්ම මෙහි වර්ෂයකට අදියර 02 ක් යටතේ පුහුණුලාභීන් 60 දෙනෙකුට භාෂාව හැදෑරීමේ පහසුකම් පවතින අතර 2018 වර්ෂයේදී පුහුණුලාභීන් 82 දෙනෙකු සාර්ථකව චීන භාෂාව හැදෑරීම සිදු කරන ලදී.







# ජාතික යොවුන් සේනාංක ව්‍යාපාර බාහිරකරණ
# BPO ( Business Process Outsource) පුහුණු මධ්‍යස්ථානය

දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලේ විශාල වශයෙන් රැකියා අවස්ථා පවත්නා ව්‍යාපාර බාහිරකරණ ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොවුන් සේනාංක පුහුණුලාභීන්ටද අවස්ථාව ලබා දීමේ අරමුණින් මෙම පුහුණු මධ්‍යස්ථානය යොවුන් සේනාංකය විසින් ආරම්භ කරන ලද අතර මෙම මධ්‍යස්ථානය අංක 355/3/1, ඕල්කට් මාවත, කොළඹ 10 ස්ථානයේ Training Institute for Technology Professionals ආයතනය පිහිටි ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇත. මෙහි එක් අදියරකදී පුහුණුලාභීන් 25 දෙනෙකුට පුහුණුව ලබාදීමේ පහසුකම් ඇත. එමෙන්ම මෙම පුහුණු මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලබන්නේ තාක්ෂණ, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) 2014 - 2020 ව්‍යාපෘතිය මඟිනි.

ජාතික යොවුන් සේනාංකය ඇමරිකාවේ BCI ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ මෙම පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර ඇති අතර මෙහි පාඨමාලා හදාරන පුහුණු ලාභීන් BCI ආයතනයේ ඉන්දියාවේ පිහිටි ශාඛාව වන BPO Certificate Institute මඟින් මාර්ග ගතව (Online) පවත්වනු විභාග සඳහා පෙනී සිටිය යුතුය. ඒ අනුව සාර්ථකව පාඨමාලාව සම්පූර්ණ කරන පුහුණුලාභීන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් හිමි වන අතර ඔවුන් සියල්ලම රැකියා සඳහා යොමු කිරීමද කරනු ලබයි.




දැනට මෙම පුහුණු මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් පාඨමාලා පවත්වනු ලබයි.

- Certified Customer Interaction Professional(CCIP)
- Certified Back Office Services Associate (CBSA)
- Certified FinanceProcess Associate(CFPA)

මෙම පාඨමාලා සඳහා දැනට ඇතුලත් කර ගනු ලබන්නේ ජාතික යොවුන් සේනාංකයේ මූලික පුහුණු පාඨමාලාව හැදෑරූවන් පමණක් වන අතර මේ සඳහා ගාස්තු අය කිරීමක් නොමැත.

## 2018 වර්ෂයේ පාඨමාලා සඳහා සහභාගිත්වය

| අනු අංකය | පාඨමාලාව | අදියර I | අදියර II |
|---|---|---|---|
| 1 | Certified Customer Interaction Professional (CCIP) | 5 | - |
| 2 | Certified Back Office Services Associate (CBSA) | 11 | - |
| 3 | Certified Finance Process Associate (CFPA) | 14 | - |
| එකතුව | | **30** | **-** |

## ජාතික යොවුන් සේනාංක බැහැරගත පුහුණු මධ්‍යස්ථානය

ජාතික යොවුන් සේනාංක බැහැරගත පුහුණු (Adventure Based Training) පාසල මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල අරංගල ඒ 9 මාර්ගයට යාබඳව පිහිටා ඇති අතර මෙම මධ්‍යස්ථානය මඟින් යොවුන් සේනාංක පුහුණුලාභීන්ට මෙන්ම බාහිර ආයතනයන්හි කාර්ය මණ්ඩල හා පුහුණුලාභීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම සිදු කරයි. මෙම බැහැරගත පුහුණුව යොවුන් සේනාංක මූලික පුහුණු පාඨමාලාවේද අනිවාර්ය අංගයක් වන අතර මෙමගින් පුද්ගලයින් තුළ මෘදු කුසලතා ( Soft Skills ) වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

- නිරීක්ෂණය
- නිර්මාණශීලී චින්තනය
- ස්වයං විනය
- කළමනාකරණ අභ්‍යාස
- විශ්වාසය
- පරිසර සංරක්ෂනණය
- පුද්ගලයින් හඳුනාගැනීම
- ආත්ම විශ්වාසය
- ධීර අභ්‍යාස
- රස වින්දනය
- නායකත්ව දැරීම වගකීම හා වගවීම
- මත්ද්‍රව්‍ය නිවාරණය

යන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඊට අදාළ කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාවේදී පහත ක්‍රියාකාරකම් වල යෙදීම සිදු කරයි.

### බ්ලයින්ඩ් පොලිගන් - Blind Polygon

රවුමක ආකාරයේ කඹයක වටේ සහභාගිකයන් සියලුම දෙනා සිටගෙන සිටින අතර, ඔවුන්ගේ ඇස් ආවරණය කර උපදේශකයන්ගේ අණට, වචනවලට අනුව සංවෘත රූපයක් බැගින් කඹය ආධාරයෙන් සැකසීම හා අවසානයේ පසු කථනයකට සහභාගි වීම. මෙය සමූහ ක්‍රියාකාරකමකි.

මෙම ක්‍රියාකාරකම මඟින්

ආරම්භක ශක්තිය
ඉදිරිපත් වීම
නායකත්වය
සන්නිවේදනය
සම්පත් කළමනාකරණය
කළමනාකරණ දැනුම් සංවර්ධනය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.



## ලාවා ක්‍රියාකාරකම - Lawa Activity

භූමියේ වෙන් කරන ලද කලාප තුනක් අතුරින් 1වන හා 3වන කලාපවල මැදිවූ දෙවන කලාපය ලාවා වලින් පිරී ඇති බවට උපකල්පනය කර ඒ ඒ කණ්ඩායමේ එක් එක් සාමාජිකයා හට ලබා දෙන 8"විෂ්කම්භය සහිත ලී රවුම් උපයෝගි කරගෙන කණ්ඩායමක් ලෙස ලබා දෙන නීති අනුගමනය කරමින් දෙන ලද කාල සීමාව ඇතුලත දී 1වන කලාපයේ සිට 2වන කලාපය හරහා 3වන කලාපය වෙත ගමන් කිරීම. ක්‍රියාකාරකම අවසානයේ සමූහ පසු කථනයකට සහභාගි වීම. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.



මෙම ක්‍රියාකාරකම මගින්

- සැලසුම්කරණය
- වැඩ බෙදාගැනීම
- නායකත්වය
- කාල කළමනාකරණය
- උපක්‍රම භාවිතය
- සමූහ චින්තනය දියුණු කිරීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## කොන්ෆිඩන්ස් බ්‍රිජ් - Conf idence Bridge

අඩි 15ක් පමණ උස් ස්ථාන දෙකක් යා කර ගුවනේ ස්ථානගත කර ඇති චලනය වන පාලමක් දිගේ ඉහළින් ඇති ආධාරක කඹය අල්ලාගෙන එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ගමන් කිරීම මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් වුව ද, තනි තනිව ක්‍රියාකාරකම සිදු කරයි.



මෙම ක්‍රියාකාරකම මගින්,

- ආත්ම විශ්වාසය
- උස් ස්ථාන වල යමක් කිරීම
- අවදානම් දැරීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ගිල් නෙට් - Gill Net

පොළොවේ සිට අඩි 40ක් පමණ උසින් රඳවා ඇති දැළක ඉහළටම නැග ආපසු බැසීම. මෙය තනි තනිව සිදුකරන ක්‍රියාකාරකමකි.



මෙම ක්‍රියාකාරකම මඟින්,

ආත්ම විශ්වාසය
විශ්වාසය
ආරක්ෂාව තහවුරුව
ස්වයං තීරණ ගැනීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ඩැන්ගල් ඩු - Dangle Doo

අඩි 7 ක් පමණ දිග වු ලී කොට ඉනිමගක ආකාරයට ලණු ආධාරයෙන් බැද ඇති අතර, ලී කොට අතර පරතරය සමාන නොවේ. යුගල වශයෙන් ඉහළට තරණය කර ආපසු බැසීම සිදු කරනු ලබයි.



මෙම ක්‍රියාකාරකම මඟින්

- අන්‍යෝන්‍ය අවබෝධය
- ආත්ම විශ්වාසය
- වැඩ බෙදා ගැනීම
- ආරක්ෂාව
- දරාගැනීමේ ශක්තිය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ක්‍රොස් රෝප් - Cross Rope

අඩි 15 ක පමණ පරතරය ඇති සිරස් දෙකක කතිරයක ආකාරයේ බඳින ලද ලණු දෙකක් මත එක් කෙළවරකට සිට අනෙක් කෙළවරට ගමන් කිරීම. මෙය කේවල ක්‍රියාකාරකමකි.



මෙම ක්‍රියාකාරකම මඟින්,

- ඉදිරිපත් වීම
- තීරණ ගැනීම
- ස්වයං පාලනය
- නම්‍යශීලි බව
- චිත්ත ධෛර්ය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ස්පයිඩර් නෙට් - Spider Net

අඩි 20x20 පමණ ප්‍රමාණයේ අවකාශයේ සිරස් අතට රදවා ඇති ලණුවලින් සාදා ඇති මකුළු දැලක ආකාරයේ විශාල ඇටවුමක එක් පසකින් නැඟ ඉහළට ගොස් අනෙක් පසින් බිමට බැසීම. මෙය කේවල ක්‍රියාකාරකමකි.



මෙම ක්‍රියාකාරකම මඟින්,

- ආත්ම විශ්වාසය
- නම්‍යශීලි බව
- දරාගැනීමේ හැකියාව
- විශ්වාසය
- ස්වයං තීරණ ගැනීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## සෙල්ෆ් මෝටිවේෂන් වෙබ් - Self-Motivation Web

අඩි 20x20 පමණ ප්‍රමාණයේ අවකාශයේ රඳවා ඇති ක්‍රියාකාරක මෙම කූඩා ආකෘතියකි. කණ්ඩායමේ එක් එක් පුහුණුවන්නන් හට එක් කොටුවක් බැගින් තෝරා ගෙන දැලේ එක් පැත්තක සිට අනෙක් පැත්තට දැළ හරහා ගමන් කිරීම සිදු කරනු ලබයි.



මෙම ක්‍රියාකාරකම මඟින්,

- කණ්ඩායම් හැඟීම
- කාල කළමනාකරණය
- සම්පත් කළමනාකරණය
- සැලසුම් කිරීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ඩබල් බැලන්සින් රෝප් - Double Balancing Rope

අඩි 15ක පමණ පරතරයක දුරක අඩි 5ක් පමණ ඉහළින් අඩි 3 ක පමණ පරතරයකින් රඳවා ඇති කඹ දෙකක් මත දෙදෙනෙකු නැගී සමබරව එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ගමන් කිරීම.



මෙම ක්‍රියාකාරකම මඟින්,

- විශ්වාසය
- ආත්ම විශ්වාසය
- සමබරතාවය
- අන්‍යෝන්‍ය අවබෝධය
- උස් ආධාරක මත ගමන් කිරීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ටාර්සන් රෝප් - Tarzan Rope

පොළවට අඩි 3ක් පමණ උස් වූ තලයක සිට ඉහළින් එල්ලෙන ආධාරක කඹයක් ආධාරයෙන් ඉදිරියේ ඇති සීමාකර ඇති ප්‍රදේශයට ගුවනින් පතිත වීම. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

මෙම ක්‍රියාකාරකම මඟින්,



- කණ්ඩායම් අවබෝධය
- ශක්තිය බෙදා ගැනීම
- සැලසුම් කිරීම
- මූලික කළමනාකරණ කුසලතා
- ආත්ම විශ්වාසය
- විශ්වාසය
- ඉවසීම
- දරා ගැනීමේ ශක්තිය
- ආරම්භක ශක්තිය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ස්ක්‍රැම්බල් ජම්පින් නෙට් - Scramble Jumping Net

අඩි 6 ක පමණ උස් ආධාරක ස්ථානයකට නැගී ගුවනේ ලෙළ දෙන කඹයක් ආධාරයෙන් අඩි 25ක් පමණ දුරින් සිරස්ව එල්ලා ඇති අඩි 15x15 ප්‍රමාණයක් ඇති අඩි 2x2 කොටු සහිත දැලකට පැන අල්ලා ගැනීම මෙහිදී සිදු කරනු ලබයි. මෙය තනි ක්‍රියාකාරකමකි.

මෙම ක්‍රියාකාරකම මඟින්,



- ආරම්භක ශක්තිය
- දරා ගැනීම
- අවදානම් දැරීම
- චිත්ත ධෛර්‍ය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ස්විංග් ලැඩර් ඇන්ඩ් බ්‍රිජ් - Swing Ladder & Bridge

ආනති ආකාරයෙන් බැද ඇති පැද්දෙන ලණු ඉනිමඟක අඩි 12ක් පමණ නැග තම උරහිස් මට්ටමේ පමණ රදවා ඇති ලණු දෙක ආධාරයෙන් අඩි 25ක් පමණ දුරට රදවා ඇති කඹයක් මත නැගී ගමන් කිරීම මෙහිදී සිදු කරනු ලබයි.



මෙම ක්‍රියාකාරකම මඟින්,

- සමබරතාවය
- නම්‍යශීලි බව
- දැරීමේ ශක්තිය
- අවධානම් කළමනාකරණය
- තීරණ ගැනීම
- චිත්ත ධෛර්යය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## විශ්වාසනීය ඇද වැටීම - Trust Fall

අඩි 6ක් පමණ ඉහළින් බැද ඇති අඩි 4x4 තලයක සිට පහළ සිටින තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ දෑත් වලින් සකසා ඇති තලය මතට පිටුපසට ඇද වැටීම මෙහිදී සිදු කරන අතර, මෙය කේවල ක්‍රියාකාරකමකි. මෙම ක්‍රියාකාරකම මඟින්



- ආරක්ෂාව
- අවදානම් දැරීම
- විශ්වාසය
- ආත්ම විශ්වාසය
- ස්වයං තීරණ ගැනීම
- දරා ගැනීම
- වැඩ බෙදා ගැනීම
- චිත්ත ධෛර්යය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ඒරියල් රෝප් - Arial Rope

අඩි 35ක් පමණ ඉහළින් ඇති අට්ටාලයකට නැගී එතැන් සිට ආනතව, පහළට අඩි 75ක් දුරට යා කර ඇති කේබල් දෙකක් මත යෙදු පුලි කට්ටලය ආධාරයෙන් පහළට ගමන් කිරීම මෙහිදී සිදු වෙයි. මෙය කේවල ක්‍රියාකාරකමකි.



- ආත්ම විශ්වාසය
- දරා ගැනීමේ ශක්තිය
- අවධානම් කළමනාකරණය
- විශ්වාසය
- නම්‍යශීලි බව
- චිත්ත ධෛර්ය

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## ෂටිල් රන් - Shuttle Run

කණ්ඩායමක එක් එක් සාමාජිකයා විවිධ දුර වලින් තබා ඇති බෝල 03න් පිළිවෙලට එක් කිරීම හා ආපසු තැබීම. කණ්ඩායම් ක්‍රියාකාරකමකි.

මෙම ක්‍රියාකාරකමක මඟින්

- වේගය
- කණ්ඩායම් හැඟීම
- සැලසුම් කිරීම
- දරා ගැනීම
- නායකත්වය
- නම්‍යශීලී බව

යන කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

## දැළ නැගීම හා අතුර - Net Climbing & TT'S Rope

අඩි 25 ක් පමණ වන කොටු දැළක නැගී අඩි 35 ක් පමණ වන දුරක් අතුරක ආකාරයෙන් කඹ පද්ධතියක ගමන් කිරීම.

මෙම ක්‍රියාකාරකම් මඟින්

- දරා ගැනීම
- චිත්ත ධෛර්ය
- සැලසුම් කිරීම
- අවදානය
- අවදානම් දැරීම
- කණ්ඩායම් හැගීම

යන කුසලතාවයන් වර්ධනය කිරීම
අපේක්ෂා කෙරේ.

## 2018 වර්ෂයේදී පාඨමාලාව සඳහා සහභාගීත්වය

### ජාතික යොවුන් සේනාංක පුහුණුලාභීන්

මෙම බැහැරගත පුහුණුව යොවුන් සේනාංක මූලික පුහුණු පාඨමාලාවේද එක් අංගයක් වන අතර ඒ අනුව 2018 වර්ෂයේ යොවුන් සේනාංක පුහුණුලාභීන් පහත දැක්වෙන පරිදි මෙම පුහුණුව සඳහා සහභාගි වී ඇත.

| පාඨමාලාව පැවැත්වූ අයවළුන් | කාලසීමාව | සහභාගීත්වය | | |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | එකතුව |
| 2017 පළමු අදියර පුහුණුලාභීන් | 2018.06.20 -2018.09.11 | 1095 | 1805 | 2900 |
| 2017 දෙවන අදියර පුහුණුලාභීන් | 2018.11.07- 2019.01.12 | 1260 | 854 | 2114 |
| **එකතුව** | | **2355** | **2659** | **5014** |

### බාහිර ආයතන සඳහා පාඨමාලාව පැවැත්වීම

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන විසින් කරන ලද ඉල්ලීම් අනුව පවත්නා කාල සීමාව හා ඉඩ පහසුකම් අනුව පහත සඳහන් ආයතන වෙත පාඨමාලාව පවත්වා ඇත.

| අනු අංකය | ආයතනයේ නම | කාලසීමාව | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | පොළොන්නරුව ළමා වැඩසටහන (ගැරන්ටි) ලිමිටඩ් | 2018.01.12 – 2018.01.13 | 63 |
| 2 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 2018.02.14 – 2018.02.15 | 60 |
| 3 | ලියෝ සමාජය | 2018.02.16 – 2018.02.18 | 123 |
| **එකතුව** | | | 246 |

# පවත්වන විවිධ වැඩසටහන්

## ප්‍රජා සත්කාරක වැඩසටහන්

පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුලාභීන්ගේ ශ්‍රම දායකත්වයෙන් මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පොදු මහජනතාවට ප්‍රයෝජනවත් වන කාර්යයක් ඉටු කරදීම මෙමගින් සිදු කරයි. උදාහරණ වශයෙන් ප්‍රදේශයේ රෝහල පිරිසිදු කිරීම, මාර්ග පිරිසිදු කිරීම, ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය දැක්විය හැක. මෙමඟින් පුහුණුලාභීන්ට පොදු වැඩ සඳහා උනන්දු කරවීම, පොදු ස්ථාන ආරක්ෂා කිරීමට පෙළඹවීම, තමාගෙන් සමාජයට විය යුතු යුතුකම් අවබෝධ කරදීම ආදී සමාජ සාරධර්ම ප්‍රායෝගිකව පුහුණු කිරීමක් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රජා සත්කාරක වැඩසටහන් මධ්‍යස්ථාන මට්ටමින් සිදු කරනු ලබන අතර සෑම මධ්‍යස්ථානයකම සෑම අදියරකම පුහුණුලාභීන් අවම වශයෙන් එක් වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

### 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සත්කාරක වැඩසටහන්



## 2018 පළමු අදියර පුහුණුලාභීන් විසින් සිදු කරන ලද වැඩසටහන්

| අනු අංකය | මධ්‍යස්ථානය | දිනය | සිදු කරනු ලැබූ කාර්ය |
|---|---|---|---|
| 1 | කටුනායක | 2018.07.24 | මීගමුව රෝහලේ වාට්ටුවක් පිරිසිදු කිරීම සහ ඇඳන් හා කබඩ් වල තීන්ත ආලේප කිරීම |
| 2 | බුලත්සිංහල | 2018.02.13 | බුලත්සිංහල රෝහල අවට පිරිසිදු කිරීම |
| 3 | ගම්පොළ | 2018.09.13 | ගම්පොළ මූලික රෝහල් භූමිය පිරිසිදු කිරීම |
| 4 | නාවුල | 2018.10.25 | නාවුල සති පොළ පිරිසිදු කිරීම |
| 5 | නුවරඑළිය | 2018.08.07 | මීපිළිමාන කන්දේ ඇල සිට අඹේවෙල දක්වා මාර්ගය පිරිසිදු කිරීම |
| 6 | හඟුරන්කෙත | 2018.07.03 | හඟුරන්කෙත වැව අවට පිරිසිදු කිරිම |
| 7 | වලපනේ | 2018.09.18 | වලපනේ රෝහල පිරිසිදු කිරීම |
| 8 | සෙංකඩගල | 2018.01.02 | ටිකිරි සෙවන රජයේ භාරගැනීමේ ළමා නිවාසයේ ශ්‍රමදානමය වැඩසටහනක් පැවැත්වීම |
| 9 | දික්වැල්ල | 2018.06.14 | වෙහරගොඩ පන්සල පිරිසිදු කිරීම |
| 10 | වාරියපොල | 2018.09.11 | සුමන්ගල පිරිවෙන අවට පිරිසිදු කිරීම |
| 11 | මාවතගම | 2018.09.03 | මාවතගම නගරයේ ඩෙංගු මර්දන ව්‍යාපාරය |
| 12 | පඩුවස්නුවර | 2018.07.05 | දෙමටව කන්ද පන්සල් භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම |
| 13 | දොඩම්ගස්ලන්ද | 2018.7.27 | දිවයින පුරා ගංවතුරෙන් පීඩාවට ලක්වූවන් සඳහා ආධාර එකතු කිරිමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම |
| 14 | නාත්තණ්ඩිය | 2018.09.11<br>2018.09.12 | යෝජිත යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ල අවට හා පිටිය අවට පිරිසිදු කිරිම |
| 15 | කැකිරාව | 2018.07.12 | කැකිරාව වැව අසල පිරිසිදු කිරීම |
| 16 | අනුරාධපුරය | 2018.06.08 | ඇදගල විහාරස්ථානය පිරිසිදු කිරීම |
| 17 | බණ්ඩාරවෙල | 2018.06.19 | දික්උල්පත පන්සල පිරිසිදු කිරිම |
| 18 | මහියංගනය | 2018.10.01 | පුහුණු මධ්‍යස්ථානය පිරිසිදු කිරීම හා තීන්ත ආලේප කිරීම |
| 19 | කතරගම | 2018.08.03 | කතරගම වැඩිහිටි කන්ද පිරිසිදු කිරීම |
| 20 | මොණරාගල | 2018.07.31 | කතරගම වැඩහිටි කන්ද පිරිසිදු කිරීම |
| 21 | ගලිගමුව | 2018.01.26 | බලපත්තාව සිට යොවුන් සේනාංකය දක්වා මාර්ගයේ කැලිකසළ ඉවත්කර මාර්ගය එළිපෙහෙළි කිරීම |
| 22 | කුච්චවේලි | 2018.02.01 | කුච්චවේලි වෙරළ තීරය සුද්ද පවිත්‍ර කිරීම |

## 2018 දෙවන අදියර පුහුණුලාභීන් විසින් සිදු කරන ලද වැඩසටහන්

| අනු අංකය | මධ්‍යස්ථානය | දිනය | සිදු කරනු ලැබූ කාර්ය |
|---|---|---|---|
| 1 | බුලත්සිංහල | 2018.11.16 | ඥනාලෝක පිරිවෙන හා රෝහල පිරිසිදු කිරීම |
| 2 | ගම්පොළ | 2018.12.26 | ගම්පොළ වක්කින්දාරාම විහාරස්ථාන පොදු සුසාන භූමිය පිරිසිදු කිරීම |
| 3 | නාවුල | 2018.12.07 | නාලන්ද රෝහල සුද්ද පවිත්‍ර කිරීම |
| 4 | නුවරඑළිය | 2018.12.21 | මීපිළිමාන කන්දේ ඇල සිට නුවරඑළිය පුහුණු මධ්‍යස්ථානය දක්වා මාර්ගය දෙපස පිරිසිදු කිරීම |
| 5 | හඟුරන්කෙත | 2018.12.27 | හගුරන්කෙත ප්‍රාදේශිය රෝහල අවට පිරිසිදු කිරිම |
| 6 | යටිනුවර | 2018.12.27 | පිලපිටිය මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම |
| 7 | සෙංකඩගල | 2018.08.24 | ඔගස්ටාවත්ත ප්‍රදේශයේ ශ්‍රී සුගතාරාම විහාරයේ අභිනවයෙන් ඉදිකරන ගොඩනැගිල්ල සඳහා ශ්‍රම දායකත්වය ලබාදීම |
| 8 | ගාල්ල | 2019.08.27 | දෙවට වෙරළ තීරය පිරිසිදු කිරිම |
| 9 | | 2019.10.21 | මධ්‍යස්ථානය අවට සහ පිවිසුම් මාර්ගය පිරිසිදු කිරිම |
| 10 | නෙළුව | 2018.12.24 | නෙළුව දූවිලි ඇල්ල අවට පිරිසිදු කිරීම |
| 11 | කුලියාපිටිය | 2018.08.30 | දියාවල කිතලව මාර්ගය පිරිසිදු කිරිම |
| 12 | වාරියපොල | 2019.01.01 | වාරියපොළ නගරයේ සිට මධ්‍යස්ථානය දක්වා මර්ගයේ ප්ලාස්ටික් හා පොලිතින් එක් රැස් කිරිම |
| 13 | මාවතගම | 2018.12.13 | මාවතගම රජයේ රෝහල් භූමිය පිරිසිදු කිරීම- |
| 14 | පඬුවස්නුවර | 2018.07.05 | නුගවෙල ආරාම භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම |
| 15 | දොඩම්ගස්ලන්ද | 2018.12.26 | මධ්‍යස්ථානය ඉදිරිපිට බස් නැවතුම්පළ පිළිසකර කිරිම |
| 16 | නාත්තණ්ඩිය | 2019.01.09 | සාගරගම පුරාණ විහාරස්ථානය ශුද්ධ පවිත්‍ර කිරිම |
| 17 | අනුරාධපුරය | 2018.11.07 | SOS ළමා ගම්මානය පිරිසිදු කිරීම |
| 18 | බණ්ඩාරවෙල | 2018.12.27 | බණ්ඩාරවෙල දිසා රෝහල පිරිසිදු කිරිම |
| 19 | මහියංගනය | 2018.12.28 | ඔසු උයන සැකසීම හා ඩෙංගු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම |
| 20 | කතරගම | 2018.09.14 | දෙබරවැව රෝහල පිරිසිදු කිරීම |
| 21 | ඇඹිලිපිටිය | 2018.12.28 | මධ්‍යස්ථානය අවට ශුද්ධ පවිත්‍ර කිරීම |
| 22 | කෑගල්ල | 2018.11.15 | දියවැඩියා පාගමනක් පැවැත්වීම |
| 23 | කුච්චවේලි | 2018.07.20 | කුච්චවේලි ප්‍රාදේශිය රෝහල සුද්ද පවිත්‍ර කිරීම |

## ශිෂ්‍ය නායක පුහුණු වැඩමුළු පැවැත්වීම

විදුහල්පතිවරුන් විසින් තම පාසලේ ශිෂ්‍ය නායකයින් සඳහා නායකත්ව ගුණාංග හා හැකියාවන් වර්ධනය කර ගැනීමට අදාළ පුහුණුවක් ලබා දෙන ලෙස කරන ඉල්ලීම් අනුව යොවුන් සේනාංකය විසින් ශිෂ්‍ය නායක පුහුණු වැඩමුළු පවත්වන අතර මෙම පුහුණු වැඩමුළු ජාතික යොවුන් සේනාංක මූලස්ථානයේ නිලධාරීන් මෙන්ම පුහුණු මධ්‍යස්ථානයන්හි උපදේශක මහත්ම/මහත්මීන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වනු ලබයි.

මෙම පුහුණු වැඩමුළු මඟින් පාසල් ශිෂ්‍ය නායකයින්ට සාර්ථකව ශිෂ්‍ය නායකයකු ලෙස තම කටයුතු කර ගැනීමට අවශ්‍ය දැනුම හා නායකත්ව ගුණාංග වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය දැනුම දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ලබා දීම සිදු කරයි.

### 2018 වර්ෂයේදී පවත්වනු ලැබූ ශිෂ්‍ය නායක පුහුණු වැඩමුළු

| අනු අංකය | පාසල | පවත්වනු ලැබූ දිනය | ළමුන් ගණන | සම්පත් දායකත්වය ලබා දුන් මධ්‍යස්ථානය | දැරූ වියදම |
|---|---|---|---|---|---|
| 1 | මා/වීරපරාක්‍රම ද්විතීයික පාසල යටවත්ත | 2018.06.14 | 54 | දොඩම්ගස්ලන්ද | - |
| 2 | බප/ගම් රන්පොකුණගම මහා විද්‍යාලය | 2018.05.18 | 73 | අත්තනගල්ල | - |
| 3 | බප/ගම් වේයන්ගොඩ ප්‍රාථමික විද්‍යාලය | 2018.05.16 | 100 | | |
| 4 | ර/ පනාවැන්න ධර්මාරාම විද්‍යාලය | 2018.05.15 | 75 | නිවිතිගල | - |
| 5 | ව/ඉ/රිදී/බුලුවල මහා විද්‍යාලය | 2018.07.03 | 35 | මාවතගම | - |
| 6 | මො/ සෝමාදේවී මහා විද්‍යාලය | 2018.06.23-24 | 39 | සූරියවැව | - |
| 7 | රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල | 2018.09.04 | 433 | ගාල්ල | - |
| 8 | කෑගල්ල වළගම්බා විද්‍යාලය | 2018.10.16 | 87 | කෑගල්ල | - |
| 9 | වැපස්සාවල සිරිනිවාස විද්‍යාලය | 2018.11.02 | 48 | බණ්ඩාරවෙල | - |
| 10 | දෙහිගොල්ල මහා විද්‍යාලය | 2018.09.14 | 75 | මහියංගනය | - |
| | ඩී.එස්. සේනානායක ජාතික පාසල | 2018.10.01 | 60 | | |
| | ගිරාදුරුකෝට්ටේ ද්විතියික පාසල | 2018.10.18 | 150 | | |
| එකතුව | | | **1229** | | - |



# වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

# 2018

# ජාතික යොවුන් සේනාංකය - මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට

(මූල්‍ය ඒකකය රුපියල්)

| විස්තරය | සටහන් | 2018 | 2017 (සංශෝධිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | 144,165,892 | 42,029,024 |
| තොගය | 01 | 99,642,420 | 111,519,120 |
| ලැබිය යුතු අත්තිකාරම් | 02 | 328,517,678 | 481,587,985 |
| වෙනත් ලැබිය යුතු ලැබීම් | 03 | 12,409,171 | 8,066,992 |
| | | **584,735,159** | **643,203,120** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **නොනිමි වැඩ** | 04 | 1,694,222,933 | 1,119,415,300 |
| **දේපල පිරියත හා උපකරණ** | 05 | | |
| ඉඩම්,ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | | 348,002,522 | 239,024,657 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | | 23,097,090 | 31,194,537 |
| ලීබඩු සහ සවිකිරීම් | | 171,236,863 | 185,751,412 |
| මෝටර් වාහන | | 24,564,973 | 39,033,144 |
| පුහුණු උපකරණ | | 12,197,211 | 18,354,616 |
| සංගීත හා ක්‍රීඩා උපකරණ | | 3,377,237 | 5,585,597 |
| පරිගණක හා උපාංග | | 100,137,211 | 143,669,912 |
| කාර්යාලීය උපකරණ | | 8,420,549 | 10,267,615 |
| විදුලි උපකරණ | | 4,984,380 | 9,331,192 |
| | | **2,390,240,968** | **1,801,627,982** |
| **මුළු වත්කම්** | | **2,974,976,128** | **2,444,831,102** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙනත් ගෙවිය යුතු වියදම් | 06 | 52,745,383 | 16,082,236 |
| උපචිත වියදම් | 07 | 71,669,671 | 80,804,249 |
| | | **124,415,054** | **96,886,484** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් | 08 | 2,507,877,137 | 2,073,161,167 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 09 | 24,296,945 | 17,546,536 |
| | | **2,532,174,082** | **2,090,707,703** |
| **මුළු වගකීම්** | | **2,656,589,135** | **2,187,594,187** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **318,386,992** | **257,236,915** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල | | 244,661,387 | 317,307,199 |
| පරිත්‍යාග අරමුදල | 10 | 17,632,183 | 13,000,000 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය(ඌණතාවය) | | 56,093,422 | (73,070,284) |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | **318,386,992** | **257,236,915** |

අධ්‍යක්ෂ

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව ජාතික යොවුන් සේනාංක සභාව වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති
ජාතික යොවුන් සේනාංකය

සාමාජික
ජාතික යොවුන් සේනාංකය

# ජාතික යොවුන් සේනාංකය - මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

*2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

(මුල්‍ය ඒකකය රුපියල්)

| විස්තරය | සටහන් | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාර** | | | |
| භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන | 11 | 811,776,042 | 871,546,598 |
| වෙනත් අයභාර | 12 | 1,333,499 | 3,311,863 |
| විලම්බිත ආදායම් වලින් මාරු කිරීම් | | 129,411,891 | 121,127,960 |
| **මුළු අයභාරය** | | **942,521,432** | **995,986,420** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල දීමනා | 13 | 386,141,910 | 357,210,907 |
| සැපයීම් | 14 | 38,177,795 | 70,699,490 |
| සේවා | 15 | 105,061,055 | 113,540,319 |
| නඩත්තු වියදම් | 16 | 19,415,573 | 14,044,589 |
| ප්‍රවාහන ගාස්තු හා ගමන් වියදම් | 17 | 26,399,458 | 17,552,737 |
| වෙනත් පරිපාලන වියදම් | 18 | 2,694,720 | 7,257,481 |
| ක්ෂය වීම් | 19 | 129,411,891 | 121,127,960 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 20 | 5,579,564 | 7,559,043 |
| තොග බැහැරකිරීම් පිරිවැය | | - | 1,886,503 |
| | | **712,881,968** | **710,879,029** |
| **තරුණ සංවර්ධන වියදම්** | | | |
| පුහුණුලාභී දීමනා | 21 | 122,803,142 | 298,075,948 |
| තරුණ සංවර්ධන වැඩසටහන් | 22 | 24,524,705 | 28,450,970 |
| තරුණයින් පුහුණු කිරීම් වැඩසටහන් | 23 | 9,578,917 | 19,980,223 |
| පුහුණුලාභීන් බඳවා ගැනීම් හා ප්‍රචාරණ | 24 | 16,639,277 | 11,670,535 |
| | | **173,546,041** | **358,177,676** |
| **මුළු වියදම** | | **886,428,010** | **1,069,056,704** |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය(ඌණතාවය)** | | **56,093,422** | **(73,070,284)** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(මූල්‍ය ඒකකය රුපියල්)

| විස්තරය | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| අතිරික්තය/( ඌණතාවය) | | 56,093,422 | (68,469,997) |
| **මුදල් නොවන වෙනස්වීම්** | | | |
| ක්ෂයවීම් | | 129,411,891 | 121,179,263 |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 7,923,176 | 5,223,478 |
| ක්‍රමක්ෂය - විලම්භිත ආදායම් | | (129,411,891) | (121,179,263) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ඇතිවන පාඩු | | (23,370) | 3,225,966 |
| | | 63,993,228 | (60,020,554) |
| උපචිත වියදම්හි වැඩිවීම/(අඩුවීම) | | (9,134,578) | (139,252,356) |
| වෙනත් ගෙවිය යුතු වියදම්හි වැඩිවීම/(අඩුවීම) | | 36,663,147 | 925,124 |
| වෙනත් ලැබිය යුතු ලැබීම් හි (වැඩිවීම)/අඩුවීම | | 148,728,128 | (294,418,446) |
| නොනිමි වැඩ (වැඩිවීම)/අඩුවීම | | (574,807,633) | (943,616,649) |
| තොගයේ (වැඩිවීම)/අඩුවීම | | 11,876,700 | 10,140,013 |
| පාරිතෝෂික ගෙවීම් | | (1,172,767) | (819,926) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(323,853,773)** | **(1,427,062,794)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම් | | (13,968,194) | (213,227,080) |
| ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් | | (128,838,325) | (121,269,140) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම් | | 37,116 | 449,039 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(142,769,403)** | **(334,047,181)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| භාණ්ඩාගාරයෙන් මූලධන අරමුදල් ලැබීම් | | 564,127,861 | 1,754,611,095 |
| මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබූ පරිත්‍යාග | | 4,632,183 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **568,760,044** | **1,754,611,095** |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 102,136,868 | (6,498,880) |
| කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 42,029,024 | 48,527,904 |
| **කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **144,165,892** | **42,029,024** |
| **කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **144,165,892** | **42,029,024** |

# ජාතික යොවුන් සේනාංකය - ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(මූල්‍ය ඒකකය රුපියල්)

| | සම්චිත අරමුදල | විලම්බිත ආදායම් | පරිත්‍යාග අරමුදල | සමුච්චිත අතිරික්තය/ (ඌණතාවය) | එකතුව |
|---|---|---|---|---|---|
| **ආරම්භක ශේෂය 01.01.2017 දිනට** | 283,759,521 | 439,678,032 | 13,000,000 | 33,547,677 | 769,985,231 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය(ඌණතාවය) | | | | (68,469,997) | (68,469,997) |
| මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබූ ආධාර | | - | | | - |
| භාණ්ඩාගාරයේ මූලධන අරමුදල් | | 1,754,611,095 | | | 1,754,611,095 |
| | 283,759,521 | 2,194,289,127 | 13,000,000 | (34,922,320) | 2,456,126,328 |
| අඩු කිරීම | | | | | |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මාරු කිරීම | | (121,179,263) | | | (121,179,263) |
| **අවසන් ශේෂය 2017.12.31 දිනට** | **283,759,521** | **2,073,109,864** | **13,000,000** | **(34,922,320)** | **2,334,947,066** |
| ආරම්භක ගැලපීම් | | 51,303 | | (4,600,287) | (4,548,984) |
| **ගැලපුම් පසු ආරම්භක ශේෂය 2018.01.01 දිනට** | **283,759,521** | **2,073,161,167** | **13,000,000** | **(39,522,606)** | **2,330,398,082** |
| ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීම 2018 | | (2,072,139) | | 424,472 | (1,647,667) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය(ඌණතාවය) | | | | 56,093,422 | 56,093,422 |
| භාණ්ඩාගාරයේ මූලධන අරමුදල් | | 566,200,000 | 4,632,183 | | 570,832,183 |
| | 283,759,521 | 2,637,289,028 | 17,632,183 | 16,995,288 | 2,955,676,020 |
| අඩු කිරීම | | | | | |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මාරු කිරීම | | (129,411,891) | | | (129,411,891) |
| **අවසන් ශේෂය 2018.12.31 දිනට** | **283,759,521** | **2,507,877,136** | **17,632,183** | **16,995,288** | **2,826,264,128** |

**සටහන් - 01 තොගය**

(මූල්‍ය ඒකකය රුපියල්)

| තොග කාණ්ඩ | ශේෂය 2018.01.01 දිනට | පෙර වර්ෂ ගැලපීම් | පෙර වර්ෂ ගැලපීමෙන් පසු ශේෂය 2017.01.01 | බැහැර කිරීම් | ඌණතා අයකර ගැනීම් | ලියාහල පිරිවැය | මිලදී ගැනීම් | භාවිතා කිරීම් | අවසන් ශේෂය 2018.12.31 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලිපිද්‍රව්‍ය | 4,233,878 | (288,764) | 3,945,114 | | | 167,845 | 5,457,681 | 7,138,842 | **2,096,107** |
| නිළ ඇඳුම් | 23,357,753 | | 23,357,753 | | | | 3,078,685 | 13,888,735 | **12,547,702** |
| විසිරයාමේ නිළ ඇඳුම් | 70,842,753 | | 70,842,753 | | 8,814 | | | 428,425 | **70,405,514** |
| නිදන මලු හා ඇඳ ඇතිරිලි | 5,130,200 | (2,700) | 5,127,500 | | | | | | **5,127,500** |
| විදුලි උපාංග හා වෙනත් උපකරණ | 74,477 | 6,372 | 80,849 | | | | 19,690 | 18,536 | **82,003** |
| පුහුණු ද්‍රව්‍ය | 1,086,345 | (1,075,079) | 11,266 | | | | 937,500 | 893,825 | **54,941** |
| බිලැන්කට් | 98,000 | | 98,000 | | | | | | **98,000** |
| පුහුණු පොත් කට්ටල | 7,631,815 | (2,349,373) | 5,282,442 | | | | | 1,024,594 | **4,257,848** |
| අත් ආවරණ | 109,472 | (99,114) | 10,358 | | | | | | **10,358** |
| බැනියම් | 1,832,821 | (1,484,054) | 348,767 | | | | | | **348,767** |
| වෙනත් නිළ ඇඳුම් | 270,475 | | 270,475 | | | | | 1,600 | **268,875** |
| ක්‍රීඩා උපකරණ | 2,045,109 | | 2,045,109 | | | | 1,525,460 | 14,070 | **3,556,499** |
| මදුරු දැල් | 41,600 | | 41,600 | | | | | 36,920 | **4,680** |
| කොට්ට සහ කොට්ට උර | | 54,435 | 54,435 | | | | 675,750 | 559,130 | **171,055** |
| ග්‍රවුන්ඩ් සීට් සහ ඕවර්ෂීල් | | | - | | | | 86,919 | | **86,919** |
| ඇඳ අතිරිලි | | 2,700 | 2,700 | | | | 2,544,900 | 2,021,948 | **525,652** |
| එකතුව | **116,754,697** | **(5,235,577)** | **111,519,120** | **-** | **8,814** | **167,845** | **14,326,585** | **26,026,626** | **99,642,420** |

සටහන් - 02 ලැබිය යුතු අත්තිකාරම් (මුල්‍ය ඒකකය රුපියල්)

| සැපයුම්කරුගේ නම | අත්තිකාරම් ගෙවීම් | අත්තිකාරම් පියවීම් | ලැබියයුතු අත්තිකාරම් 2018.12.31 දිනට | ලැබියයුතු අත්තිකාරම් 2017.12.31 දිනට සංශෝධිත |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අත්තිකාරම්** | | | | |
| ආදම්බාවා ඇන්ඩ් සන්ස් | | 7,839,878 | - | 7,839,878 |
| ඩී.කේ.එස්.බිල්ඩර්ස් | | 17,424,749 | 49,034,418 | 66,459,167 |
| ෆාම් හිල් කන්ස්ට්‍රක්ෂන් ගම්පොල | | 613,857 | 4,325,023 | 4,938,880 |
| ෆර්ෂාන් බිල්ඩින් කන්ෂ්ට්‍රක්ෂන් | | 1,511,749 | 21,255,581 | 22,767,330 |
| ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | 6,032,071 | 57,755,607 | 115,905,951 | 167,629,487 |
| සුහද එන්ටර්ප්‍රයිසස් | | 14,589,766 | 7,766,227 | 22,355,992 |
| යූ.එස්.එස්.ඉංජිනියරින් පුද්ගලික සමාගම | | - | 1,701,147 | 1,701,147 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -නුවරඑළිය | | - | 176,745 | 176,745 |
| ඇන්තනි බිල්ඩර්ස් | | 14,767,952 | - | 14,767,952 |
| අස්සලආරච්චි කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම | | 7,945,806 | 9,256,143 | 17,201,950 |
| සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විස් (පුද්ගලික) සමාගම | | 23,456,091 | 23,367,148 | 46,823,239 |
| සියෝකා ඉංජිනියරින් (පුද්ගලික) සමාගම | | 2,711,112 | 34,591,577 | 37,302,689 |
| හින්වේ ලංකා (පුද්ගලික) සමාගම | | 6,560,643 | 11,606,946 | 18,167,588 |
| කේ.එස්. කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් | | 2,926,233 | 31,688,229 | 34,614,463 |
| රන්වැලි කන්ස්ට්‍රක්ෂන් | | 662,686 | 16,650,543 | 17,313,228 |
| | 6,032,071 | 158,766,128 | 327,325,678 | 480,059,735 |
| **කුලී අත්තිකාරම්** | | | | |
| එස්.පී.පී. ගල්ගමුව මහතා | 150,000 | 50,000 | 150,000 | 50,000 |
| කේ.එම්.ශහීර් මහතා | 900,000 | 300,000 | 600,000 | - |
| යූ.කේ.ඒ. ලෙබ්බෙ මහතා | 700,000 | 650,000 | 350,000 | 300,000 |
| යූ.කේ.එම්. ස්මයිල් මහතා | | 40,000 | - | 40,000 |
| ඒ.එස්. ෂලාබ්දීන් මහතා | | 10,500 | - | 10,500 |
| ඒ.එම්. ආසුධීන් මහතා | 36,000 | 31,500 | 27,000 | 22,500 |
| ටී. මානවඩු මහතා | | 137,500 | - | 137,500 |
| ජේ.වී.වී. නලින්ද මහතා | | 36,000 | - | 36,000 |
| එම්. තනිකාසලාම් මහතා | 60,000 | 55,000 | 15,000 | 10,000 |
| එස්.සත්‍යාබාමා මහතා | | 40,000 | - | 40,000 |
| නේවාසික ව්‍යාපාර කළමනාකරු - දෙහිඅත්තකණ්ඩිය | | 7,500 | - | 7,500 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | | 824,250 | 50,000 | 874,250 |
| | 1,846,000 | 2,182,250 | 1,192,000 | 1,528,250 |
| | **7,878,071** | **160,948,378** | **328,517,678** | **481,587,985** |

**සටහන් - 03 වෙනත් ලැබිය යුතු ලැබීම්** (මුල්‍ය ඒකකය රුපියල්)

| | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|
| වෙන්දේසියෙන් ලැබිය යුතු | - | - |
| ලැබිය යුතු විදුලි හා ජල බිල්පත් | 463,223 | 86,312 |
| කුඩා ව්‍යාපාර අංශය සඳහා උපයෝජිත බිල්පත් ගෙවීම් | 8,815,375 | 6,580,871 |
| තත්කාර්යය අත්තිකාරම් | 7,217 | 345,000 |
| විශේෂ ආපදා ණය | 189,333 | 302,933 |
| GREEN & CLEAN වැඩසටහන | - | 751,876 |
| ලැබිය යුතු අමාත්‍යාංශ රඳවාගැනීම් | 2,934,023 | - |
| | **12,409,171** | 8,066,992 |

**සටහන් - 04 නොනිමි වැඩ**

| | | |
|---|---|---|
| නොනිමි වැඩ - ගොඩනැගිලි | 1,694,222,933 | 1,119,415,300 |

සටහන් - 05 දේපල පිරියත හා උපකරණ

(මූල්‍ය ඒකකය රුපියල්)

| දේපල පිරියත හා උපකරණ | ඉඩම් | ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | මෝටර් වාහන | ලීබඩු සහ සවිකිරීම් | සංගීත හා ක්‍රීඩා භාණ්ඩ | කාර්යාල උපකරණ | විදුලි උපකරණ | පරිගණක හා උපාංග | යන්ත්‍ර සූත්‍ර | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| <u>පිරිවැය</u> | | | | | | | | | | | |
| ශේෂය 2018.01.01 | - | 268,563,783 | 76,177,345 | 230,460,137 | 11,242,311 | 17,472,305 | 15,678,048 | 218,539,984 | 46,259,423 | 38,155,884 | 922,549,219 |
| පෙර වර්ෂ ගැලපීම් | | | | | | | | | | | |
| එකතු කිරීම් | - | | | | | | | | | | - |
| අඩු කිරීම් | - | - | - | - | 200,514 | 40,475 | - | - | 15,525 | - | 256,514 |
| ගලපන ලද ශේෂය 2018.01.01 | - | 268,563,783 | 76,177,345 | 230,460,137 | 11,041,797 | 17,431,830 | 15,678,048 | 218,539,984 | 46,243,898 | 38,155,884 | 922,292,705 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 128,934,770 | 959,122 | 9,491,006 | - | 2,049,224 | 41,600 | 219,681 | 1,439,166 | 1,842,531 | 144,977,101 |
| පරිත්‍යාග | | | | | | | | | | | - |
| බැහැරකිරීම් | - | - | - | 17,400 | - | 400 | - | 2,250 | - | 1,265 | 21,315 |
| වර්ෂය තුළ නිවැරදි කිරීම් | | 96,445 | - | - | - | - | 2,074,137 | - | - | - | 2,170,582 |
| **ශේෂය 2018.12.31 දිනට** | **-** | **397,402,108** | **77,136,467** | **239,933,742** | **11,041,797** | **19,480,654** | **13,645,511** | **218,757,415** | **47,683,064** | **39,997,150** | **1,065,077,909** |
| <u>ක්ෂයකිරීම්</u> | | | | | | | | | | | |
| ශේෂය 2018.01.01 | - | 29,539,126 | 37,144,201 | 44,708,725 | 5,496,303 | 7,172,310 | 6,346,856 | 74,870,071 | 15,052,466 | 19,801,268 | 240,131,326 |
| පෙර වර්ෂ ගැලපීම් | | | | | | | | | | | |
| එකතු කිරීම් | - | | | | | | | | | | - |
| අඩු කිරීම් | - | - | - | - | 40,102.80 | 8,095.00 | - | - | 3,105.00 | - | 51,303 |
| ගලපන ලද ශේෂය 2018.01.01 | - | 29,539,126 | 37,144,201 | 44,708,725 | 5,456,200 | 7,164,215 | 6,346,856 | 74,870,071 | 15,049,361 | 19,801,268 | 240,080,023 |
| වර්ෂය තුළ ක්ෂය කිරීම් | - | 19,870,105 | 15,427,293 | 23,993,374 | 2,208,359 | 3,896,131 | 2,729,102 | 43,751,483 | 9,536,613 | 7,999,430 | 129,411,891 |
| බැහැර කිරීම් | - | - | - | 5,220 | - | 240 | - | 1,350 | - | 759 | 7,569 |
| වර්ෂය තුළ නිවැරදි කිරීම් | | 9,644 | | | | | 414,827 | | | | 424,472 |
| **ශේෂය 2018.12.31 දිනට** | **-** | **49,399,587** | **52,571,495** | **68,696,880** | **7,664,559** | **11,060,105** | **8,661,131** | **118,620,204** | **24,585,974** | **27,799,939** | **369,059,874** |
| | | | | | | | | | | | |
| ලියා හල අගය **2018.12.31**දිනට | - | **348,002,522** | **24,564,973** | **171,236,863** | **3,377,237** | **8,420,549** | **4,984,380** | **100,137,211** | **23,097,090** | **12,197,211** | **696,018,036** |

## සටහන් - 06 වෙනත් ගෙවිය යුතු වියදම්

(මූල්‍ය ඒකකය රුපියල්)

| විස්තරය | ආරම්භක ශේෂය 2018.01.01 | ආරම්භක ගැලපීම් | ගලපන ලද ආරම්භ ශේෂය 2018.01.01 | ලැබීම් | ගෙවීම් | අවසන් ශේෂය 2018.12.31 |
|---|---|---|---|---|---|---|
| පරිත්‍යාග | 47,398 | | 47,398 | | | 47,398 |
| ලංසු ඇපකර | 131,500 | | 131,500 | | | 131,500 |
| රක්ෂණ | - | | - | 422,205 | 419,705 | 2,500 |
| උපයන විට ගෙවීම් | 16,800 | | 16,800 | 39,600 | 54,600 | 1,800 |
| බැහැරගත පුහුණු ගෙවීම් | 1,723,130 | - | 1,723,130 | 635,000 | 535,186 | 1,822,944 |
| වෙනත් | 121,180 | | 121,180 | - | 11,480 | 109,700 |
| රඳවාගැනීම් | 14,010,278 | | 14,010,278 | 59,815,268 | 24,524,765 | 49,300,781 |
| මුද්දර ගාස්තු | 6,950 | | 6,950 | 18,200 | 18,950 | 6,200 |
| TVET | 25,000 | | 25,000 | | 25,000 | - |
| රඳවා ගැනීම් බදු | | | | 4,976,124 | 3,653,564 | 1,322,560 |
| **එකතුව** | **16,082,236** | **-** | **16,082,236** | **65,906,398** | **29,243,250** | **52,745,383** |

-

(මූල්‍ය ඒකකය රුපියල්)

| සටහන් - 07 උපචිත වියදම් | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|
| ප්‍රචාරණ | 861,925 | - |
| ජල හා විදුලි බිල්පත් | 1,842,963 | 1,400,087 |
| ඉන්ධන | 330,612 | 266,444 |
| සනීපාරක්ෂක සේවා | 1,460,914 | 1,363,548 |
| කලා උළෙල වියදම් | - | 13,800 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම් | 284,212 | 31,170 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම් | 2,387,651 | 30,400 |
| වාහන නඩත්තු කිරීම් | 948,137 | 181,570 |
| ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ඇගයීම් කිරීම් | 11,726 | 86,500 |
| වෙනත් ගෙවිය යුතු වියදම් | 34,405 | 603,371 |
| දෙමාපිය දින වියදම් | 467,496 | 10,700 |
| නිළ ඇඳුම් මිලදී ගැනීම් සඳහා ගෙවීම් | - | 404,080 |
| වාහන අළුත්වැඩියා වියදම් | 916,312 | - |
| දැනුම මිනුම වැඩසටහන වියදම් | - | 28,829 |
| බඳවා ගැනීම් වියදම් | 2,477,869 | - |
| ප්‍රවාහන ගෙවීම් | 1,086,454 | 2,286,792 |
| බැහැරගත පුහුණු වියදම් | 422,920 | 1,038,528 |
| පුහුණුලාභී දීමනා | 3,313,315 | 10,725,530 |
| වෘත්තීය පුහුණු දීමනා | 496,600 | 3,752,675 |
| අතිකාල දීමනා | 540,273 | 8,181 |
| කුඩා ව්‍යාපාර අංශය සඳහා උපයෝජිත බිල්පත් ගෙවීම් | 151,658 | 163,565 |
| රක්ෂණ වියදම් | 165,973 | - |
| සංග්‍රහ වියදම් | 2,360 | - |
| ලීබඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම් | 3,606,960 | 3,923,566 |
| පුහුණු උපකරණ මිලද ගැනීම් | 620,814 | 10,274,128 |
| පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම් | - | 3,127,664 |
| ගොඩනැගිලි හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් | 30,265,582 | - |
| පුද්ගල ධාරිතා ගොඩනැගීම් | - | - |
| ගමන් වියදම් දේශීය | 637,692 | 156,034 |
| පුහුණුලාභී ආහාර දීමනා | 6,296,877 | 11,529,549 |
| නායකත්ව වර්ධන වියදම් | - | 12,825 |
| තැපැල් හා සන්නිවේදන වියදම් | 604,687 | 554,371 |
| කුලී හා දේශීය බදු | 254,850 | 1,633,425 |
| වැටුප් හා දීමනා | 121,988 | 176,045 |
| ආරක්ෂක ගාස්තු | 4,134,814 | 3,571,964 |
| සෞඛ්‍ය වැඩසටහන (මත්ද්‍රව්‍ය) | 3,000 | - |
| ලිපිද්‍රව්‍ය | 27,078 | 1,874,385 |
| සුහද හමුව වඩසටහන සඳහා වූ වියදම් | 11,100 | 90,000 |
| ක්‍රීඩා උළෙල සඳහා වූ වියදම් | 483,898 | 177,319 |
| වැටුප් හා වේතන | 1,207,842 | 1,734,454 |
| සේවක අර්ථසාධක අරමුදල | 136,957 | 192,975 |
| සේවක භාරකාර අරමුදල | 34,238 | 48,243 |
| රාත්‍රී රාජකාරි දීමනා | 1,437,000 | 1,644,000 |
| වාහන මිලදී ගැනීම් | - | 17,550,000 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම | 1,629,219 | 13,920 |
| විවෘත ආර්ථික සංවත්සරය | - | 63,600 |
| පුහුණු උපකරණ මිලදී ගැනීම | 1,951,301 | 60,012 |
| | **71,669,671** | **80,804,249** |

**සටහන් - 08 විලම්බිත ආදායම්**

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය 2018.01.01 | 2,073,161,167 | 439,678,033 |
| භාණ්ඩාගාර මූලධන අධාර | 566,200,000 | 1,754,611,095 |
| මූලධන අධාර ඒකාබද්ධ අරමුදලට බැර කිරීම් | (2,072,139.00) | - |
| | 2,637,289,028 | 2,194,289,127.11 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මාරු කිරීම් | (129,411,891) | (121,127,960) |
| අවසාන ශේෂය 2018.12.31 | **2,507,877,137** | **2,073,161,167** |

**සටහන් - 09 පාරිතෝෂික වෙන් කිරීම්**

| | | |
|---|---|---|
| පාරිතෝෂික වෙන්කිරීම් 2018.01.01 | 17,546,536 | 13,142,984 |
| පාරිතෝෂික වෙන්කිරීම්හි නිවැරදි කිරීම් | - | - |
| වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් | 7,923,176 | 5,223,478 |
| වර්ෂය තුළ පාරිතෝෂික දීමනා ගෙවීම් | (1,172,767) | (819,926) |
| පාරිතෝෂික වෙන්කිරීම් 2018.12.31 | **24,296,945** | **17,546,536** |

**සටහන් - 10 පරිත්‍යාග අරමුදල**

| | | |
|---|---|---|
| මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබූ පරිත්‍යාග | 17,632,183 | 13,000,000 |
| | **17,632,183** | **13,000,000** |

(මූල්‍ය ඒකකය රුපියල්)

| සටහන් | | | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|---|---|
| **සටහන්-11** | **පුනරාවර්ථන අරමුදල්** | | | |
| | පුනරාවර්ථන ප්‍රදාන | | 811,776,042 | 619,300,000 |
| | පුනරාවර්ථන අක්මුදල් - අයවැය යෝජනා | | - | 252,246,598 |
| | | | **811,776,042** | **871,546,598** |
| **සටහන් -12** | **වෙනත් අයභාර** | | | |
| | ටෙන්ඩර් ගාස්තු | | 432,500.00 | 2,253,000 |
| | වෙනත් | | 98,416 | 234,220 |
| | අත්තිකාරම් දඩ මුදල් | | 11,800 | 32,970 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම් ගාස්තු | | 448,000 | 526,000 |
| | කුලී ආදායම් | | 112,500 | 260,247 |
| | තැන්පත් ලෙස හඳුනාගත් ආදායම් | | 158,966 | 4,844 |
| | ඌණතා අයකරගැනීම් | | 1,024 | 582 |
| | ප්‍රමාද ගාස්තු | | 70,293 | - |
| | | | **1,333,499** | **3,311,863** |
| **සටහන් -13** | **පුද්ගල දීමනා** | | | |
| | වැටුප් හා වේතන | | 213,720,516 | 187,162,414 |
| | අතිකාල හා නිඩාවු දින වැටුප් | | 2,531,902 | 2,148,275 |
| | කාර්ය මණ්ඩල දිමනා | | 115,891,422 | 125,559,822 |
| | සේවා නියුක්ත අරමුදල් | | 8,231,465 | 6,716,884 |
| | සේවක භාරකාර අරමුදල් | | 32,959,680 | 26,876,085 |
| | පාරිතෝෂික දීමනා | | 7,985,176 | 5,305,678 |
| | රාත්‍රී රාජකාරි දීමනා | | 4,821,750 | 3,441,750 |
| | | | **386,141,910** | **357,210,907** |
| **සටහන් -14** | **සැපයීම්** | | | |
| | ඉන්ධන | | 7,623,186 | 6,986,159 |
| | ලිපිද්‍රව්‍ය | | 7,892,449 | 8,077,906 |
| | නිළ ඇඳුම් | | 14,387,939 | 50,663,186 |
| | පුහුණු ද්‍රව්‍ය | | 4,478,446 | 4,377,284 |
| | වෙනත් සැපයුම් | | 2,810,707 | 594,955 |
| | සහතික පත්‍ර | | 985,068 | - |
| | | | **38,177,795** | **70,699,490** |
| **සටහන් -15** | **සේවා** | | | |
| | තැපැල් හා සංනිවේදන | | 7,694,180 | 8,345,259 |
| | ජල හා විදුලි බිල්පත් | | 20,929,667 | 24,439,059 |
| | කුලී හා දේශීය බදු | | 8,790,643 | 14,614,203 |
| | සනීපාරක්ෂක සේවා. | | 16,051,806 | 17,021,503 |
| | ආරක්ෂක සේවා | | 47,012,122 | 43,446,062 |
| | රක්ෂණ | | 2,844,700 | 4,057,045 |
| | විගණන ගාස්තු | | 1,737,938 | 1,617,187 |
| | | | **105,061,055** | **113,540,319** |

(මූල්‍ය ඒකකය රුපියල්)

| සටහන් | | | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|---|---|
| **සටහන් -16** | **නඩත්තු වියදම්** | | | |
| | ගොඩනැගිලි නඩත්තු කිරීම් | | 9,360,329 | 8,702,105 |
| | පිරියත හා යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම් | | 4,256,893 | 1,698,886 |
| | වාහන නඩත්තු කිරීම් | | 5,798,351 | 3,643,598 |
| | | | **19,415,573** | **14,044,589** |
| **සටහන් -17** | | | | |
| | ප්‍රවාහන | | 8,522,135 | 12,938,086 |
| | ගමන් වියදම් - දේශීය | | 2,494,054 | 1,345,086 |
| | ගමන් වියදම් - විදේශ | | 2,184,041 | 3,269,564 |
| | කල්බදු වාරික | | 13,199,228 | - |
| | | | **26,399,458** | **17,552,737** |
| **සටහන් -18** | **වෙනත් පරිපාලන වියදම්** | | | |
| | නීති ගාස්තු | | 154,260 | - |
| | වෙනත් | | 646,968 | 2,114,094 |
| | බැහැර කිරීම් පාඩු | NOTE-18-1 | (23,370) | 3,225,966 |
| | දඩ මුදල් | | - | - |
| | සේවක සුභසාධක වියදම් | | - | - |
| | සභා රැස්වීම් දීමනා | | 545,410 | 490,395 |
| | සංග්‍රහ වියදම් | | 1,203,607 | 1,427,026 |
| | ලියා හල පිරිවැය | | 167,845 | - |
| | | | **2,694,720** | **7,257,481** |

(මුලා ඒකකය රුපියල්)

**සටහන් -19 ක්ෂය**

| | 2018 | 2017 සංශෝධිත |
|---|---|---|
| ඉඩම්, ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | 19,870,105 | 13,428,189 |
| මෝටර් වාහන | 15,427,293 | 15,235,469 |
| ලීබඩු හා සවිකිරීම් | 23,993,374 | 23,046,014 |
| සංගීත හා ක්‍රීඩා උපකරණ | 2,208,359 | 2,208,359 |
| කායර්ාල උපකරණ | 3,896,131 | 3,486,366 |
| විදුලි උපකරණ | 2,729,102 | 3,135,610 |
| පරිගණක හා උපාංග | 43,751,483 | 43,707,997 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 9,536,613 | 9,248,780 |
| ඉගෙනුම් උපකරණ | 7,999,430 | 7,631,177 |
| | 129,411,891 | 121,127,960 |

**සටහන් -20 කායර් මණ්ඩල පුහුණු කිරීම්**

| | | |
|---|---|---|
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 2,504,568 | 7,559,043 |
| ධාරිතා වර්ධන පුහුණු කිරීම් | 3,074,996 | - |
| | 5,579,564 | 7,559,043 |

**සටහන් -21 පුහුණුලාභී දීමනා**

| | | |
|---|---|---|
| පුහුණුලාභී දීමනා | 39,987,055 | 105,231,849 |
| පුහුණුලාභී ආහාර දීමනා | 82,816,087 | 192,844,099 |
| | 122,803,142 | 298,075,948 |

**සටහන් -22 තරුණ සංවර්ධන වැඩසටහන්**

| | | |
|---|---|---|
| වෘත්තීය පුහුණු දීමනා | 8,655,228 | 11,126,600 |
| විසිරයාම් පෙළපාලි | 7,093,407 | 6,532,486 |
| බැහැරගත පුහුණු පාඨමාලා පැවැත්වීම් | 8,776,070 | 10,791,884 |
| | 24,524,705 | 28,450,970 |

**සටහන් -23 තරුණයින් පුහුණු කිරීමේ වැඩසටහන්**

| | | |
|---|---|---|
| ව්‍යාපාර භාහිරකරණ පුහුණුව | - | 1,997,566 |
| ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ඇගයීම් කිරීම් | 1,140,063 | 2,829,467 |
| පෞරුෂාභිමානි වැඩසටහන | - | 270,228 |
| නායකත්ව පුහුණු වැඩසටහන් | 22,500 | 358,390 |
| අධ්‍යාපන චාරිකා | - | 470,301 |
| ක්‍රීඩා උළෙල | 3,652,421 | 1,674,810 |
| දැනුම් මිනුම වැඩසටහන් | 72,565 | 135,308 |
| කලා කඳවුර | - | 108,206 |
| දෙමාපිය දින වැඩසටහන | 2,410,377 | 894,515 |
| හෝටල් පුහුණු පාසල - විශේෂ වැඩසටහන | - | 5,699,869 |
| මධ්‍යස්ථාන කලා උළෙල වැඩසටහන | - | 18,430 |
| විවාද තරග වැඩසටහන | - | 50,779 |
| ලිංගිකව බෝවන රෝග නිවාරණ වැඩසටහන | 11,885 | 8,817 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 91,979 | 47,375 |
| බෝනොවන රෝග නිවාරණ වැඩසටහන | 12,180 | 8,940 |
| යොවුන් ශිල්ප වැඩසටහන | - | 800,050 |
| විවෘත ආර්ථික සංවත්සරය | - | 1,388,239 |
| සුහද හමුව | - | 488,920 |
| ප්‍රවර්ධන කඳවුර | - | 400,025 |
| යොවුන් පුරය වැඩසටහන | - | 201,215 |
| තිරසර යුග | - | 606,452 |
| අවුරුදු උත්සව | - | 1,165,917 |
| ජාත්‍යන්තර තරුණ දින වැඩසටහන | - | 356,404 |
| ආපදා කළමනාකරණ වැඩසටහන | 97,490 | - |
| OFFICIAL UNFORSEEN | 1,955,483 | - |
| රටේ නීතිය පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් | 12,458 | - |
| පුහුණුලාභී සුහද හමු | 94,800 | - |
| ජාතික ප්‍රතිසංධානය | 4,718 | - |
| | 9,578,917 | 19,980,223 |

(මූල්‍ය ඒකකය රුපියල්)

| සටහන් -24 | **පුහුණුලාභීන් බඳවා ගැනීම හා ප්‍රචාරණය** | **2018** | **2017 සංශෝධිත** |
|---|---|---|---|
| | ප්‍රචාරණ | 4,176,261 | 2,918,653 |
| | බඳවා ගැනීම් | 12,463,016 | 8,751,881 |
| | | **16,639,277** | **11,670,535** |

* 2016 වර්ෂයේ සිට පුහුණුලාභීන් බඳවා ගැනීම සඳහා වන ප්‍රචාරණ පිරිවැය බඳවා ගැනීම් පිරිවැය කාණ්ඩය යටතේ ඇතුළත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| **සටහන් -25** | **තොග බැහැර කිරීමේ පිරිවැය** | | |
| | තොග බැහැර කිරීමේ පිරිවැය | - | 1,886,502.88 |
| | | - | 1,886,502.88 |

| | | | |
|---|---|---|---|
| **සටහන් -18-1** | **වත්කම් බැහැරකිරීම් පාඩු/(ලාභ)** | | |
| | වත්කම් බැහැරකිරීම් පිරිවැය | 21,315 | 5,380,158 |
| | | 21,315 | 5,380,158 |
| | බැහැර කල වත්කම් වල ක්ෂය වෙන්කිරීම් | (7,569) | (1,705,153) |
| | වර්ෂය සඳහා වත්කම් විකුණුම් ආදායම | (37,116) | (449,039) |
| | බැහැරකිරීම් අලාභය | **(23,370)** | **3,225,966** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## සැකසීමේ පදනම

■ මූල්‍ය ප්‍රකාශන වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් නිකුත් කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත සකස් කර ඇත.

■ ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනෙන් පසු එළැඹි කරුණු

■ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කළ දිනට පසුව ගිණුම් වල සිදුවන සැලකිය යුතු වෙනස්වීම් පිළිබඳ අවශ්‍ය ගැලපුම් සිදු කරනු ඇත.

## වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

■ ජාතික යොවුන් සේනාංකය 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත යටතේ ක්‍රියාත්මක වන අතර දැනට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතී.

■ ජාතික යොවුන් සේනාංකය 2015 වර්ෂයේ සිට ගිණුම් ප්‍රකාශ සකස් කරනු ලැබේ. ජාතික යොවුන් සේනාංක සභාවේ නිර්දේශ මත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුමත කරන ලද මණ්ඩලයක් මඟින් සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත.

■ ජාතික යොවුන් සේනාංකය භාවිත කරනු ලබන ගොඩනැගිලි අයිතිය ජාතික යොවුන් සේනාංකය සතුව නොමැති බැවින් එම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොමැත. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරනු ලැබූ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් තුළ කරනු ලැබූ ගොඩනැගිලි ඉදිකිරීම් වියදම 5% වාර්ෂික ක්ෂයය අනුපාතය යටතේ ක්ෂය කරන ලදී. ජාතික යොවුන් සේනාංකයේ ත්‍රී රෝද රථ හැර අනෙකුත් සංචිත වාහනද ජාතික යොවුන් සේනාංක අයිතිය යටතේ නොමැති වුවත් සියළුම වාහන 20% ක්ෂය අනුපාතය යටතේ ක්ෂය කර ඇත.

■ පසුකාලීන පිරිවැය වත්කමෙහි ධාරණ අගයෙහි එකතුවක් ලෙස හෝ වත්කම ලෙස හඳුනාගනු ලබන්නේ එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභය ආයතනය වෙත ලැබෙන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණි. අනෙකුත් සියළු අළුත්වැඩියා සහ නඩත්තු වියදම් එම වියදම් කරනු ලබන වර්ෂයට අදාළව කාර්ය සඳහා වර්ෂයෙහි වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

## ක්ෂය කිරීම්

■ සරල මාර්ග ක්‍රමය යටතේ වත්කමෙහි ජීව කාලය තුළ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත ක්ෂය කිරීම් කරනු ලැබේ. වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කරනු ලබන අතර වත්කම් ඉවත් කරනු ලබන වර්ෂයේදී ක්ෂය කිරීම් නොකරනු ලැබේ.

ක්ෂය කිරීමේ අනුපාත

| | |
|---|---|
| ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | 5% |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 20% |
| මෝටර් වාහන | 20% |
| ලීබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පුහුණු උපකරණ | 20% |
| පරිගණක හා උපාංග | 20% |
| විදුලි උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 12.5% |

## තොග අගය කිරීම්

■ තොග අගය කිරීම් කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය යටතේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වේ.

## වගකීම් සහ වෙන්කිරීම්

■ හඳුනාගත් සියළු වගකීම් ගිණුම්හි ඇතුලත් කර ඇති අතර ඇති විය හැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කර ඇත.

## පාරිතෝෂික වෙන් කිරීම්

■ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කරනු ලැබේ. ජාතික යොවුන් සේනාංකය වෙනුවෙන් වසර 05 හෝ ඊට වැඩි වසර ගණනක් සේවය කළ සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් හිමිකම ලැබේ.

## විලම්බිත ආදායම් (Deferred Income)

■ ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්හි ආයු කාලය තුළ ක්‍රමානුකූල පදනමක් යටතේ කාර්ය සාධන වාර්තාවෙහි විලම්බිත ආදායම් ලෙස දක්වනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SYA/A/NYC/01/18/14 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 අප්‍රේල් 29 දින

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය 06 MAY 2022 සභාපති අංශය

සභාපති,
ජාතික යොවුන් සේනාංකය.

**ජාතික යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්:
1. ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SYA/A/NYC/1/18/14 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 අප්‍රේල් 27 දින

සභාපති,
ජාතික යොවුන් සේනාංකය

**ජාතික යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඊ) ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතු වුවද, රාජ්‍ය ප්‍රදාන ලැබීම් වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රමිත අංක 07 හි 87 (අ) වන ඡේද අනුව අස්ථිත්වයන් සතු වත්කම් වල අයිතිය මත පැනවී ඇති සීමාවන් පිළිබඳව හෙළිදරව් කිරීම් සිදු කළ යුතු වුවත් සේනාංකයේ පැවති රු.331,030,233 ක් අගය වූ ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකම පවරා ගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීමට අදාලව ඉංජිනේරු සේවා සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.100,653,154 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම වගකීම සහ නොනිමි වැඩ අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික යොවුන් සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සේනාංකය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (l) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සේනාංකයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සේනාංකය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 103 හා 104 | සමාලෝචිත වර්ෂය තුළදී වාහන 07 කට අදාලව වාහන අනතුරු 08 ක් සිදුවී තිබුණද වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| - 5.1 ඡේදය | සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| - 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සේනාංකය විසින් නියමිත දිනට වර්ෂ 02 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. |

(ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය

(i) පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කිරීම හා ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(iii)සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(iv)මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සේනාංකයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සේනාංකයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2018 ජනවාරි 01 දිනට පැවති නිල ඇඳුම් තොගයේ වටිනාකම රු.23,357,753 ක් වූ අතර එයින් රු.13,888,735 ක් වටිනා නිළ ඇඳුම් භාවිතයට ගෙන තිබුණි. වර්ෂය තුළ නිම් ඇඳුම් අවශ්‍යතාවය වසර මුල පැවති තොගයෙන් සියයට 59 ක ප්‍රතිශතයක් පමණක් වුවද අවශ්‍යතාවය ඇගයීමකින් තොරව 2018 වර්ෂය තුළ රු.3,078,685 ක් වූ නිල ඇඳුම් නැවත මිලදී ගෙන තිබුණි.

(ආ) නව මධ්‍යස්ථාන 12 ක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය හා හදිසි කටයුත්තක් ලෙස සලකා භාණ්ඩ මිලදී ගෙන තිබුණද එම මධ්‍යස්ථාන ආරම්භ කිරීම සිදු නොවීම හේතුවෙන් මිලදී ගත් භාණ්ඩ ගබඩාකර තැබීම වෙනුවෙන් ගබඩා කුළී, රක්ෂණ ගාස්තු, ආරක්ෂක සේවා ගාස්තු, වැටුප් හා කෘමින් මර්ධනය කිරීමේ ගාස්තු වශයෙන් 2019 මැයි දක්වා රු.5,147,125 ක් නිෂ්කාර්යව වැය කර තිබුණි.

## 2.3 වෙනත් කරුණු

----------------

(අ) 2018 දෙසැම්බර් 31 දිනට සේනාංකය විසින් ප්‍රාදේශීයව පුහුණු මධ්‍යස්ථාන 49 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, එම මධ්‍යස්ථාන පිහිටි ඉඩම් වල ප්‍රමාණය හෙක්ටයාර් 116.8769 විය. රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් ලබා දීම පිළිබඳ සහතික මඟින් මධ්‍යස්ථාන 06 කට අදාලව ඉඩම් හෙක්ටයාර් 10.8859 සේනාංකයට පවරා දී තිබුණු නමුත් ඒවායේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.මධ්‍යස්ථාන 35 කට අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු ඉතා සෙමින් ක්‍රියාත්මක වෙමින් තිබුණි.වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල පිහිටි ගොඩනැගිලිවල මධ්‍යස්ථාන 08 ක් පවත්වාගෙන ගොස් තිබුණි.නමුත් මෙම මධ්‍යස්ථාන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි ගොඩනැගිලි හා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීම් වශයෙන් රු.128,934,770 ක් සහ 2018 දෙසැම්බර් 31 දිනට නොනිමි ප්‍රාග්ධන වැඩ වශයෙන් රු.1,694,222,933 ක් වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුහුණු මධ්‍යස්ථාන 49 ක් සඳහා 2019 කණ්ඩායම සඳහා 3750 ක් සහ දෙවන කණ්ඩායම සඳහා 3750 ක් වශයෙන් කණ්ඩායම් දෙක සඳහා පුහුණුලාභීන් 7500 බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථාන 49 ක් සඳහා කණ්ඩායම් දෙක බැගින් පුහුණුලාභීන් 7,271ක් බඳවා ගෙන තිබුණු අතර එයින් බඳවාගත් පුහුණුලාභීන්ගෙන් 1,883 ක් එනම් සියයට 26 ක් පාඨමාලාව හැර ගොස් තිබුණු අතර පාඨමාලාව සාර්ථකව නිමකල සංඛ්‍යාව 5,388ක් විය. කන්තලේ මධ්‍යස්ථානයේ පළමු කණ්ඩායම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් පුහුණුලාභීන් බඳවාගෙන නොතිබුණි. මධ්‍යස්ථානවල එක් පන්ති කාමරයකට සිසුන් 50 බැගින් පන්ති කාමර 4 ක් සඳහා පුහුණුවීම් පහසුකම් සලසා තිබුණද මධ්‍යස්ථාන 35 ක සිසුන් සංඛ්‍යාව 50 ට අඩු බැවින් එම මධ්‍යස්ථානවල සම්පත් ඌන උපයෝජිතව පැවතුණි. තවද එක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂය ආරම්භ කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල රාජකාරී සඳහා 2017 දෙසැම්බර් 31 දිනට එකක් රු.650,000 බැගින් මිලදී ගත් ත්‍රිරෝද රථ 18 ක් මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් 2019 වර්ෂයේදී ත්‍රී රෝද රථ 3 ක් සේනාංකයේ පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතද ත්‍රී රෝද රථ 2 ක් ප්‍රධාන කාර්යාලය වෙතද භාරදී තිබුණි. 2022 පෙබරවාරි මස ඉතිරි ත්‍රී රෝද රථ 13 ක් පලාත් කාර්යාල 09 ක්, පුහුණුවීම් මධ්‍යස්ථාන 03 ක් සහ ප්‍රධාන කාර්යාලය වෙත ලබාදී තිබුණි.

(ඈ) මීගහකිවුල හා පැල්මඩුල්ල යෝජිත යොවුන් සේනාංක මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස පිළිවෙලින් රු.19,662,001 ක් හා රු 17,018,461 ගෙවීම් සිදුකර තිබුණු නමුත් ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න මත එම ඉදිකිරීම් අවලංගුකර ඇතත් අත්තිකාරම් මුදල් 2021 දෙසැම්බර් 31 දිනටද අයකරගෙන නොතිබුණි.

(ඉ) වැලිමඩ මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු, ඉඩමේ පිහිටීම හා භූ විෂමතා හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම්වල අස්ථාවර අවදානම් තත්ත්වයක් පැන නැගීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇතත් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු.19,259,020ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිගේ නිර්දේශ

ජාතික යොවුන් සේනාංකය
தேசிய இளைஞர் படையணி
NATIONAL YOUTH CORPS
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය இளைஞர் மற்றும் விளையாட்டு அமைச்சு Ministry of Youth and Sports

මගේ අංකය/எனது இல/ My No. : YC/5/10/Audit | දිනය/ திகதி/ Date:2022.01.27

ඔබේ අංකය/உமது இல/ Your No. : SYA/A/NYC/1/18/14

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දුව පාර,
බත්තරමුල්ල.

**<u>ජාතික යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

**1.2 මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ දෝෂ**

i 2018 වර්ෂයේදී ගොඩනැගිලි ඉදිකිරීමට අදාල ඉංජිනේරු සේවා සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රුපියල් 100,653,154/- ක මුදලක් ගෙවිය යුතු වුවත් එය ගිණුම් වාර්තාවෙහි සඳහන් කිරීමට අතපසු වී ඇති බව පිළිගනිමි. 2019 වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී අදාල නිවැරදි ගැලපුම් සිදු කර ඇත.

ii මූල්‍ය ප්‍රකාශනය අනුව ඉදිකිරීම් සහ වැඩි දියුණු කිරීම්වල (Building & Improvement) හි ශුද්ධ අගය රුපියල් 348,002,522/- කි. ඉහත දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන වරින් වර ඉදිරිපත් කිරීමට සිදු වීමත් සමඟ එම මූල්‍ය ප්‍රකාශනය වාර්තා පොත් බඳින (Binding) අවස්ථාවේදී සිදු වී ඇති අතපසු වීමක් මත බව පෙන්වා දෙමි.

iii 2018/12/20 සිට 2019/06/20 දක්වා වූ භාණ්ඩ රක්ෂණය කිරීමේ වටිනාකම වන රු 165,973.26 ක මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා ඇති බව පිළිගන්නා අතර, ඉදිරි වර්ෂ වලදී මෙවැනි ගෙවීම් සිදුවන අවස්ථාවන්හදී සමාලෝචිත වර්ෂයේ කාල පරාසයට අදාලව පමණක් ගෙවීම් කිරීමට සටහන් තබා ගන්නා බව පෙන්වා දෙමි.

iv මෙම කරුණ පිළිගන්නා අතර, එහි සවිස්තර විමසුම මඟින් දක්වා ඇත.

අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07. இல 420, பௌத்தாலோக்க, மாவத்தை, கொழும்பு - 07 No -420, Bauddhaloka mawatha, Colombo- 07
දුරකථන/தொலைபேசி/Telephone - 0112688885/2669237 ෆැක්ස්/பெக்ஸ்/Fax - 0112684784 විද්‍යුත් තැපැල/மின்-அஞ்சல்/Email - info@youthcorps.lk වෙබ් අඩවිය/இணைய தளம்/web - www.youthcorps.lk
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director
අතිරේක අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) / மேலதிக பணிப்பாளர் (நிருவாகமும் நிதியும்) / Additional Director (Administration and finance)
අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) / மேலதிக பணிப்பாளர் (பயிற்சியும் அபிவிருத்தியும்) / Additional Director (Training and Development)

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම්**
**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

01. i ජාතික යොවුන් සේනාංකයේ 2018 වර්ෂයට අයත් මූල්‍ය වාර්තා 2019 වර්ෂයේ පෙබරවාරි මස අවසන් වන විට සකස් කර අවසන් කිරීමෙන් අනතුරුව මූල්‍ය වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීමට ජාතික යොවුන් සේනාංක සභාව වෙත යොමු කරන ලදී.

නමුත් 2018 වර්ෂයේ දෙසැම්බර් මස නව රජයක් බලයට පත්වීමත් වීමෙන් අනතුරුව ඒ වන විට පැවැති යොවුන් සේනාංක සභාව අක්‍රිය විය. එම හේතුවෙන් 2019 වර්ෂයේ මැද භාගය නව නිළධාරීන්ගෙන් සමන්විත ජාතික යොවුන් සේනාංක සභාව රැස්වූ 2019 අගෝස්තු මස 07 වන දින පැවැති සභා රැස්වීම සඳහා මූල්‍ය ප්‍රකාශන වාර්තාව ඉදිරිපත් කරන ලදී. එසේ ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන ඔවුන්ගේ කාලසීමාවට අදාල නොවන බැවින් මූල්‍ය වාර්තාව අනුමත කරන ලද්දේ ‘signed subject to not being responsible for the expenses incurred during this period’ යන වගන්තියට අනුවය.

මෙලෙස ජාතික යොවුන් සේනාංක සභාවේ වගන්තියකට යටත්ව අනුමත කරන ලද මූල්‍ය වාර්තා ප්‍රකාශනය ජාතික විගණන පනතේ ඡේද අංක 12 ට අනුව පිළිගත නොහැකි බව විගණකාධිපති විසින් දැන්වීමෙන් අනතුරුව එය වත්මන් ජාතික යොවුන් සේනාංක සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය හිමි වූයේ 2021/03/10 වන දින පැවැති සභා රැස්වීමේදී වන අතර, එලෙස අනුමත වූ 2018 වර්ෂයේ මූල්‍ය වාර්තා ප්‍රකාශනය 2021/03/30 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කල හැකි විය.

ii ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යටතේ ජාතික යොවුන් සේනාංකය විසින් පරිහරණය කරනු ලබන ගොඩනැගිලි පිහිටි ඉඩම්වල හිමිකම් පවරා ගෙන නොතිබුණ නමුත්, 2011 වර්ෂයේ සිට එම වත්කම් ඉදිකිරීමට භාවිතා කරනු ලබන ප්‍රාග්ධන ප්‍රතිපාදන 5% ක ක්ෂය ප්‍රතිපාදන යටතේ ක්ෂය කරන බවට හෙලි දරව් කර ඇති බව ඇමුණුම 01 මඟින් පෙන්වමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**(අ) ලිඛිත නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| **නීති,රීති, රෙගුලාසි ආදායට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) (i) | යොවුන් සේනාංක පනත ප්‍රකාරව වෘත්තීය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කමිටු පිහිටවිය යුත්තේ, යොවුන් සේනාංකය ස්ථාපිත කිරීමේ 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 1 වන කොටස 2. (1) වගන්තිය ප්‍රකාර පත් කරනු ලබන යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලන කිරීම සඳහාය. එසේ වුවද |

2018 වර්ෂයේදී ක්‍රියාත්මක වූ යොවුන් සේනාංක සභාව 2018 ඔක්තෝම්බර් මාසයේදී එවකට පැවැති රජයේ සිදුවූ වෙනස් වීමත් සමඟ අහෝසි වූ අතර ඒ අනුව සභාවේ පරිපාලනය සඳහා පිහිටුවා තිබූ කමිටුද අහෝසි විය. එමෙන්ම 2018 ඔක්තෝම්බර් මාසයේ පත්වූ නව රජය යටතේ යොවුන් සේනාංකය සඳහා නව යොවුන් සේනාංක සභාවක් පත්කිරීම සිදු නොවුනු බැවින් පරිපාලනය සඳහා වන කමිටුද පත් නොකෙරිණි.

නැවත 2018 දෙසැම්බර් මාසයේදී යලිත් නව රජයක් පත්වීමෙන්ම පසුව අළුතින් යොවුන් සේනාංක සභාව පත්කර 2019 ජුලි මස 18 වන දින සිට ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර එම සභාව ක්‍රියාත්මක වූයේද 2019 නොවැම්බර් මාසය දක්වා පමණි. එම කාලය සඳහාද සභාවේ පරිපාලනය සඳහා වන කමිටු පත්කර ගැනීම සිදු නොවුනි. විශේෂයෙන්ම මෙසේ 2018 ඔක්තෝම්බර් මස සිට වරින් වර රජයන්හි සිදු වූ වෙනස් වීම් හේතුවෙන් යොවුන් සේනාංක සභාව අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම තුළ සභාවේ පරිපාලනය සඳහා වන මෙම කමිටු පත් කිරීමක් සිදු කිරීමටද නොහැකි වී ඇත.

එමෙන්ම 2019 නොවැම්බර් මාසයේදී නව රජයක් පත්වීමෙන් පසු යොවුන් සේනාංක සභාව සඳහා නිලධාරීන් පත්කර ගැනීමට පහත පරිදි උත්සාහයන් දරා ඇත.

2019 ජුලි මස සිට ක්‍රියාත්මක වූ යොවුන් සේනාංක සභාවේ නිලධාරීන් 2019 නොවැම්බර් මාසයේදී නව රජයක් පත්වීමෙන් පසු සිය තනතුරුවලින් ඉල්ලා අස්වන ලද අතර එම ඉල්ලා අස්වීම් පිළිබඳව එවකට යොවුන් සේනාංකය අයත් රේඛීය අමාත්‍යාංශය වූ ක්‍රීඩා හා තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී.

2019 නොවැම්බර් මාසයේදී පත්වූ නව රජය තුළ යොවුන් සේනාංකය ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතට පත්වීමෙන් අනතුරුව යොවුන් සේනාංකයේ සභාපති හා අධ්‍යක්ෂ ලෙස නිලධාරියකු පත් කරන ලද නමුත් යොවුන් සේනාංක සභාව සඳහා නිලධාරීන් පත් කිරීමක් සිදු නොවුනි.

යොවුන් සේනාංක සභාව සඳහා නිලධාරීන් පත් කර ගැනීම පිළිබඳව ගරු අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම් ඇතුළු නිලධාරීන් සමඟ පැවැති රැස්වීම් හා සාකච්ඡා වලදී අවස්ථා කිහිපයකදීම කරුණු ඉදිරිපත් කලද අදාළ පත්කර ගැනීම් සිදු කර ගැනීමට නොහැකි විය.
2020 වර්ෂයේ පත්වූ නව රජය යටතේ ජාතික යොවුන් සේනාංකය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට පත්වීමෙන් අනතුරුව ගරු අමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේදී යොවුන් සේනාංක සභාව පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ ලිඛිත ඉල්ලීමට අනුව 2021 ජනවාරි මස යොවුන් සේනාංක සභාව සඳහා සාමාජිකයින් පත් කරන ලදී. ඊට අනුව 2021 පෙබරවාරි මස 11 වන දින පළමු රැස්වීම පවත්වා ඇත.

(ii) ජාතික යොවුන් සේනාංක පනතට අනුව ආරම්භක අවස්ථාවේ මූලික පුහුණුවෙන් පසු ඔවුන්ට රැකියා ලබා දීමේ සැලසුමක් ද පැවැති අතර, ඒ අනුව 2003 වසරේදී ආරම්භක පාඨමාලාවන් හැදෑරූ සියයකට ආසන්න පිරිසකට පසුගිය කාලසීමාව තුළදී ජාතික යොවුන් සේනාංකයේ රැකියා අවස්ථාවන් ලබා දෙන ලදී. එහෙත් වර්තමානය වන විට මූලික පුහුණුවෙන් පසු ඔවුන් රැකියාවකට යොමු කිරීමට වඩා ප්‍රමුඛත්වය වෘත්තීය පුහුණුවකට යොමු කිරීම කෙරෙහි දක්වන බවද පෙන්වා දෙමි. එමෙන්ම පසුගිය කාලසීමාවන් තුල බඳවා ගන්නා ලද කණ්ඩායම් තුල මෙම වයස් සීමාවේ පුහුණුලාභීන්/ ලාභිනියනගේ සහභාගීත්වය ඉහල ගිය බැවින් ඔවුන්ට විධිමත් වෘත්තීය පුහුණු අවස්ථා ද උදාකර දුන් අතර, මෙම වයස් සීමාවේ පිරිස් කොන්දේසි සහිතව රැකියාගත පුහුණුවට යොමු කිරීම්ද මෙම පසුබිම යටතේ සිදු කර ඇත. එමෙන්ම ජාතික තරුණ ප්‍රතිපත්තිය (2014) ට අනුව වයස අවුරුදු 15 – 29 ත් අතර පිරිස තරුණ ප්‍රජාව ලෙස හඳුනාගෙන ඇති අතර ජාතික යොවුන් සේනාංකය ශ්‍රී ලංකාව තුල තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ ප්‍රමුඛතම ආයතනයක් වන බැවින් ද වයස අවුරුදු 16 ත් 28 ත් අතර තරුණ පිරිස් සඳහා පුහුණු අවස්ථා විවර කිරීමට කටයුතු කර ඇත. එය ඉදිරියේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික යොවුන් සේනාංක අධිකාරී පනතේදී ද මෙම වයස් සීමාව සඳහා අනුමැතිය ඉල්ලුම් කර ඇත.

(ආ) 2016 වසරේ අයවැය යෝජනා තුලින් ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 100 ක් ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව ජාතික යොවුන් සේනාංකයේ පළාත් අධ්‍යක්ෂවරුන් විසින් අදාල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මැදිහත්වීමෙන් සහ අනුමැතියෙන් මෙම ඉඩම් හඳුනාගන්නා ලද අතර, එසේ හඳුනාගත් ඉඩම් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මැදිහත් වීම මත මිනුම් කටයුතු සිදු කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අනුමැතියන් සහ සම්බන්ධතාවයන්ගෙන් යුතුව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී. මේ හා සමගාමීව පවරා ගැනීම් කටයුතුද සිදු කරන ලද අතර, දැනටමත් එම පවරා ගැනීම් අවසන් කරමින් ඇත.

(ඇ) ජාතික යොවුන් සේනාංකය විසින් වෘත්තීය පුහුණු ආයතනයන් වෙත නිකුත් කරන සියලුම ප්‍රේෂණපත් ආදායකයාගේ ගිණුමට පමණි හා ගණුදෙනු කල නොහැකි යනුවෙන් සඳහන් කරන ලද අදාල ආයතනයේ නමට රේඛිත චෙක්පතක් නිකුත් කරනු ලබයි. ඒ අනුව අදාල නමට පමණක් එම ප්‍රේෂණපතෙහි හිමිකාරිත්වය පැවරෙන බවත් කාරුණිකව පෙන්වා දෙමි. ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන හා වෘත්තීය පුහුණු ආයතනයන් සමඟ ගනුදෙනු කිරීමේදී මෙම ක්‍රියාදාමය සිදු කිරීමේ ප්‍රායෝගික අපහසුතාවය පෙන්වා දෙන නමුත් 2022 වර්ෂයේ සිට එලෙස ඉදිරිපත් වන සෑම ගෙවීම් වවුචර්පතක්ම එම අදාල ආයතනය වෙතින් ලබන්නාගේ අත්සන ස්ථානයේ සහතික කරමින් ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු යොදා ඇත.

මු.රෙ. 396 ඔබ විසින් පෙන්වා ඇති 2018 දෙසැම්බර් මස 31 වන දින වන විට නිකුත් කරන ලද බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ට වැඩි ප්‍රේෂණපත් 03

සඳහා එම ගිණුම් වර්ෂය අවසන් වන කාල සීමාව තුල මු.රෙ. 396 අනුව ලිඛිත දැනුම් දීමේ කටයුතු එම ආයතනයන් වෙත සිදු කර නමුත්, ප්‍රායෝගිකව එම ප්‍රේෂණපත් 03 අවලංගු කිරීමට හැකි වූයේ 2019 වර්ෂයේ ජනවාරි මාසයේ පහත දක්වා ඇති දිනයන් තුළ බව සඳහන් කරමි.

| ආයතන නම | | මුදල | රිසිට්පත් අංකය | දිනය |
|---|---|---|---|---|
| 1 | ජගත් කන්ස්ට්‍රක්ෂන් | 18,000/- | 5035 | 2019/01/31 |
| 2 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පෞ. සමාගම | 9,339.72 | 5028 | 2019/01/28 |
| 3 | ලංකා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතනය, බදුල්ල | 10,000/- | 5027 | 2019/01/28 |

මු.රෙ. 751

ඇමරිකන් හඩ ආයතනයෙන් 2017 මැයි මස 22 වන දින පඩුවස්නුවර සහ නාත්තණ්ඩිය යන පුහුණු මධ්‍යස්ථාන වෙත භාණ්ඩ අයිතම 43 කට අදාල පරිත්‍යාංග භාණ්ඩ ඒකක 207 ක ප්‍රමාණයක් ලැබී ඇත. ඒ අනුව පඩුවස්නුවර පුහුණු මධ්‍යස්ථානය වෙත ලද භාණ්ඩ නිශ්චිත වශයෙන්ම එම පුහුණු මධ්‍යස්ථානයේ තබා ගන්නේද යන්න පිළිබඳව අවසන් තීරණයක් ගෙන නොතිබූ බැවින් භාණ්ඩ ලද අවස්ථාවේදී තොග ගත කිරීම් සිදු කර නොමැති බව පෙන්වා දෙමි.
එහෙත් නාත්තණ්ඩිය පුහුණු මධ්‍යස්ථානයේ නඩත්තු කල විශේෂ ලේඛණයක් මඟින් සහ මධ්‍යස්ථානය වෙත භාණ්ඩ ලැබුණු වර්ෂයට පසුව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙහි එම භාණ්ඩ අන්තර්ගත කර ඇත.
නමුත් නාත්තණ්ඩිය පුහුණු මධ්‍යස්ථානය තුල රඳවා ඇති එම පරිත්‍යාග භාණ්ඩ විධිමත් පරිදි තොග ගත කිරීම් සිදු කර ඇත.

මු.රෙ 751 හා මු.රෙ 103

**කෑගල්ල පුහුණු මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පැවැති ඌණතාවයන් අය කර ගැනීම සඳහා නැවත මූලස්ථානය මඟින් මණ්ඩලයක් පත් කර සිදු කරන ලද පරීක්ෂණයේදී තහවුරු වූයේ ඌණතා Dining Stool ප්‍රමාණය 04 ක් බවයි. ඒ අනුව එම ඌණතා 04 ක ප්‍රමාණයට අදාල වටිනාකම එන් එම් ආර් කාවින්ද යන නිළධාරී වෙතින් අය කර ගෙන ඌණතා නිරවුල් කරමින් කෑගල්ල පුහුණු මධ්‍යස්ථානයේ ලෙජරයන් නිවැරදි කිරීම මේ වන විට සිදු ව ඇති බව පෙන්වා දෙමි.**

2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ඌනතාවයක් පෙන්වූ Trouser-New-02 ක ප්‍රමාණය ඒ වන විට රේන්ජර්වරුන් වෙත නිකුත් කර තිබූ හෙයින් මෙය ඌනතාවක් ලෙස සඳහන් කලද නැවත මෙම අයිතම 2ක ප්‍රමාණය රේන්ජර්වරුන් විසින් භාවිතයෙන් අනතුරුව ගබඩාව වෙත ලබාදීමෙන් පසුව ලෙජර් ශේෂය හා තත්‍ය ශේෂය තුලනය කරන ලදී.

කුලියාපිටිය පුහුණු මධ්‍යස්ථානයේ විසිරයැමේ belt 04 ක ඌණතාවයක් පවතින බව 2018 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් සටහන් කරන ලදී. නමුත් මෙම බෙල්ට් 4ක ප්‍රමාණය භාවිතයට නුසුදුසු තත්ත්වයේ මධ්‍යස්ථානයේ පැවති අතර මේවා 2018 වර්ෂයේ භාණ්ඩ විනාශ කිරීම්

යටතේ නිර්දේශ වී තිබූ භාණ්ඩ වේ. එම නිසා 2019 වර්ෂය වන විට මෙම භාණ්ඩ විනාශ කිරීමෙන් අනතුරුව මෙම අයිතමයෙහි කිසිදු ඌනතාවක් නොමැති බව සඳහන් කරමි.

මන්නාරම පුහුණු මධ්‍යස්ථානයේ Television 01 ක ප්‍රමාණය සහ First Aid Box 01 ප්‍රමාණයක ඌණතාවයක් පවතින බව 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් පෙන්නුම් කර හෙයින් ඒ පිළිබඳව මධ්‍යස්ථානය වෙතින් කරුණු විමසීමේදී මධ්‍යස්ථානයේ Television 01 ක ප්‍රමාණය සහ First Aid Box 01 ප්‍රමාණයක ඌණතාවයක් නොමැති බව තහවුරු කර ඇත. ඒ අනුව එය 2019 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් නිවැරදිව කර ඇත .
තව ද මෙහි දක්වා ඇති Multiplug 02 ක ඌණතාවය 2019 භාන්ඩ සමීක්ෂණය වනවිට නිවැරදි කර ඇත.
අඬ්ඩාලච්චේන පුහුණු මධ්‍යස්ථානයේ 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ අනුව Tea Spoon 02 ක හා Curry Spoon 04 ක ප්‍රමාණයක් ඌණතා ලෙස පෙන්වා දී ඇත. නමුත් පසුව මධ්‍යස්ථානයේ සිදුකල පරීක්ෂාවකින් අස්ථානගත වූ ඉහත භාණ්ඩ සොයා ගන්නා ලදී. ඉන් අනතුරුව තත්‍ය ශේෂය හා ලෙජර් ශේෂය තුලනය කරන ලදී.

(ඈ) ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා ගරු ඇමතිතුමා විසින් 2008 ජනවාරි මස 11 දින ඉදිරපත් කරන ලද අංක 8/0173/344/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 පෙබරවාරි 06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම තීරණයට අනුව රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටු කරනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සඳහා කාර්යය සාධන හා අත්තිකාරම් බැඳුම්කර ලබා දීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සිදු කර ඇති බැවින්, ජාතික යොවුන් සේනාංකය විසින් NEMO ආයතනයෙන් බැඳුම්කර ලබා ගැනීම සිදු නොකරන ලදී.

ඉ (i) වගන්තිය 6.5.3 ජාතික යොවුන් සේනාංකය ආරම්භයේ සිට 2015 වර්ෂයේ මාර්තු මස දක්වා යොවුන් සේනාංකය අයත් වූ රේඛීය අමාත්‍යාංශය හරහා උප අග්‍රිම යටතේ මාසික අක් මුදල් ලැබීම් සිදු වූ අතර සියළු වියදම් මාසික වියදම් සාරාංශ මගින් අමාත්‍යාංශ වැය ශීර්ෂයට වාර්තා කිරීම සිදු කරන ලදී. ඒ අනුව 2014 වර්ෂය අවසානය දක්වා ජාතික යොවුන් සේනාංකය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස වාර්ෂික වාර්තා හා වාර්ෂික ගිණුම් සැකසීමක් සිදු නොකරන ලදී.

2015 වර්ෂයේදී ජාතික යොවුන් සේනාංකය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතට පත් වූ පසු ජාතික යොවුන් සේනාංකය පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කර ඇති ආයතනයක් බැවින් ස්වාධීන රාජ්‍ය ආයතනයක් ලෙස සලකා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ආයතන වෙත ලබා දෙන රාජ්‍ය ප්‍රධාන ලෙස ජාතික යොවුන් සේනාංකය වෙත අක් මුදල් නිදහස් කිරීම සිදු කරන ලදී. ඒ අනුව යොවුන් සේනාංකයට 2015 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් හා වාර්ෂික වාර්තා සකස් කිරීමේ අවශ්‍යතාවය ඇති විය. මෙසේ 2015 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම්

සකස් කළ යුතු බවට මහා භාණ්ඩාගාරය විසින් දැනුම් දෙනු ලැබුයේද 2015 වර්ෂය අවසන් වූ පසුවය.

යොවුන් සේනාංකය මාසික වියදම් සාරාංශ සකස් කර අමාත්‍යාංශ වැය ශීර්ෂයට වාර්තා කිරීම මහභාණ්ඩාගාරය විසින් ලබා දී ඇති CIGAS පරිගණක වැඩසටහන මඟින් සිදු කරන ලද අතර එම පරිගණක වැඩසටහන මඟින් වාර්ෂික ගිණුම් සකස් කිරීමේ හැකියාවක් නොවුණි. ඒ අනුව පරිගණක වැඩසටහනක් නොවූයෙන් වාර්ෂික ගිණුම් සකස් කිරීමට අදාළ සියළු කටයුතු අතින් (Manually) කිරීමට සිදු විය. විශේෂයෙන්ම ඉන් පෙර වාර්ෂික ගිණුම් සකස් කිරීමක් කර නොතිබූ බැවින් මෙලෙස ගිණුම් සකස් කිරීමේදී වත්කම් අගය කිරීම් ආදී බොහෝ කටයුතු කිරීමට සිදුවූ අතර ඒ සඳහා සැළකිය යුතු කාලයක් ගතවිය. ඒ අනුව 2015 වර්ෂයට අදාළ වාර්ෂික ගිණුම් වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීමට හැකි වූයේ 2017 වර්ෂයේ මාර්තු මාසයේදීය.

එමෙන්ම වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික වාර්තා සකස් කළ යුතු බවට දැනුවත් වූයේද මෙසේ ගිණුම් වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වූ අතර ඒ අනුව වාර්ෂික වාර්තා සකස් කිරීමද ආරම්භ කරන ලදී. මෙහිදී පැරණි වර්ෂයන් අදාළ තොරතුරු රැස්කර ගැනීමට යම් වෙහෙසක් දැරීමට මෙන්ම ඒ සඳහා සැලකිය යුතු කාලයක්ද ගතවිය. විශේෂයෙන්ම මෙම කාල වකවානුව තුළ යොවුන් සේනාංක අධ්‍යක්ෂ හා අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) තනතුරු වෙනස් වීම් මෙන්ම පුරප්පාඩු වීම හේතුවෙන් මෙම කටයුතු නිසි පරිදි මෙහෙයවීමක්ද සිදුවී නොමැත.

ඒ අනුව වාර්ෂික වාර්තා සකස් කිරීම ආරම්භ කරනු ලැබුයේ 2019 වර්ෂය අවසානයේදී වූ අතර ඒ වන විට වාර්ෂික ගිණුම් සකස් කර අනුමත කර තිබූ 2015, 2016 හා 2017 යන වර්ෂ 03 ට අදාළ වාර්ෂික වාර්තා සකස් කිරීම සිදු කරන ලදී. විශේෂයෙන්ම යොවුන් සේනාංක නිලධාරීන්ට වාර්ෂික වාර්තා සකස් කිරීම පිළිබඳ අත්දැකීමක් හෝ පළපුරුද්දක් නොවූයෙන් මෙම වාර්ෂික වාර්තා සකස් කිරීමට යම් කාලයක් ගත වූ අතර 2020 වර්ෂයේදී ඇති වූ කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තියත් මෙම කටයුතු ප්‍රමාද වීමට යම් තරමකින් හේතු විය.

කෙසේ වුවද 2015,2016 හා 2017 වර්ෂයන් අදාල වාර්ෂික වාර්තා සකස් කර 2021.11.03 දින පාර්ලිමේන්තුවේ සභා ගත කරන ලදී.

2018 හා 2019 වාර්ෂික වාර්තාවන්ද මේ වි විට කෙටුම්පත් කර ඇති අතර එම වර්ෂයන්ට අදාල විගණන වාර්තා එම විගණන වාර්තා සඳහා වන සභාපතිතුමාගේ නිරීක්ෂණ මේ දක්වා අවසන් කර ගැනීමට නොහැකි වී ඇත. විගණන වාර්තා එම විගණන වාර්තා සඳහා වන සභාපතිතුමාගේ නිරීක්ෂණ අවසන් කර ගැනීමෙන් අනතුරුව එම වාර්තාද වාර්ෂික වාර්තාවන්ට ඇතුලත් කර ඉංග්‍රීසි හා දෙමළ භාෂා සඳහා පරිවර්ථන කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමතිය ලබා ගෙන පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

| | |
|---|---|
| (ii) 8.3.9 වගන්තිය | ජනාධිපති ලේකම්ගේ ඉල්ලීම හා ජාතික යොවුන් සේනාංකය අයත් වූ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයේ 04 දෙනෙකු ජනාධිපති ලේකම් කාර්යාල වෙත හා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමතිය පරිදි 01 අයෙකු ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය වෙත ද අනුයුක්ත කරනු ලැබූ අතර මේ වන විට එයින් 04 දෙනෙකුම නැවත යොවුන් සේනාංකය වෙත මුදා හැර ඇත. මෙලෙස උසස් මූලස්ථාන වෙතින් සිදු කරන ලද ඉල්ලීම හා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය අනුව මෙසේ යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වෙනත් ආයතන වෙත මුදා හැරීමට සිදුව ඇති බව පිළිගනිමි. |
| 9.5.1 වගන්තිය | කාර්යමණ්ඩල පුහුණුව සඳහා අයවැයක් සකස් කර ඇති අතර ඒ සඳහා වාර්ෂික සැලැස්ම තුල පුහුණු කරුවන් පුහුණු කිරීම (TOT) යටතේ දක්වා ඇත.<br>එමෙන්ම TOT Schedule - 2019 ලෙස දක්වා ඇති ඇමුණුමෙහි වාර්ෂික සැලැස්ම තුළ දක්වා ඇති සම්පාදනය කළ යුතු අරමුදල් ලෙස දක්වා ඇති මුදල වැය වන ආකාරය සහ එම පුහුණු වැඩසටහන් පවත්වන මාස සහ පුහුණුව ලබා දෙන පුහුණු කරුවන් හා සේවා දායකයන් කවුරුන්ද යන්න සහ ඒ සඳහා කාර්තු තුළ වැය දැරීම් විස්තරාත්මකව සකස් කර ඇත. |
| (ඊ) අංක 05/2008 | ජාතික යොවුන් සේනාංකය මඟින් ඍජුවම මහජනතාවට සේවය සපයන ආයතනයක් ලෙස සඳහන් කල නොහැකි අතර, සමාජ කණ්ඩායමක් වන වයස අවුරුදු 18 - 29 අතර තරුණ තරුණියන් ඉලක්ක කර ගත් විනය, නායකත්වය සහ පෞරුෂවර්ධනය පිළිබඳ පුහුණුව ලබා දෙන ආයතනයකි. විමසුම මඟින් පෙන්වා ඇති පරිදි ජාතික යොවුන් සේනාංකය සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර නොතිබූ බව පිළිගන්නා නමුත්, අප විසින් අපගේ ඉලක්ක කර ගනු ලබන කණ්ඩායම වෙත ජාතික යොවුන් සේනාංකය වෙතින් සිදුවන සේවාවන් පිළිබඳව ප්‍රචාරණ මාධ්‍ය (පෝස්ටර් ,බැනර් ,අත් පත්‍රිකා (ඔස්සේ මෙන්ම අප ආයතනය මගින් එළ කරනු ලබන ප්‍රකාශන තුලින්ද දැනුවත් කිරීම සිදු කර ඇති බව සඳහන් කරමි.<br>එමෙන්ම දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථානයන්හි අප ආයතනයේ දැක්ම ,මෙහෙවර හා අප විසින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳවද ප්‍රදර්ශනය කර තිබේ. එමෙන්ම ඉදිරියේදී අදාල චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමට මෙන්ම එය ක්‍රියාවට නැංවීමට සහ අධීක්ෂණය කිරීමට පියවර ගනු ලබන බවද වැඩි දුරටත් දන්වා සිටිමි.<br><br>2018 පෙබරවාරි24 දිනැති 05/2008 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති 2008 / 05 චක්‍රලේඛය ප්‍රකාරව මේ වන තෙක් ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොමැති බව පිළිගනිමි. නමුත් කඩිනමින් සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම අදාල ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලබන බව ද දන්වා සිටිමි. |

2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති 05/2008 චක්‍රලේඛය ප්‍රකාරව, මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම පිළිබඳ වගකීම දැනට ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) විසින් දරනු ලබන අතර, ඉදිරියේදී එම වගකීම පැවරීම සඳහා අවශ්‍ය නිළධාරියෙකු පත් කිරීමට ද අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) (ආ)
යොවුන් සේනාංකය ආරම්භයේදී ප්‍රාදේශීය ලේකම්වරු (රජය), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය ආදී ආයතන භාරයේ තිබූ හිස් ඉඩම් මෙන්ම ගොඩනැගිලිද සහිත ඉඩම් ලබා ගෙන යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කරන ලද අතර එම ඉඩම් හා ගොඩනැගිලි එම අවස්ථාවේදී විධිමත්ව පවරා ගැනීමක් සිදු කර නොමැත. මේ වන විට මෙම ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

2018.12.31 වන විට යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 06 ක් පිහිටුවා තිබූ ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සම්පූර්ණ කර ගැනීමට හැකි වූ අතර මේ වන විට එම සංඛ්‍යාව 18 දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. එමෙන්ම තවත් මධ්‍යස්ථාන 02 ට අයත්ඉඩම් පවරාදීම පළාත්ඉඩම් කොමසාරිස් විසින් නිර්දේශ කර ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩමක් පවරා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අත්පත් යොජනා අනුව පවරාදීමට අදාළ කටයුතු බොහෝ දුරට අවසන්ව ඇත.

යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් ඍජුවම යොවුන් සේනාංකය වෙත පවරා දීමක් සිදු නොකරන අතර එම ඉඩම් පවරා දෙනු ලබන්නේ යොවුන් සේනාංකය අයත් ෙර්ඛීය අමාත්‍යාංශය වෙත වේ. ඒ අනුව පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉතිරි ඉඩම් පවරා ගැනීමේ කටයුතුද යොවුන් සේනාංකය අයත් ෙර්ඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධතාවයෙන් සිදු කරමින් පවතී. කෙසේ වුවද ඒ ඒ ප්‍රාදේශීය ලේකම්වරුන් හා අදාළ ආයතන ලබා දෙන සහයෝගයත්, යොවුන් සේනාංකය අයත් ෙර්ඛීය අමාත්‍යාංශ වරින් වර වෙනස්වීමත් ආදී කරුණු හේතුවෙන් මෙම පවරා ගැනීම් කටයුතු මන්දගාමී වී ඇත.

(ඇ) (ඇ)
වෙනත් ආයතන වලට අයත් ඉඩම්වල දිවුලපිටිය, හඟුරන්කෙත, සූරියවැව, කින්නියා, කැකිරාව, මුතූර්, දෙහිඅත්තකණ්ඩිය හා අම්පාර යනු පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යයි. එම මධ්‍යස්ථාන පිහිටි ඉඩම් වල නිත්‍යානුකූල අයිතිය ජාතික යොවුන් සේනාංකය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. එම නිසා මධ්‍යස්ථාන වෙනුවෙන් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් සිදු කර ඇත.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2017 ජනවාරි සිට ජුනි දක්වාත් 2017 සැප්තැම්බර් සිට 2018 පෙබරවාරි දක්වාත්, 2017 වර්ෂයට අදාල කණ්ඩායම් 02ක් සඳහා පුහුණු පාඨමාලාව පැවැත් විය. එබැවින් මාස 06ක පාඨමාලා 02ක් 2018 වසර තුළ පැවැත්වීමේ අපහසුතාවයත්, අරලියගහ මන්දිරයේදී පැවති සාකච්ඡා වලදී කෙටි කලකින් පුහුණුලාභීන්/ලාභිනියන් වෘත්තීය පුහුණුවට යොමු කිරීමේ අවශ්‍යතාවයක් පිළිබඳව දැනුවත් කිරීමත් සැලකිල්ලට ගෙන එවකට සිටි අධ්‍යක්‍ෂතුමාගේ උපදෙස් මත මාස 03ක පාඨමාලා දෙකක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. (මෙයට සමාන්තරව T V E C ආයතනයේ මාස 03ක NVQ III වෘත්තීය පුහුණු පාඨමාලා අලුතින් හඳුන්වාදීමට සැලසුම් කළ අතර එම සාකච්ඡා වලට සහභාගී වීමෙන් පසු ජුනි, ජූලි, අගෝස්තු, මාස 03න් පසුව ඔවුන් සැප්තැම්බර් මස සිට උක්ත වෘත්තීය පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ කිරීමට සැලසුම් කරන ලදී.)

මෙයට ඉහතද අග්‍රාමාත්‍ය ජ්‍යේෂ්ඨ උපදේශක වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡා තුලදීද ජාතික යොවුන් සේනාංක පාඨමාලා කාලය අඩු කිරීමට යෝජනා විය. එහෙත් අප්‍රේල් මස 05 වැනි දිනෙන් පසුව 2018 පළමු පාඨමාලාව ආරම්භ කරන අවස්ථාව දක්වා ජාතික යොවුන් සේනාංක සභාව නොපැවැත්වූ බැවින් ඒ සඳහා ජාතික යොවුන් සේනාංක සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බව පිළිගනිමි.

පසුව මාස 06 පාඨමාලාවේ තිබූ විෂය අන්තර්ගතය මාස 03ට ගැලපෙන පරිදි වෙනස් කිරීමට අදාළව සභා පත්‍රිකා 03ක් ඉදිරිපත් කළ අතර එහිදී පාඨමාලාව මාස 03 කට වෙනස් කර ඇති බව සභාව දැනුවත් කරන ලදී.

එමෙන්ම මාස 03 පාඨමාලාව තුළ පැවති NVQ I සහතික පත්‍ර පාඨමාලාව ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සභා පත්‍රිකාව, සෞන්දර්ය හා දෙමළ විෂය ඉවත් කිරීමට අදාළ සභා පත්‍රිකාව, මාස 03 පාඨමාලාව පැවති කාල සීමාව තුළ ක්‍රියාත්මක කරන ලද සරඹ තරඟාවලිය ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සභා පත්‍රිකාවන් ඇත. ඒ අනුව මෙම පත්‍රිකාවන් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන ඇති බව පෙන්වා දෙමි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථාන 49 ක් සඳහා 2019 කණ්ඩායම සඳහා 3750 ක් සහ දෙවන කණ්ඩායම සඳහා 3750 ක් වශයෙන් කණ්ඩායම් දෙක සඳහා පුහුණුලාභීන් 7500 බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව කණ්ඩායම් 02 සඳහා පුහුණුලාභීන් 7271 බඳවා ගෙන ඇත. මේ අනුව අපේක්ෂා කල ප්‍රමාණයෙන් 97% ක් බඳවා ගෙන ඇති බව පෙන්වා දෙමි.
ඒ අනුව 2018 පාඨමාලාව සාර්ථකව නිම කල සංඛ්‍යාව 5388 වශයෙන් පෙන්වා දිය හැක. ඒ අනුව පාඨමාලාවේ සාර්ථකත්වය පෙර වර්ෂයට සාපේක්ෂව 4.3% න් වර්ධනය වී ඇත.

(ඇ) කන්තලේ මධ්‍යස්ථානය සඳහා මතු වූ වනඅලි තර්ජනය සහ ප්‍රමාණවත් ජල පහසුකම් යනාදියි නොමැති වී ම හේතුවෙන්, එම මධ්‍යස්ථායේ පළමු කණ්ඩායම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් පාඨමාලාව ආරම්භ නොකිරීමට පලාත් අධ්‍යක්ෂවරයා සමඟ සිදු කරන ලද සාකච්ඡාවෙන් පසු එවකට සිටි අධ්‍යක්ෂවරයා එම තීරණය ගෙන ඇත.

(ඈ) සාමාන්‍යයෙන් පළමු පාඨමාලාව ජනවාරි මාසයේදී ආරම්භ වන අතර එයට විශාල සිසු සහභාගිත්වයක් දැකිය හැකි බැවින් 50 දෙනෙකුගෙන් සමන්විත පන්තියක් මෙහෙයවීම ප්‍රායෝගිකව අපේක්ෂා කල හැක. එහෙත් දෙවන පාඨමාලාව සඳහා සහභාගිත්වය අඩු වන බැවින් එක් පන්තියක් සඳහා 50 දෙනෙක් අපේක්ෂා කල නොහැකි බව පසුගිය වසර 10 කට වැඩි කාලයක තොරතුරු නිරීක්ෂණය කිරීමේදී පෙනේ. එමෙන්ම 2018 වසරේ පලමු පාඨමාලාව

ආරම්භ වූයේද ජූනි මාසයේදී බැවින් ඉහත ආකාරයේ විශාල සිසු සහභාගිත්වයක් අපේක්ෂා කළ නොහැක. 2018 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා දෙකටම පුහුණුව ලබා දිය හැකි උපරිම ළමුන් සංඛ්‍යාව 7500 කි. ඒ අනුව ළමුන් 7271 බඳවා ගනිමින් අපේක්ෂිත සහභාගිත්වයෙන් 97% ක් සාර්ථකත්වයක් ලබා ගෙන ඇත. සියලුම මධ්‍යස්ථානයන්හි පාඨමාලාව සාර්ථකව නිම කල සංඛ්‍යාව 5833 වන අතර, සමස්ථයක් ලෙස බඳවාගත් ප්‍රමාණයට සාපේක්ෂව 80% ක සාර්ථකත්වයක් ලබා ගෙන ඇති බව පෙන්වා දිය හැක.

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

(අ) චීන භාෂා විද්‍යාගාර 3 ආරම්භ කිරීමට සඳහා උක්ත ශිර්ෂයට අනුකූලව සඳහන් කර ඇති රු.මිලියන ක්13 හා මිලියන 4.6 මුදල අදාල කටයුතු වෙනුවෙන් මේ වන විට පහත පරිදි යොදවා ඇති බව සඳහන් කරමි.

1) ගාල්ල මධ්‍යස්ථානය :- දැනට පන්ති කාමර සැකසීම නිම කර ඇත.

2) වෙන්නප්පුව මධ්‍යස්ථානය:- වැය ඇස්තමේන්තුව ලබාගෙන ඉදිරි කටයුතු සඳහා එම ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දීමට සැලසුම් කර ඇත.

3) යක්කල මධ්‍යස්ථානය :- ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර සනීපාරක්ෂක පහසුකම්ද සැලසීමට අවශ්‍යව ඇත.

4) වෙන්නප්පුව සහ ගාල්ල යන මධ්‍යස්ථාන වල නව විද්‍යාගාර සෑදීමට සැලසුම් කර ඇත.

උක්ත මධ්‍යස්ථාන 03 හි ඉදිකිරීම් කටයුතු සඳහා දල වශයෙන් රු.මිලියන 18 ක පමණ ප්‍රමාණයක් වැයවෙන බව ඇස්තමේන්තු ගත කර ඇති අතර, ගාල්ල මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ ලබා දී ඇති අතර වෙන්නප්පුව මධ්‍යස්ථානය සඳහා වන අවශ්‍යතා ලැයිස්තුවක් ද සකස් කර ඇත.

ඒ අනුව චීන භාෂා විද්‍යාගාරයන්හි ඉදිකිරිම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දැක්විය හැක.

(ආ) ජාතික යොවුන් සේනාංකයේ 2017 වර්ෂයේ යෝජිත නව පුහුණු මධ්‍යස්ථාන අවශ්‍යතා සපයා ගැනීමට අදාළව ශබ්ධ විකාශන කට්ටල 12 සපයා ගැනීමට YC/2/4 අංක හා 2017.10.30 වන දින දරණ රුපියල් 1,801,860.00 (බදු රහිත) ක වටිනාකමින් යුතු ඇණවුම් ලිපියක් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලදී. උක්ත ඇණවුමට අදාළ ශබ්ධ විකාශන කට්ටල 12 ක ප්‍රමාණය 2017.11.30 වන දින ජාතික යොවුන් සේනාංක ප්‍රධාන ගබඩාව වෙත සපයා ඇති අතර, එම සපයන ලද ශබ්ධ විකාශන කට්ටල 12 පරීක්ෂා කර පිරිවිතරවලට අනුකූලද යන්න පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රේෂණපත් අංක 250953 මඟින් රු.2,072,139.00 (බදු සහිත) ක වටිනාකමින් යුතු ගෙවීම් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත නිරවුල් කර ඇත.

## 3.4 වත්කම් ඌන උපයෝජනය

(අ) 2018 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල රාජකාරී කටයුතු සඳහා බෙදා දීමට 2017 දෙසැම්බර් මස 31 දින වන විට ත්‍රීරෝද රථ 18 ක් ගබඩාවේ ගාල් කර තබන ලදී. නමුත් විවෘත කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ නිසා ත්‍රීරෝද රථ 18 ක් ගබඩාවේ ගාල් කර තබන ලදී. එසේ තබන ලද ත්‍රීරෝද රථ 18 න් 13 ක් මේ වන විට පුහුණු මධ්‍යස්ථාන වෙත බෙදා දී ඇති බව පෙන්වා දෙමි. එසේම ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉතිරි ත්‍රීරෝද රථ අතුරින් රථ 03 ක් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත භාර දී ඇත. ඉතිරි ත්‍රීරෝද රථ යොවුන් සේනාංක මූලස්ථාන වාහන සංචිතයේ රාජකාරී සඳහා යොදවා ඇති බවත් පෙන්වා දෙමි.

(ආ) ජාතික යොවුන් සේනාංකය විසින් ආරම්භ කරනු ලැබූ නියමු ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 75 ක් ආරම්භ කරමින් ඊට අනුව 2018 වර්ෂය සඳහා පුහුණු ලාභීන් 30,000 ක ප්‍රමාණයක් බඳවා ගැනීමට සැලසුම් සකස් කරන ලදී. එම බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් එම පිරිස සඳහා තොගයේ තිබූ නිළ ඇඳුම් ප්‍රමාණවත් නොවූ බැවින්, කැන්වස් සපත්තු 2,252 ක් ටී ෂර්ට් 750 සහ බඳ පටි 5,620 ක ප්‍රමාණයන් මිලදී ගැනීමට කටයුතු සිදු කරන ලදී.

එහෙත් ඉහත දක්වා ඇති පරිදි සැලසුම් කරන ලද සමස්ථ පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු අතුරින් බොහොමයක් මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සැලසුම් කරන ලද පුහුණුලාභීන් ප්‍රමාණයම බඳවා ගැනීමට නොහැකිවීම තුල අතිරේක තොග ප්‍රමාණයක් භාණ්ඩ සමීක්ෂණ සිදු වන අවස්ථාව වන විට පැවැති නමුත්, මේ වන විට එම තොගයන් භාවිතයට ගෙන ඇත.

(ඇ) ආරම්භක තොගය සඳහා අන්තර්ගත වූ Journey Mattress , Bed Sheet, Blanket, Hand Glouse, West, Ground Sheet and Overall යන අයිතමයන් 05 හි ආරම්භක තොග වටිනාකම රු 5,671,544/- ලෙස දක්වා ඇත. මෙම තොගයන් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පවතින තොග ලෙස විමසුමෙහි දක්වා ඇති නමුත් එම තොග නේවාසිකව පුහුණුව ලබන පුහුණුලාභීන් සඳහා මෙන්ම පවත්වනු ලබන විවිධ වැඩසටහන් සඳහා කාවකාලිකව නිකුත් කර පුහුණුව සහ එම වැඩසටහන් අවසන් වූ පසු නැවත තොගයට එකතු වන හෙයින් සෑම වර්ෂයකම ආරම්භක තොග වටිනාකම මෙලෙස පෙන්නුම් කරයි.

(ඈ) Passing out Uniform

විසිර යෑමේ පුහුණු නිළ ඇඳුම් පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන විසිර යෑමේ උත්සවයන් සඳහා සෑම වසරකම දෙවතාවක් පමණක් පුහුණුලාභීන් වෙත මෙම විසිර යෑමේ කලිසම්, විසිර යෑමේ කමිස සහ සපත්තු තාවකාලිකව නිකුත් කරනු ලබයි. එලෙස නිකුත් කරනු ලබන විසිර යෑමේ නිළ ඇඳුම් කාර්ය අවසන් වූ පසු නැවත මධ්‍යස්ථානය වෙත ලබා ගැනීමක් සිදු වේ.

එය තොග භාවිතයකින් තොරව තබා ගැනීමක් නොවන බව පෙන්වා දෙන අතර, නැවත නැවත භාවිතය සඳහා තොග තබා ගැනීමකි.
2015 වර්ෂයේදී ජාතික යොවුන් සේනාංක සභාව විසින් ගනු ලැබූ තීරණයකට අනුව විසිර යෑමේ නිළ ඇඳුමෙහි සිදු කරන ලද වෙනස්කම අනුව, නව නිළ ඇඳුම් මිලදී ගැනීමක් සිදුව ඇති හෙයින් මින් පෙර භාවිතා කරනු ලැබූ නිළ ඇඳුම් තොග වටිනාකම මෙලෙස දක්වා ඇත.

Electric Items and Other Equipment Electric items සහ Other Equipment

එක් වරක් පමණක් භාවිත කරමින් ඉවත් නොකරන මෙම අයිතමයන් නැවත නැවත ගැනීමත් නව අවශ්‍යතා සඳහා වෙනත් වර්ගයේ උපකරණයන් මිලදී ගැනීමත් සිදු වන හෙයින් මෙලෙස තොග ශේෂයන් පෙන්නුම් කරයි.

Training Kit

මෙලෙස භාවිතා කරනු ලබන්නේ පුහුණුලාභීන් වෙත නිකුත් කරනු ලබන විෂයානුබද්ධ සටහන් පොත් වර්ගයක් වන අතර, නැවත පුහුණුලාභීන් වෙතින් ඒවා ගබඩාව වෙත ලබා ගන්නා හෙයින් මෙවැනි තොග ශේෂයක් පෙන්නුම් කරයි. මෙයද භාවිතයකින් තොරව තොග තබා ගැනීමක් නොවන අතර, නැවත නැවත භාවිතා කිරීම සඳහා ගබඩාවේ තබා ගැනීමකි.

Other Uniform

Other uniform ලෙස දක්වා ඇත්තේ Leather Boots 01, Sun Viser Cap 50, Tapeta Apron 200, Blazer 01 සහ Cross Belt 195 ක ප්‍රමාණයන් වේ. මෙම තොග ප්‍රමානයන්ද වරින් වර සිදුවන අවශ්‍යතාවයන්ට අනුව තාවකාලිකව නිකුත් කර නැවත නැවත භාවිතය සඳහා ගනු ලබයි. එලෙස ඇති අයිතමයන් තොග වටිනාකම් ලෙස දක්වා ඇත. වෙන්දේසි කිරීමක් හෝ විනාශ කිරීමක් සිදු වුවහොත් පමණක් තොග ශේෂයෙන් අඩු කර දක්වනු ලැබේ.

Sport Item

Sport Item වශයෙන්ද පෙන්වා ඇත්තේ නැවත නැවත භාවිතයට ගනු ලබන ක්‍රීඩා උපකරණ වේ. එලෙස භාවිතයට ගනු ලබන තොග ශේෂයන්ගේ වටිනාකම් විමසුමෙහි පෙන්වා දී ඇති අතර, භාවිතයෙන් ඉවත් කල විට පමණක් එම තොග වටිනාකම් අඩු කර පෙන්වනු ඇත.

## 3.5 ආර්ථික නොවන ගනුදෙනු

2016 හා 2017 වර්ෂයන්හිදී නියමු ව්‍යාපෘතිය යටතේ නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා තවත් පුද්ගලික ආයතනයන් වෙත ඉදි කිරීම් කටයුතු පිරිනමන ලදී. එසේ ඉදි වන නව පුහුණු මධ්‍යස්ථාන 2017 වර්ෂයේ අවසන් භාගයේදී ආරම්භ කිරීමට සැලසුම් කරමින්, එවකට සිටි අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් මත එම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සිදු විය.

නමුත් දිගින් දිගටම ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සතු ඉදි කිරීම් කටයුතු ප්‍රමාද වීම හේතු කොට ගෙන එම වර්ෂයන් තුල මිලදී ගනු ලැබූ භාණ්ඩ ඉදිරියේදී භාවිතයට ගත හැකි වන පරිදි සුරක්ෂිතව පවත්වා ගැනීම අනිවාර්යය විය. ඒ අනුව විමසුමේ සඳහන් පරිදි 2019 වර්ෂයේ මැයි මස දක්වා රුපියල් 5,147,125/- ක වැයක් දැරීමට සිදු වූ බව පිළිගනිමි.

## 3.6 ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් ප්‍රමාදයන්

(අ) <u>මීගහකිවුල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්</u>

මීගහකිවුල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් ඇපකර ලබා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා Adjudicator Service (නිරවුල්කරුවෙකු ) වෙත යොමුකර ඇති බැව් දන්වා සිටිමි. ඒ සැබැදිව අවස්ථා 03 කදි අදාල අත්තිකාරම් මුදල් නිරවුල් කිරිම් සැබැදිව සාකච්ජා පවත්වන ලද අතර, 2022.02.22 දින අවසන් සාකච්ජාව පැවැත්විමට නියමිත අතර, එදිනට ඒ නිගමනයකට එළඹෙනු ඇත. ඒ අනුව අත්තිකාරම් මුදල් අයකර ගැනිම සැබැදිව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

<u>පැල්මඩුල්ල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්</u>

පැල්මඩුල්ල පුහුණු මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත් පිරිනමා තිබූ කොන්ත්‍රාත් ආයතනය දැනට දඹුල්ල (දිගම්පතන) පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන අතර, එම ඉදිකිරීම් කටයුතු 2022 මාර්තු 31 දිනට අවසන් විමට නියමිතව ඇත. එම ඉදිකිරීම්හි අවසන් බිල්පත් ගෙවිමේදි අදාල අත්තිකාරම් මුදල් අයකර ගැනිමට කටයුතු සිදුකර ඇත.ඒ සඳහා අදාල කොන්ත්‍රාත් ආයතනය වෙතින් ලිඛිතව කැමැත්ත පළකර ඇත.

(ආ) <u>හලාවත පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්</u>

හලාවත පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් මුදල් එම ආයතනය වෙත ගෙවා ඇති බිල්පත් වලින් අඩුකර ගෙන ඇති අතර,ඉතිරි මුදල් වෙනුවෙන් බැංකුව වෙත තබා ඇති අත්තිකාරම් සහ කාර්යය සාධන ඇපකරයන්යන් ජාතික යොවුන් සේනාංකය වෙත අයකර ගෙන ඇති බැව් දන්වා සිටිමි. අයකර ගැනිම් සැබැදිව විස්තර පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ගෙවා ඇති අත්තිකාරම් මුදල | - | රු.**16,204,563.90** |
| ගෙවා ඇති බිල්පත් වලින් අයකර ගෙන ඇති අත්තිකාරම් මුදල | - | රු. 848,445.00 |
| ඉදිකිරීම් සඳහා තබා තිබූ අත්තිකාරම් ඇපකරයෙන් අයකර ගෙන ඇති මුදල | - | රු. 12,356,118.90 |
| එකතුව | - | රු. **<u>16,204,563.90</u>** |

<u>කල්පිටිය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම්</u>

කල්පිටිය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් මුදල් එම ආයතනය වෙත ගෙවා ඇති බිල්පත් වලින් අඩුකර ගෙන ඇති අතර,ඉතිරි මුදල් වෙනුවෙන් බැංකුව වෙත තබා ඇති අත්තිකාරම් සහ කාර්යය සාධන ඇපකරයන්යන් ජාතික යොවුන් සේනාංකය වෙත අයකර ගෙන ඇති බැව් දන්වා සිටිමි. අයකර ගැනිම් සැබැදිව විස්තර පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ගෙවා ඇති අත්තිකාරම් මුදල | - | රු.**16,232,556.87** |
| 1 වන බිල්පතෙන් අයකර ගෙන ඇති අත්තිකාරම් මුදල | - | රු. 333,334.00 |

ඉදිකිරීම් සඳහා තබා තිබූ අත්තිකාරම් ඇපකරයෙන අයකර
ගෙන ඇති මුදල - රු. 15,899,222.90

එකතුව - රු. **16,232,556.87**

(ඇ) වැලිමඩ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා ඇති අත්තිකාරම් ඇපකර ලබා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා Adjudicator Service (නිරවුල්කරුවෙකු ) වෙත යොමුකර ඇති බැව් දන්වා සිටිමි. ඒ සැබැදිව අවස්ථා 03 කදි අදාල අත්තිකාරම් මුදල් නිරවුල් කිරිම් සැබැදිව සාකච්ජා පවත්වන ලද අතර, 2022.02.22 දින අවසන් සාකච්ජාව පැවැත්විමට නියමිත අතර, එදිනට ඒ නිගමනයකට එළඹෙනු ඇත. ඒ අනුව අත්තිකාරම් මුදල් අයකර ගැනිම සැබැදිව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

**3.7 කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු**

(අ)

(i) (ii) (iii) ප්‍රකාරව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ අතිරේක ලේකම් (තරුණ කටයුතු) ගේ අංක. MNPEA/YAD/11/01(Vol ii) හා 2016.09.06 දින ලිපියේ උපදෙස් පරිදි ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගොඩනැගිලි ඉදිකිරිම සඳහා මිලියන 25 සීමාවකට යටත්ව ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව කොන්ත්‍රාත් පිරිනමා ඇත.

(iv) 2008 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද අංක 8/0173/344/002 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 පෙබරවාරි 06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබිණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඍජුව ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාලව කාර්යසාධන හා අත්තිකාරම් බැදුම්කර ලබාදීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර තිබුණි.

(v) (vi) ඉහත සඳහන් මණ්ඩල තීරණයට අනුව කටයුතු කර ඇති බව පෙන්වමි.

(vii) අදාල කොන්ත්‍රාත් ගිවිසුමේ දත්ත පත්‍රිකාවේ උප වගන්ති 18.2 අනුව ලබාගත යුතු බව දැක්වෙන රක්ෂණ සහතිකය ලබා දීම පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අංක 06-04-33-2018 හා 2018.12.18 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇත.

(ix) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගෙවන ලද එකතු කල අගය මත බදු මුදල් වෙනුවෙන් ඉදිරිපත් කල ඉන්වොයිස් පත් පිළිබඳ තොරතුරු එම ආයතනය මඟින් ඉල්ලුම් කරන ලද නමුත් මේ වන තෙක් ලැබී නොමැත.

(x) දකුණු පළාතට අදාල ඉදිකිරීම් හි භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර ඇත. NEMO ආයතනය මගින් සිදු කරන ලබන ඉදිකිරීම් සම්බන්ධව ඉදිරි උපදෙස් පතා අමාත්‍යාංශ ලේකම් ඇමතු අතර මේ සබැඳිව නිදේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ නිර්දේශ උපයෝගී කරගනිමින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඉන් පසු NEMO

ආයතනය සැබැඳිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කර ඇති අතර, ඉන් අනතුරුව ලබා ගත් අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව ඉදිරි කටයුතු සිදු කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල තීරණයන් **ඇමුණුම 02 i , 02 ii සහ 02 iii** ලෙස මේ සමඟ ඉදිරිපත් කරමි.

(ආ) (i) ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා ගරු ඇමතිතුමා විසින් 2008 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද අංක 8/0173/344/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 පෙබරවාරි 06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටු කරනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සඳහා කාර්ය සාධන හා අත්තිකාරම් බැදුම්කර ලබා දීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සිදු කර ඇති බැවින් අප ආයතනය මඟින් NEMO ආයතනයෙන් බැදුම්කර ලබා ගැනීම සිදු කර නොමැත.

(ii) ගෝමරන්කලවල පුහුණු මධ්‍යස්ථානයේ අත්තිකාරම් ඇපකරයන් ලබා ගෙන ඇති අතර, මේ වන විට අත්තිකාරම් පියවා ගෙන ඇති හෙයින් අත්තිකාරම් ඇපකරයන් දීර්ඝ කර ගැනීමක් සිදු කර නොමැත.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) (i) දින 2018.06.29 දරණ ලිපිය මඟින්, යොවුන් සේනාංක අධ්‍යක්ෂවරයා විසින් ලේකම් ව්‍යාපෘති කළමණාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් ජාතික අයැවැය දෙපාර්තමේන්තුවේදී 2018.06.01 දින පැවැති සාකච්ඡාවේදී ජාතික යොවුන් සේනාංක පුහුණුලාභීන් සඳහා මාසික දීමනා හා ආහාර දීමනා ලබා දීමට කරන ලද ඉල්ලීමට අනුව සාකච්ඡාව පවත්වන ලද අතර, එහිදී එක් පුහුණුලාභියෙකුට දිනකට රු 325/- බැඟින් මාසයකට රු 6,500/- උපරිමයකට යටත්ව දෛනික දීමනාවක් ලබා දීමට එකඟ වූ බව දන්වා ඇත.

අනුමත ප්‍රතිපාදන තුළ එක් පුහුණුලාභියෙකුට දිනකට රු 200/- උපරිමයකට යටත්ව ආහාර ලබා දීම හා රු 125/- දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලද බවද එහි සඳහන් කර ඇත.

(ii) අතිරේක අධ්‍යක්ෂකගේ ලිපියට අනුව ආහාර සඳහා රු 225/- ක්ද දෛනික දීමනාව සඳහා රු 125 /- ක් වූ විට එය රු 350/- වන නිසා දිනකට අනුමත සීමාව රු 25/-න් ඉක්මවා තිබුණි. 2018/06/20 දින අදාල විෂය භාර අමාත්‍යවරයා විසින් ආහාර වේල් 02 ට අමතරව තේ වේල් 03 ක් ලබා දෙන ලෙස උපදෙස් දී ඇත.

ඒ අනුව 2018/06/20 දින ලිපිය මඟින් යොවුන් සේනාංක අධ්‍යක්ෂවරයා විසින් ලේකම් ව්‍යාපෘති කළමණකරණ තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත අදාල අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. එම ඉල්ලී අනුව අතිරේක ලේකම් (තරුණ කටයුතු) එම ඉල්ලීම නිර්දේශ කර ඇනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත.

2018/10/17 දින යොවුන් සේනාංක සභාව වෙත උක්ත කරුණු ඉදිරිපත් කරනු ලදුව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා තෙක් සභාවේ අනුමැතිය මත රු 25/- ක අමතර මුදලක් ආහාර දීමනා ලෙස ලබා දීමට කටයුතු කර ඇත.

ඉහත දක්වා ඇති පරිදි මෙම දීමනාව ගෙවීම සඳහා මහාභාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කල නමුත් එම ඉල්ලීම ඉටු කර ගත නොහැකි වූ බැවින්, පුහුණුලාභීන් වෙත ගෙවනු ලබන දීමනාවෙන් ඔවුන්ගේ කැමැත්ත මත අදාල මුදල අය කර ගනිමින් සැපයුම්කරු වෙත ගෙවීමට කටයුතු කර ඇති බවත් වැඩි දුරටත් පෙන්වා දෙමි.

## 3.9 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා ජාතික යොවුන් සේනාංකය අයත් වන රේඛීය අමාත්‍යාංශය එකක් වූ බැවින්, එම ආයතනය වෙතින් ඒ ඒ වර්ෂයන් සඳහා අය විය යුතු වටිනාකම් පිළිබඳව එම අංශය මෙන්ම රේඛීය අමාත්‍යාංශයද දැනුවත් කිරීම් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2021 වර්ෂයට අදාලව ජල හා විදුලි පරිභෝජන වියදම් දරා ඇති අතර, මෙම වාර්තාවද ඇතුලත් කර නැවත වරක් පසුගිය වර්ෂයන් සඳහා වූ වටිනාකම් වෙනුවෙන් ගනු ලබන පියවර පිළිබඳ ලිඛිත දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.

(ආ) SYA/A/NYC/2020/TM/AQ-04 අංක දරණ විමසුම මඟින් පෙන්වා ඇති උපචිත වියදම් සියල්ල ලබා දී ඇති පිළිතුරෙහි පෙන්වා දී ඇති පරිදි නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු ගෙන ඇති අතර, ඉදිරියේදී ඉදිරිපත් වන වාර්ෂික ගිණුම් සඳහා මෙය නිවැරදි කල හැකි බවත් පෙන්වා දෙමි.

(ඇ) ත්‍රිකුණාමලය ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නිම කරන තෙක් මධ්‍යස්ථාන කටයුතු සිදු කර ගැනීම ගිවිසුම් ප්‍රකාරව මාසික කුලී පදනම මත ගොඩනැගිල්ලක සිදු කරන ලදී. එහි මාසික කුලිය රු 100,000/- ක් වූ අතර, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමත් සමඟ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම් කාලය දීර්ඝ කරන ලදී.

ඒ අනුව වැඩිපුර මාසයක කාලයක් අදාල ස්ථානයේ රැදී ඇති අතර ඒ සඳහා කුලී අත්තිකාරමින් රු 100,000.00 ක් අඩු කර ගැනීමට කටයුතු සිදු කර ඇත. එසේම අදාල කාල සීමාව තුල දී ජාතික යොවුන් සේනාංකය විසින් ගොඩනැගිල්ල පරිහරණය කාල සීමාව තුළ අදාල කුලී ගොඩනැගිල්ලට සිදුවූ ඇතැම් හානි වෙනුවෙන් ඔවුන් වෙත ලබා දුන් අත්තිකාරම් මුදලින් රු 50,000.00 ක් අය කර ගැනීමක් සිදු ව ඇත.

එසේම ගිවිසුම් ප්‍රකාරව ජාතික ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් ලබා ගෙන ඇති අදාල ගොඩනැගිල්ල සඳහා ලබා දුන් අත්තිකාරම් එම ගොඩනැගිල්ලේ විදුලි සහ ජල බිල්පත් නියමිත කාල පරාසය තුළ නිරාකරණය නොවීම හේතුවෙන් අදාල ආයතනය විසින් එම මුදල් රදවා ගෙන ඇති වුවත්, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත වරින් වර මේ පිළිබඳ දැනුවත් කිරීම් සිදු කර ඇති බවත් පෙන්වමි.

(ඇ) (ඉ) මේ සඳහා සවිස්තර විමසුමත් සමඟ ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කර ඇත.

## 3.10 මානව සම්පත් කළමණාකරණය

(අ) 2018 දෙසැම්බර් 31 දින වන විට යොවුන් සේනාංකය සඳහා 983 ක කාර්ය මන්ඩලයක් අනුමතව තිබුනද එම තනතුර සඳහා බඳවා ගනු ලැබූවන් යොවුන් සේනාංක සේවයෙන් ඉවත්ව වෙනත් රැකියා සඳහා යොමු වීමත්, බඳවා ගන්නා අවස්ථාවලදී සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් අවශ්‍ය ප්‍රමාණ නොමැති වීමත් හේතුවෙන් එම වසර අවසන් වන විට 225 ක පුරප්පාඩු ප්‍රමාණයක් ඇති වී තිබුණි. මෙලෙස ඇති වූ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට 2018.05.18 දින පුවත්පත් දැන්වීම් පළකර අයැදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම සිදු කිරීමට කටයුතු කරමින් තිබියදී යොවුන් සේනාංක අධ්‍යක්ෂ සේවයෙන් ඉවතිව යෑමත්, රජයේ ඇතිවූ වෙනස්වීම් හේතුවෙන් නව අධ්‍යක්ෂවරයෙකු පත් වීමට ප්‍රමාද වීමත් ආදී කරුණු හේතුවෙන් මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කල හැකි වූයේ 2019 වර්ෂය මැද භාගයේදීය.

| | |
|---|---|
| සංවර්ධන සහකාර | 45 |
| උපදේශක (දෙමළ) | 22 |
| මධ්‍යස්ථානාධිපති | 20 |
| සහය මධ්‍යස්ථානාධිපති | 30 |
| සරඹ උපදේශක | 31 |

මෙම තත්වය විශේෂයෙන් හේතු වන්නේ සංවර්ධන සහකාර තනතුර සඳහා බඳවා ගනු ලබන උපාධිධාරීන් වෙනත් රැකියා සඳහා යොමු වීමට යොවුන් සේනාංක සේවයෙන් ඉවත් වීමත්, දෙමළ උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපිරූ අයැදුම්කරුවන් අවශ්‍ය ප්‍රමාණයට ඉදිරිපත් නොවීමත් මෙන්ම ත්‍රිවිධ හමුදාවේ සේවය කර විශ්‍රාම ලැබූවන් බඳවා ගන්නා මධ්‍යස්ථානාධිපති, සහය මධ්‍යස්ථානාධිපති, සරඹ උපදේශක තනතුරු සඳහා සුදුසුකම් සපිරූ අයැදුම්කරුවන් අවශ්‍ය ප්‍රමාණයට ඉදිරිපත් නොවීමත්ය.

2020 වර්ෂයේ නව බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීමක් පළකර මේ වන විට බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව වැඩි දුරටත් දන්වා සිටිමි. 2020 වර්ෂයේ නව බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීමක් පළකර මේ වන විට බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව වැඩි දුරටත් දන්වා සිටිමි.

යොවුන් සේනාංක සභාව හා යොවුන් සේනාංක අධ්‍යක්ෂවරයා විසින් යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය වෙනත් ආයතන වෙත අනුයුක්ත කරන ලද්දේ එම ආයතනයන්හි ප්‍රධානීන් විසින් සේවා අවශ්‍යතාවය සඳහා ජනාධිපති ලේකම්වරයාගේ ඍජු ඉල්ලීම මත අදාල නිළධාරීන් අනුයුක්ත කර දෙන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් කරන ලද ඉල්ලීම් අනුව, අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙන උපදෙස් හා අනුමැතිය පරිදිය. ඒ අනුව 2020 වර්ෂය වන විට යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයේ එක් අයෙකු පමණක් ජනාධිපති කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති බව දැනුම් දෙමි.

(ආ) යොවුන් සේනාංක අනුමත කාර්ය මණ්ඩලය සඳහා ස්ථිර පදනම මත අධ්‍යක්ෂ තනතුරක් අනුමත කර ගෙන තිබුනද යොවුන් සේනාංකය පිහිටුවීමේ 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 7 වන වගන්තිය අනුව **"සේනාංකයේ අධ්‍යක්ෂවරයා ලෙස අමාත්‍යවරයා විසින් සුදුසු හා යෝග්‍ය තැනැත්තෙකු පත් කරනු ලැබිය යුතුය"** ලෙස දක්වා තිබෙන බැවින් යොවුන් සේනාංක අධ්‍යක්ෂවරයා පත් කිරීම ඒ අනුව සිදු වේ. එමෙන්ම යොවුන් සේනාංක ආරම්භයේ සිට යොවුන් සේනාංක අධ්‍යක්ෂ තනතුර සඳහා ත්‍රිවිධ හමුදා සක්‍රිය සේවයේ නියුතු හෝ විශ්‍රාම ලැබූ

නිලධාරියෙකු පත් කිරීමේ අභාෂයක් පැවැති අතර, එය මේ දක්වාම බොහෝ අවස්ථා වල ක්‍රියාත්මකව ඇත.

(ඈ) රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවකයින්ට හිමි වන වරප්‍රසාද හා පහසුකම් යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයට හිමි නොවන බැවින්, එවැනි ආයතනයක තනතුරක් සඳහා පත්වීමට අවස්ථාව ලැබෙන යොවුන් සේනාංක සේවකයින් යොවුන්සේනාංක සේවයෙන් ඉවත් වීමට නිරන්තරයෙන් සිදු වේ. විශේෂයෙන්ම උපාධිධාරීන් සඳහා රජය විසින් පත්වීම් ලබා දෙන අවස්ථාවලදී මෙන්ම ගුරු සේවයට බඳවා ගැනීමේදී මෙම සේවයෙන් ඉවත්වීමේ ප්‍රවණතාවය ඉහළ අගයක් ගන්නා බව පිළිගනිමි.

(ඈ) ජාතික යොවුන් සේනාංක නිළධාරීන්ගේ 2018 වර්ෂය වෙනුවෙන් පාරිතෝෂික දීමනා හිමිකම් ලබන නිළධාරීන් වෙනුවෙන් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 7,985,176/- ක් ලෙස දැක්විය හැක.

නමුත් එම වර්ෂය සඳහා අයවැය මඟින් වෙන් වූ මුදල රුපියල් මිලියන 2,000,000/- ක් වූ අතර, එයින් 2018 වර්ෂයට අදාලව පාරිතෝෂික දීමනාව ලෙස සත්‍ය වශයෙන් ගෙවීම් කර ඇත්තේ රුපියල් මිලියන 1,172,767/- ක් පමණක් බව පෙන්වා දෙමි. ඒ අනුව විමසුම මඟින් පෙන්වා ඇති පරිදි මෙම වර්ෂයේ පාරිතෝෂික සත්‍ය වියදම රුපියල් 7,985,176/- ක් නොවන බව කාරුණිකව පෙන්වා දෙමි.

## 3.11 වාහන පද්ධති කළමණාකරණය

(අ) ජාතික යොවුන් සේනාංක සංචිතයට අයත් ලියාපදිංචි අයිතිය වෙනත් ආයතන වලට අයත් වාහන 07 ලියාපදිංචි අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කර ගැනීම අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) මේ වන විට වාහන අපහරණ කටයුතු සිදු කර ඇත.

(ඇ) විගණිත දිනය දිනය වන විට ධාවනයේ යොදවා නොතිබූ නමුත් මේ වන විට ගාල් කර තිබූ ත්‍රීරෝද රථ මේ වන විට මධ්‍යස්ථාන වලට හා පළාත් කාර්යාල වල රාජකාරී කටයුතු සඳහා ලබා දී ඇත.

(ඈ) වාහන අනතුරු සම්බන්ධයෙන් වූ මු.රෙ. 103 හා 104 ප්‍රකාරව කටයුතු මේ වන විට සිදු වේ.

## 3.12 සංයුක්ත සැලැස්ම

ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 100 ක් දක්වා වැඩි කිරීමේ සැලසුමත් සමඟ ඉදිරි වර්ෂයන් සඳහා වන සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අදාල කටයුතු සකස් කරන ලද නමුත් මේ වන විට ජාතික යොවුන් සේනාංක අධිකාරී පනත සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බැවින් ද, ඒ සඳහා ඉදිරි කටයුතු සිදු වෙමින් ද පවතින අතර, නව අධිකාරී පනතත් සමඟ සංයුක්ත සැලස්මක් සකස් කර ඉදිරිපත් කිරීමට නියමිත බවත් පෙන්වා දෙමි.

## 3.13 අභ්‍යන්තර විගණනය

## 3.14 විගණන කමිටුව

ජාතික යොවුන් සේනාංකයේ විගණන කමිටු රැස්වීම පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික යොවුන් සේනාංක සභාවේ අනුමැතියත්, 2017.04.03 වන දිනැති අමාත්‍යාංශ ලිපියටත් අනුව ආයතනයේ විගණන හා කළමණාකරණ කමිටුවක් පත් කරන ලදී. ඒ යටතේ 2018 වර්ෂයේ I වන කාර්තුවට අදාලව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම 2018.01.25 වන දින පවත්වන ලදී.
නමුත් ඉන් පසු කිහිප අවස්ථාවකදීම අමාත්‍යාංශ වෙනස්වීම, යොවුන් සේනාංක සභාවේ සංයුතිය වෙනස් වීම සහ යොවුන් සේනාංක සභාව රැස් නොවීම යනාදී කරුණු හේතු කොට ගෙන 2018 වර්ෂයේ ඉදිරි කාර්තු 03 ට අදාල විගණන හා කලමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීමට ඉඩ ප්‍රස්ථා නොසැලසුණු බව සඳහන් කරමි.

## 3.15 අනුපාත විශ්ලේෂණය

ජාතික යොවුන් සේනාංකයේ 2018 වර්ෂයට අයත් මූල්‍ය ප්‍රකාශනයේ ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතයන් සම්මත අනුපාතයන්ට වඩා වැඩි අගයක් ගෙන ඇති බව පිළිගනිමි.

එලෙස වීමට මූලික හේතු සාධකය වූයේ ජාතික යොවුන් සේනාංක ඉදිකිරීම් කටයුතු බොහොමයක් පිරිනමා තිබූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) ඉදිකිරීම් කටයුතු දිගින් දිගටම ප්‍රමාද වීමත් සමඟ එම ආයතනය වෙතින් ලබා ගත් අත්තිකාරම් වටිනාකම් හේතුවෙන් මෙම ප්‍රතිශතයන් අනුමත ප්‍රමාණයට වඩා වැඩි වී ඇති බව පෙන්වා දෙමි.

## 3.16 අයවැය ලේඛන පාලනය

මෙලෙස සිදු වීමට පාදක වී ඇත්තේ විගණන විමසුමට බඳුන් කර ගෙන ඇත්තේ 2018 වර්ෂයේ මුල් අයවැය ඇස්තමේන්තුවයි. එහෙත් ඉන් අනතුරුව සංශෝධිත ඇයවැය ඇස්තමේන්තුවක් සැකසී ඇත. එම සංශෝධිත අයැවය ඇස්තමේන්තුවට අනුව සිදු වී ඇති වෙනස පිළිතුරු විමසුමේ ඇමුණුම් මඟින්ද පෙන්වා ඇත.

**කර්නල් දර්ශන රත්නායක ආර්ඩබ්පි ආර්එස්පි**
සභාපති
ජාතික යොවුන් සේනාංකය